## වර්ෂ 1984

මෙඩ්ජුජෝපෙ නම් ස්ථානයේ නව සංවර්ධනයක්
සිදු වූ බව පැවසේ. තමන්ගේ
ආත්මික ජීවිතයේ ඔවුන්ට මගපෙන්විය හැකි වන පිණිස සාන්ත ජේම්ස් පල්ලියේ සියලුම
මීසම් වාසීන් සතියේ එක් සැන්දෑවක පල්ලියේ එක්වන ලෙස අපගේ මාතාව ජෙලෙනා
වාසිල්ජ්ට පවසා ඇත. එම පල්ලියේ පූජකවරුන් 1984 මාර්තු 1 සිට 1987 ජනවාරි 8 දක්වා
තෝරා ගත් අතර අපගේ මාතාවද සෑම බ්‍රහස්පතින්දාවකම මීසමට පණිවුඩ
දු න් බව පැවසේ. එම මීසමට
එම පණිවුඩ දිවැස්වරුන් හයදෙනා තුලින් එනම් සම්පූර්ණයෙන්ම වගේ මරිජා පව්ලොවික්
තුලින් එන බවද පවසා ඇත. අපගේ මාතාව සෑම මසකම 25වන දින පණිවුඩ දෙන බව වර්ෂ
1987 ජනවාරි 8වන දින පවසා ඇත.

## වර්ෂ 1984 මාර්තු 1

"හිතවත් දරුවෙනි! මම මෙම මීසම විශේෂ ආකාරයකට තෝරාගෙන තිබෙන අතර එයට
මගපෙන්වන්නට කැමතියි. මා එය ආදරයෙන් ආරක්ෂා කරන අතර සියල්ලන්ම මාගේ වීම
මට ඔනෑ කර තිබේ. ඔබ ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තුතියි. ඔබ මා සමගත් මගේ පුත්‍රයා
සමගත් සිටීම මගේ ආශාවයි. සෑම බ්‍රහස්පතින්දාවකම මම ඔබට පණිවුඩයක් පවසන්නම්."

## වර්ෂ 1984 මාර්තු 8

"මගේ ඇමතුමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තුතියි. ප්‍රිය දරුවෙනි, මීසමේ සිටින ඔබ මුලින්ම
ආගමට හැරෙන්න. මෙය මගේ පැතුම. මෙලෙස මෙතැනට පැමිණෙන සියල්ලන්ට ආගමට
හැරෙන්නට පුළුවන් වේවි."

## වර්ෂ 1984 මාර්තු 15

"ප්‍රිය දරුවෙනි, අදත් ඔබ මෙතැනට ආවාට මා විශේෂිත ලෙස ඔබට ස්තුති කරනවා.
පූජාසනයේ සක්‍රමේන්තුවට වන්දනා කරන්න. ඇදහිලිවන්තයන් වදින විට මම නිතර එතැන
සිටිනවා. විශේෂ අනුග්‍රහයක් එවිට ලබාගන්න පුළුවන්."

## වර්ෂ 1984 මාර්තු 22

"ප්‍රිය දරුවෙනි, මෙම මීසමේ පව්වලින් මගේ පුත්‍රයා ලැබූ තුවාලවලට පාස්කුකාලයේ ගෞරව
කරන ලෙස මෙම සන්ධ්‍යාවේ විශේෂිත ආකාරයකට මම ඉල්ලා සිටිනවා. ඔහුගේ
දු ක්විදීම ඉසිලිය හැකි වන
පිණිස මීසම උදෙසා යාච්ඤාවෙහි හවුල් වෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන
ස්තුතියි. තවත් වැඩිසංඛ්‍යාවලින් මෙහි එන්නට වෑයමක් දරන්න."

## වර්ෂ 1984 මාර්තු 29

"ප්‍රිය දරුවෙනි, පරික්ෂාවන්ට මුහුණ දෙන ලෙස මා විශේෂිත ආකාරයකට මෙම
සන්ධ්‍යාවෙහි ඔබගෙන් ඉල්ලා සිටිනවා. ඔබගේ පව් නිසා තවමත් සර්වපරාක්‍රමයාණන්
දු ක්විදින ආකාරය අදදින
සලකා බලන්න. එබැවින්
දු ක්විදින විට එය දෙවිට
යාගයක් ලෙස ඔප්පු කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තුතියි."

## වර්ෂ 1984 අප්‍රේල් 5

"ප්‍රිය දරුවෙනි, මෙම සන්ධ්‍යාවෙහි මගේ පුත් යේසුස්ගේ හෘදයට වන්දනා කරන ලෙස මම ඉල්ලා සිටිනවා. මගේ පුත්‍රයාගේ හෘදයට සිදු කළ තුවාල සඳහා වන්දි ගෙවන්න. එම හදවත සියල්ලන් වි සින් දුකට පත්කර ඇත.

## වර්ෂ 1984 අප්‍රේල්

"ප්‍රිය දරුවෙනි, අද්දින ඔබ අවමන් කිරීම නවතා දමා මීසමේ එක්සත්කම වෙනුවෙන් යාච්ඤා කරන ලෙස ඉල්ලමි. ඊට හේතුව මටත් මගේ පුත්‍රයාටත් මෙම මීසම වෙනුවෙන් වි ශේෂ සැලැස්මක් ඇති නිසාය. මගේ ඇමතුමට ප්‍රතිචාරය දැක්වී ම වෙනුවෙන් ස්තූතියි.

## වර්ෂ 1984 අප්‍රේල් 19

(මහ බ්‍රහස්පතින්දා) "ප්‍රිය දරුවෙනි, මට අනුකම්පා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න.

## වර්ෂ 1984 අප්‍රේල් 26

## වර්ෂ 1984 අප්‍රේල් 30

මරිජා අපගේ මාතාවගෙන් මෙසේ අසා ඇත. "හිතවත් මැඩෝනා, බ්‍රහස්පතින්දා දින මීසම සඳහා ඔබ මට පණිවුඩයක්

නුදු න්නේ ඇයි? අපගේ මාතාව මෙසේ පිළිතුරු දී ඇත. සෑම ඇදහිලිවන්තයෙකුගේම ඇදහිල්ල වැඩිකරන්නට මීසම සඳහා මට වි ශේෂ පණිවුඩ තිබුණත්, ඔහු/ඇය අකැමැති යමක් කෙනෙකුට කරන්නට බලකර සිටින්නට මම කැමති නැහැ. එහෙත් මගේ බ්‍රහස්පතින්දා පණිවුඩ පිළිගෙන ඇත්තේ කීපදෙනෙක් පමණයි. මුලදී සිටියේ ඉතා කුඩා සංඛ්‍යාවක්. එහෙත් එය ඔවුන්ට සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇත. එහෙත් මෑතක පටන් ඇතැම් අය පණිඩුව ඉල්ලා සිටින්නේ මට හෝ මගේ පුත්‍රයාට ඇදහිල්ලෙන් හෝ භක්තියෙන් නොව කුතුහලයෙන් පමණකි.

## වර්ෂ 1984 මැයි 10

අපගේ මාතාවගේ අන්තිම පණිවුඩයෙන් බොහෝ දෙනෙක් සලිත වූ බව දක්නට ලැබුණි. අපගේ මාතාව තවදුරටත් මීසමට පණිඩුව නොදෙනු ඇතැයි සමහරෙක් සිතූ බව පැවසෙතත් මෙම සන්ධ්‍යාවෙහි ඇය මෙසේ පවසා ඇත. "මම ඔබට කථා කරන අතර

තවදු රටත් කථා කරන්නට බලාපොරොත්තු වෙමි. ඔබ කල යුත්තේ මගේ උපදෙස්වලට සවන් දීමයි! "

## වර්ෂ 1984 මැයි 17

"ප්‍රිය දරුවෙනි, අද දින බොහෝ දෙනෙක් තමන්ව මට කැප කරන්නට සිටින නිසා මට හරිම සතුටුයි. ඔබට ස්තූතියි. ඔබ වැරද්දක් කර නැහැ. මගේ පුත් යේසුස් මා තුළින් වි ශේෂ අනුග්‍රහයන් ඔබට ලබා දෙන්නට කැමැත්තෙන් සිටිනවා. ඔබගේ කැපවී ම ගැන මගේ පුත්‍රයාට හරිම සතුටුයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.

**වර්ෂ 1984 මැයි 24**

"ප්‍රිය දරුවෙනි! ඔබ සිටින ආකාරයට මම ඔබව වි ශේෂිත ලෙස තෝරාගෙන ඇති බව මා ඔබට කියා ඇත. මව වන මා ඔබට ආදරෙයි. එමෙන්ම ඔබට අපහසුතා ඇති ඔනෑම වෙලාවට භය වෙන්න එපා. ඔබ මගෙන් හා මගේ පුත්‍රයාගෙන්
දු රස්ව සිටින වි ට පවා මා ඔබට ආදරේ කරමි. පාපයෙන් නැති වී සිටින ආත්ම වෙනුවෙන් ලේ
කඳු එ සලන්නට මගේ හදවතට ඉඩ දෙන්න එපා. එබැවි න් හිතවත් දරුවෙනි, යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.

**වර්ෂ 1984 මැයි 31**

(ආරෝහන බ්‍රහස්පතින්දා) වි දේශ රටවල්වලින් වි ශාල පිරිසක් පැමිණ සිටියහ. අපගේ මාතාව මීසම සඳහා පණිවුඩයක් ලබා
දු න්නේ නැත. පැමිණෙන සෙනසුරාදා තමන් පණිවුඩයක් ලබාදෙන බව ඇය මරිජාට පවසා ඇත.

**වර්ෂ 1984 ජූනි 2**

(සෙනසුරාදා) "ප්‍රිය දරුවෙනි! මෙම නුවානය අතර ඔබේ පවුල් මතත් ඔබේ මීසම මතත් ශුද්ධාත්මය වගුරුවන ලෙස යාච්ඤා කරන්නැයි මෙම රාත්‍රියේදී ඉල්ලා සිටින්නට කැමැත්තෙමි. යාච්ඤා කරන්න එවි ට ඔබ පසුතැවි ලි නොවනු ඇත. මෙම පොළොව මත ඔබගේ ජීවි තය අවසානය දක්වා ඔබ ඔහුව මහිමයට පත් කරවන දීමනා ඔබට දෙවි ලබා දෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.

**වර්ෂ 1984 ජූනි 9**

(සෙනසුරාදා) "ප්‍රිය දරුවෙනි! හෙට රාත්‍රියේ සත්‍යයේ ආත්මය වෙනුවෙන් යාච්ඤා කරන්න. වි ශේෂයෙන්ම මීසමේ ඔබ එසේ කරන්න. මා පැවසූ ආකාරයටම පණිවුඩය ඇති ලෙසින්ම කිසිවක් එකතු හෝ අඩු නොකර ඇති සැටියෙන්ම එය පවසනු පිණිස ඔබට සත්‍යයේ ආත්මය අවශ්‍ය වනු ඇත. යාච්ඤාවේ ආත්මය ඔබව පොළඹවනු පිණිස ශුද්ධාත්මය උදෙසා යාච්ඤා කරන්න. ඔබගේ මව වන මා කියන්නේ ඔබ ටිකක් යාච්ඤා කරන බවයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.

**වර්ෂ 1984 ජූනි 14**

**වර්ෂ 1984 ජූනි 21**

යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.

**වර්ෂ 1984 ජූනි 28**

අපගේ මාතාව කිසිම පණිවුඩයක්
දු න්නේ නැත.

**වර් ෂ 1984 ජූලි 12**

"ප්‍රිය දරුවෙනි, මේ දිනවල සාතන් මගේ සැලසුම් සියල්ල නැති කර දමන්නට වෑයම් කරනවා. ඔහුගේ සැලසුම් ඉටු නොවන ලෙසට යාච්ඤා කරන්න. සාතන්ගේ පරීක්ෂා හමුවේ යේසුස්ගේ ජයග්‍රහනය ඔබට අද්දකින්නට හැකිකරවන ලෙස මම මගේ පුත් යේසුස්ට යාච්ඤා කරන්නම්. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.

වර් ෂ 1984 ජූලි 19

"ප්‍රිය දරුවෙනි, මේ දිනවල ඔබ සාතන් වැඩ කරන ආකාරය අද්දැක ඇති. දෙවි අපව බලාගන්නා බැවින්ද මා නිතර ඔබ සමග සිටින බැවි න්ද භය නොවන්න. තවද මම මාව ඔබට භාර කර ඇති අතර කුඩා පරීක්ෂාවන්හිද මම ඔබට අනුකම්පා කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.

වර් ෂ 1984 ජූලි 26

"ප්‍රිය දරුවෙනි, අද දිනත් නිරන්තර යාච්ඤාව හා දුක්ප්‍රප්තිය පිණිස ඔබව කැඳවන්නට කැමැත්තෙමි. වි ශේෂයෙන්ම මෙම මීසමේ බාල අය යාච්ඤාවෙහි නිරත වි ය යුතුයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.

වර් ෂ 1984 ජූලි 26

"ප්‍රිය දරුවෙනි, අද මම ඉතා ෂතුටින් සිටින අතර ඔබගේ යාච්ඤාවට ස්තූති කරන්න කැමතියි. පව්කාරයන්ගේ හැරීම පිණිස මේ දිනවල වැඩියෙන් යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.

වර් ෂ 1984 අගෝස්තු 9

අපගේ මාතාවගෙන් කිසි පණිවුඩයක් ලැබුනේ නැත.

වර් ෂ 1984 අගෝස්තු 11 (සෙනසුරාදා)

"ප්‍රිය දරුවෙනි, සාතන් තමාගේ සැලසුම් තවදු රටත් ක්‍රියාත්මක කරන්නට කැමැත්තෙන් සිටින නිසා යාච්ඤා කරන්න. හෘදයෙන් යාච්ඤා කර යාච්ඤාවෙන් යේසුස්ට ඔබව භාර දෙන්න.

වර් ෂ 1984 අගෝස්තු 14 (අඟහරුවාදා)

මෙම දර් ෂනය බලාපොරොත්තු නොවූවක්. ඉවාන් නිවසේ යාච්ඤා කරමින් සිටි බව පැවසේ. පසුව ඔහු සවස මෙහෙය සඳහා පල්ලියට යන්නට සූදානම් වුනා. එවි ට පුදු මයට මෙන් අපගේ මාතාව ඔහුට පෙනී මෙම පණිවුඩය ජනයාට කියන්නැයි කිව්වාලු: "ජනකාය මාත් එක්ක මේ දවස්වල යාච්ඤා කරනවාට මම කැමතියි. ඒ වගේම හැකිතාක් යාච්ඤා කළ යුතුය. තවද බදාදා සහ සිකුරාදා නිරාහාරව සිට සෑම දිනකට එක් කොන්තයක්වත් කියන්න. ප්‍රීතිමත් දු ක්කදායක සහ මහිමවත් අභිරහස්." මෙම පණිවුඩය අපම ස්ථිර කැමැත්තෙන් පිළිගන්නැයි අපගේ මාතාව අයැද සිටියාය. ඇය වි ශේෂයෙන්ම මෙය මීසමේ සියල්ලන්ගෙන් හා අවට වසන ඇදහිලිවන්තයන්ගෙන් ඉල්ලා ඇත.

වර් ෂ 1984 අගෝස්තු 16

"ප්‍රිය දරුවෙනි, මගේ පණිවුඩය අනුව ජීවත්වෙමින් ඔබට හමුවන හැමෝටම එය පවසන ලෙස මම යටහත්ව ඉල්ලා සිටිනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.

වර් ෂ 1984 අගෝස්තු 23

"ප්‍රිය දරුවෙනි, යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. තමා පූජාව තුළ ජනයාගෙන් විශේෂයෙන් බාලයන්ගෙන් සංවරව සිටින ලෙස ඉල්ලා සිටි බව මාරියා පවසා ඇත.

වර්ෂ 1984 අගෝස්තු 30
"ප්‍රිය දරුවෙනි, ඔබ එය ගොඩනැගූ විට කුරුසිය දෙවිගේ සැලැස්මේ කොටසක් විය. මේ දිනවල කන්ද උඩට ගොස් කුරුසිය ඉදිරියේ යාච්ඤා කරන්න. මට ඔබගේ යාච්ඤා අවශ්‍යයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි.

වර්ෂ 1984 සැප්තැම්බර් 6
"ප්‍රිය දරුවෙනි, යාච්ඤාවෙන් තොරව සාමය නැත. ප්‍රිය දරුවෙනි එබැවින් මා ඔබට කියන්නේ සාමය සඳහා කුරුසිය පාමුල යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි.

වර්ෂ 1984 සැප්තැම්බර් 13
"ප්‍රිය දරුවෙනි, මට තවමත් ඔබගේ යාච්ඤා ඔනෑ කර තිබේ. මේ යාච්ඤා මොකටද කියා ඔබ කල්පනා කරනවාද? ඔබ අවට බැලුවොත් පාපය කොතරම්
දු රට ලෝකය ගිලගෙන තිබේද කියා ඔබටම පෙනේවි . යේසුස් ජය ගන්නා පිණිස යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි.

වර්ෂ 1984 සැප්තැම්බර් 20
"ප්‍රිය දරුවෙනි, අද දින හෘදයෙන්ම නිරාහාරව ඉල්ලා ලෙස මම ඔබෙන් ඉලලමි. අද දින බොහෝ දෙනෙක් නිරාහාරව සිටින්නේ අනික් අය නිරාහාරව සිටින නිසයි. එය කිසිවෙක් නැවැත්වීමට අකැමැති පුරුද්දක් බවට පත්ව ඇත. දෙවි මෙතරම් දීර්ග කාලයක් මට මෙම මීසමේ රැඳී සිටින්නට ඉඩ හැර ඇත්තේ කෘතඥතාවෙන් යුක්තව නිරාහාරව සිටින ලෙස මීසමෙන් ඉල්ලා සිටින්නටයි. ප්‍රිය දරුවෙනි හෘදයෙන්ම නිරාහාරව සිට යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි.

වර්ෂ 1984 සැප්තැම්බර් 27
"ප්‍රිය දරුවෙනි, මගේ සැලසුම් ඉටු කර ගැනීමට යාච්ඤාවෙන් මට උපකාර කර ඇත. මගේ සැලසුම් සම්පූර්ණ වන පිණිස දිගටම යච්ඤා කරන්න. පවුල් තමන්ගේ පවුලේ කොන්තය කියන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි.

වර්ෂ 1984 ඔක්තෝබර් 4
"ප්‍රිය දරුවෙනි, ඔබ නැවත නැවතත් ඔබගේ යාච්ඤාවෙන් මාව ෂතුටු කරන බව අද මම ඔබට කියන්නට කැමති නමුත් යාච්ඤා නොකරන බොහෝ දෙනෙක් මෙම මීසමේ සිටින අතර මගේ හදවත දු කට පත් වෙනවා. එබැවින් ඔබගේ සියලු යාච්ඤා හා යාග ස්වාමීන්ට ඔප්පු කරනු පිණිස දිගටම යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි.

වර්ෂ 1984 ඔක්තෝබර් 8
(සඳු දා) (ජැකොව් අසනීපයෙන් සිටි අතර මෙම පණිවුඩය නිවසේදී ලැබුණාලු) "ප්‍රිය දරුවෙනි, ලෝකය මහත් සේ පාපයට යටත්ව ඇති බැවින් ඔබ නිවසේ සැන්දෑවන්හි කියන සියලුම යාච්ඤා පව්කාරයින්ගේ හැරීම පිණිස විය යුතුය. සෑම සැන්දෑවකම කොන්තය කියන්න.

වර්ෂ 1984 ඔක්තෝබර් 11
"ප්‍රිය දරුවෙනි, ඔබ අහුලන මිදි ඔහු ඔබව පරීක්ෂා කළත් ඔබගේ වෙහෙසකර වැඩ දෙවිට කැප කිරීම ගැන ස්තූතියි. දරුවෙනි. ඔහු ඔබට ආදරේ බවත් ඔහු ඔබව පරීක්ෂා කරන බවත් සහතික වන්න. කනස්සල්ලෙන් නොසිට ඔබ නිතර ඔබගේ සියලු කරදර දෙවිට භාර කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි.

වර්ෂ 1984 ඔක්තෝබර් 18

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට කියා සිටින්නේ සෑම දිනකම ඔබගේ නිවාසවල බයිබලය කියවන ලෙසත් එය කියවී මට පහසුවන ස්ථානයක් හා යාච්ඤා කිරීමට පහසු ස්ථානයක් හැටියට තබා ගන්නා ලෙසත්ය.
මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.

වර්ෂ 1984 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, මෙම මාසය තුළ යාච්ඤා කරන්න. සෑම දිනකම
දු ෂ්ට දේවල්වලට වි රුද්ධව
සිටින්නට ඔබට හැකියාව ලබා දෙන්නට ඔබට උපකාර කරන්නට දෙවි ඉඩ හැර තිබෙනවා. මෙය මාගේ මාසයයි. එය ඔබට දීමට මම කැමතියි. ඔබ යාච්ඤා කලොත් ඔබ ඉල්ලා සිටින අනුග්‍රහය දෙවි ඔබට ලබා දෙයි. මාත් ඔබට උපකාර කරන්නම්. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.

වර්ෂ 1984 නොවැම්බර් 1

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට කියන්නේ ඔබගේ නිවෙස්වල කරන යාච්ඤාව අලුත් කරන ලෙයසි. කෙතෙහි වැඩද දැන් අවසන් වී ඇත. දැන් යාච්ඤාව පිණිස ඔබව වෙන් කර ගන්න. ඔබගේ පවුල්වල යාච්ඤාව පළමු තැන ගත යුතුව ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.

වර්ෂ 1984 නොවැම්බර් 8

"ප්‍රිය දරුවෙනි, මා මගින් දෙවි ඔබට එවන පණිවුඩයට ඔබ අවධානය දෙනවා මදී. ඔහු ඔබට මහත් අනුග්‍රහයක් දක්වමින් සිටියත් ඔබ ඒවාට අනුකූලව කටයුතු කරන්නේ නැහැ. ඥාණාලෝකය ලබා ගැනීමට ශුද්ධාත්මයට යාච්ඤා කරන්න. දෙවි ඔබට දෙන අනුග්‍රහයේ ප්‍රමාණය ඔබ දන්නවා නම් ඔබ අත්නොහැර යාච්ඤා කරනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1984 නොවැම්බර් 15

"ප්‍රිය දරුවෙනි, ඔබ තෝරාගත් ජනකායක් වන අතර දෙවි ඔබට මහත් අනුග්‍රහයන් ලබා දී ඇත. ඔබට මා ලබා දෙන සෑම පණිවුඩයකටම ඔබ අවධානයක් දෙන්නේ නැත. දැන් මට කියන්නට උවමනා වී ඇත්තේ යාච්ඤා කරන්න, යාච්ඤා කරන්න, යාච්ඤා කරන්න, කියා කීමටයි. වෙන මොනවා කියන්නද කියා මා දන්නේ නැහැ. මන්ද මා ඔබට ප්‍රේම කරන අතර මගේත් දෙවිගේත් ප්‍රේමය යාච්ඤාවෙන් ඔබට කියන්නට මට උවමනා වී ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1984 නොවැම්බර් 22

"ප්‍රිය දරුවෙනි, මේ දිනවල සියලුම ප්‍රධාන පණිඩුව අනුව ජීවත් වෙමින් බ්‍රහස්පතින්දා දක්වා ඒවා ඔබගේ හදවත්වල මුල් බැස පිහිටා සිටින්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1984 නොවැම්බර් 29

"ප්‍රිය දරුවෙනි, නැත, ඔබ ප්‍රේම කරන්නට දන්නේ නැති අතර මා ඔබට කියන දේවල් ප්‍රේමයෙන් අසන්නට ඔබ දන්නේ නැත. මගේ ප්‍රේමවන්තයිනි, මා ඔබගේ මව බවත් මා පොළොවට පැමිණ සිටින්නේ ප්‍රේමයෙන් සවන් දීමට ප්‍රේමයෙන් යාච්ඤා කිරීමට හා ඔබ කුරුසියක් දරා ගෙන සිටින බව අමතක නොකරන බව ඔබට ඉගැන්වී මට බව මතක තබා ගන්න. කුරුසිය මාර්ගයෙන් සෑම කෙනෙක් මගින්ම දෙවි මහිමයට පත් වෙනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1984 දෙසැම්බර් 6

"ප්‍රිය දරුවෙනි, මේ දිනවල මා ඔබව කැඳවන්නේ පවුලේ යාච්ඤාවටයි. දෙවිගේ නාමයෙන් මා ඔබට බොහෝ වාර ගණනක් පණිවුඩ ලබා දී ඇතත් ඔබ මට සවන් දී නැත. ඔබ මා ලබා දෙන පණිවුඩයට සවන්
දු න්නොත් පමණයි මෙම
නත්තල ඔබට අමතක නොවන එකක් වෙන්නේ.
ප්‍රිය දරුවෙනි, එම සතුටු දිනය මගේ වඩාත්ම
දු ක්බර දිනය වන්නට ඉඩ
දෙන්න එපා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1984 දෙසැම්බර් 13
"ප්‍රිය දරුවෙනි, සන්තෝසවත් කාලය ළං වෙමින් තිබෙන බව ඔබ දන්නවා. ඒත් ප්‍රේමය නැතිව කිසි දෙයක් අත්කර ගන්න බැහැ. එබැවි න් මුලින්ම ඔබගේම පවුලට, මීසමේ සියල්ලන්ට ප්‍රේම කරන්න. එවි ට මෙතැනට එන සෑම කෙනෙකුටම ප්‍රේම කරන්ට හා පිළිගන්නට ඔබට පුළුවන් වෙයි. මෙම සතියේ දින හත ප්‍රේම කිරීමට ඔබ ඉගෙන ගන්නා සතියක් විය යුතුය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1984 දෙසැම්බර් 20
"ප්‍රිය දරුවෙනි, අද දින යේසුස් ක්‍රිස්තුස් වෙනුවෙන් ස්ථිර යමක් කරන්නට මම ඔබට ඇරයුම් කරනවා. යේසුස්ට කැප වී මක් හැටියට එම ප්‍රීතිමත් දිනයේ මලක් ගෙනෙන ලෙස මම මීසමේ සෑම පවුලකින්ම ඉල්ලා සිටිනවා. යේසුස්ට පැමිණ ඔබගේ කැපවී ම බැලිය හැකි වනු පිණිස සෑම පවුලක්ම ගවමඩුව අසල මලක් තැබීම මා ඉල්ලා සිටිනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1984 දෙසැම්බර් 21 (සිකුරාදා)
"ප්‍රිය දරුවෙනි, ඔබ නත්තලේ යේසුස් සඳහා පිපෙන මලක් වී ම මට අවශ්‍යයි. තවද එය නත්තලෙන් පසුව පර නොවි ය යුතුය. ඔබගේ හදපත් යේසුස් වෙනුවෙන් එඬේරුන් වී ම මට උවමනා වී ඇත. (පණිවුඩය ජෙලේනා වාසිල්ජ්ට දෙනු ලැබූවකි)

මේවා දෙවිගේ සැලසුම් නැති කර දැමීමට වි ශේෂ ක්‍රම වනු ඇත. ප්‍රිය දරුවෙනි, නත්තල් දිනයේ කටයුතුවලින් පවා ඔබ සාතන්ගේ ක්‍රම තේරුම් ගෙන ඇත. එහෙත් දෙවි ඔබගේ හදවත් තුළ ජය ගනිමින් සිටී. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

1985

වර්ෂ 1985 ජනවාරි 3
"ප්‍රිය දරුවෙනි, මේ දිනවල ස්වාමීන් ඔබ මත මහත් අනුග්‍රහයන් වගුරුවා ඇත. මේ සතිය දෙවි ඔබට ලබා දු න්
අනුග්‍රහයන් සඳහා ස්තූති දීමේ සතියක් වේවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1985 ජනවාරි 10
"ප්‍රිය දරුවෙනි, අද දින ඔබගේ සියලුම යාගයන් සඳහා ඔබට ස්තූති කියන්න කැමතියි. තවද මගේ හදවතට කිට්ටු වූ අයට වි ශේෂ ස්තූතියක්. ඔවුන් මෙහි පැමිණ සිටියත් මගේ පණිවුඩවලට සවන් දෙන්නේ නැහැ. එහෙත් ඇතැම් අය වි ශේෂාකාර ලෙස මාගේ හදවතට කිට්ටු වී සිටින අතර මා මෙම පණිවුඩ ලබා දෙන්නේ ඔවුන් උදෙසාය. තවද මා ඔබට දිගටම පණිවුඩ ලබා දෙන අතර ඒවා ඔබගේ හදවතින්ම පතුරුවා හැරීම මා බලාපොරොත්තු වෙනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1985 ජනවාරි 14 (සඳු දා)
"ප්‍රිය දරුවෙනි, සාතන් ඉතා බලවත්ව සිටින අතර මා ඔබ සමග ඇති කරගෙන ඇති සියලු සැලසුම් කඩා දැමීමට ඔහු මුළු බලය යොදමින් සිටිනවා. ඔබ යාච්ඤා කර මිනිත්තුවකටවත්

නවත්වන්න එපා. මා ආරම්භ කර ඇති සියලු සැලසුම් සාර්ථක කර ගැනීමට මම මගේ පුතාට යාච්ඤා කරන්නම්. ඉවසීමෙන් හා දිගටම යාච්ඤා කරන්න. එමෙන්ම සාතන්ට ඔබව අධෛර්ය කරන්න ඉඩ නාරින්න. ඔහු ලෝකයේ ඉතාමත් ක්‍රියාශීලීව සිටිනවා. සොදිසියෙන් සිටින්න.
(අපගේ මාතාව විසින් විකා තුළින් දෙන ලද පණිවුඩයකි.)

වර්ෂ 1985 ජනවාරි 17
"ප්‍රිය දරුවෙනි, මෙම දිනවල සාතන් රහසින් මෙම මීසමට විරුද්ධව ක්‍රියා කරමින් සිටින අතර දරුවන් වන ඔබ යාච්ඤාව නවතා දමා ඇත. පූජාවට යන්නේ කීප දෙනෙක් පමණයි. පරීක්ෂාවේ දවස්වලට එරෙහිව සිටින්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1985 ජනවාරි 24
"ප්‍රිය දරුවෙනි, මෙම දිනවල මීසමේ නවීකරණයන් තුළින් දෙවිගේ මිහිර ඔබ අද්දැක ඇත. ඔබ එක් එක්කෙනාගෙන් ප්‍රීතිය අහිමි කිරීමට තවත් බලවත්ව ක්‍රියා කරන්නට සාතන්ට උවමනා වී ඇත. යාච්ඤාව මගින් ඔබට ඔහුව බල රහිත කර ඔබගේ ප්‍රීතිය යළි සහතික කර ගත හැකිය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1985 ජනවාරි 31
"ප්‍රිය දරුවෙනි, ඉරුගෙන් පුදින මල් මෙන් ඔබගේ හදවත් දෙවිට විවෘත කරන්නට ඔබට කියන්නට මම කැමතියි. මම ඔබගේ මව වන අතර ඔබ පියාට ළංව සිටීම මට උවමනාය. ඔබගේ හදවත්වලට ඔහු බොහෝ දීමනා දෙනු ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1985 පෙබරවාරි 7
"ප්‍රිය දරුවෙනි, මෙම මීසමේ සාතන් සුවිශේෂී ආකාරයකට ක්‍රියා කරමින් සිටිනවා. එබැවින් දෙවිගේ සැලසුම් සාර්ථක වීමටත් සාතන්ගේ සෑම ක්‍රියාවක්ම දෙවිගේ මහිමයට හේතු පාදක වන ලෙසත් යාච්ඤා කරන්න. මා මෙතරම් කාලයක් ඔබ සමග සිටියේ ඔබගේ පරීක්ෂාවන්හි උපකාර කරන්නටයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1985 පෙබරවාරි 14
"ප්‍රිය දරුවෙනි, මා මීසම සඳහා ඔබට පණිවුඩයක් ලබා දෙන දිනය අද වන නමුත් මුළු මීසමම එම පණිවුඩ පිළිනොගන්නා අතර ඒ අනුව ජීවත් වන්නේද නැත. එනිසා මම කණගාටුවෙන් සිටින අතර මට උවමනා වී ඇත්තේ ප්‍රිය දරුවන් වන ඔබවත් ඒ අනුව ජීවත් වීමයි. සෑම පවුලක්ම පවුලේ යාච්ඤාව කළ යුතු අතර බයිබලය කියවිය යුතුයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1985 පෙබරවාරි 21
"ප්‍රිය දරුවෙනි, ඔබට අලුත් වන ලෙසත් යාච්ඤා කරන ලෙසත් දිනපත් මා කියා ඇතත් ඔබ ඒවා පිළිගන්නේ නැත. අද මම ඔබව අමතන්නේ අවසාන වතාවටයි. මේ පාස්කු කාලය වන අතර ඔබ මීසමක් හැටියට ප්‍රේමයෙන් මාගේ පණිවුඩවලට සවන් දිය හැකිය. ඔබ එසේ නොකළොත් මා දිගටම ඔබට පණිවුඩ දෙන්නට කැමති නැහැ. දෙවි මට ඒ සඳහා අවසර දී ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1985 පෙබරවාරි 28
"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට කියන්නේ මෙම සතිය තුළ "මම දෙවිට ප්‍රේම කරනවා" යන වචනයට එකගව ජීවත් හැටියටයි. ප්‍රිය දරුවෙනි ඔබට ප්‍රේමයෙන් නොහැකියයි සිතන දේවල් පවා ලබා ගන්නට පුළුවන. මෙම මීසම සම්පූර්ණයෙන් තමන් සතු වීම දෙවිට උවමනා වී ඇත. එමෙන්ම මටත් උවමනා කර ඇත්තේ එයයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර් ෂ 1985 මාර් තු 7
"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව කැඳවන්නේ ඔබගේ පවුලේ යාච්ඤාව අලුත් කරන්නටයි. ප්‍රිය දරුවෙනි, ඉතා ලාබාල දරුවන්ටත් යාච්ඤා කරන්නටත් දරුවන්ට ශුද්ධ පූජාවට යන්නටත් දිරිගන්වන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 මාර් තු 14
"ප්‍රිය දරුවෙනි, ඔබගේ ජීවි තය තුළ ඔබ එළියත්
අදු රත් අද්දැක ඇත. සෑම කෙනෙකුටම යහපත හා නපුර තේරුම් ගැනීමේ හැකියාව දෙවි ලබා දී ඇත.
අදු රේ සිටින සෑම කෙනෙකු වෙතටම ඔබ එය ගෙන යන පිණිස මම ඔබව එළියට කැඳවමි.
අදු රේ සිටින අය සෑම දිනකට ඔබගේ නිවසට පැමිණෙනවා. ප්‍රිය දරුවෙනි, ඔවුන්ට ආලෝකය ලබා දෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 මාර් තු 21
"ප්‍රිය දරුවෙනි, මම දිගටම පණිවුඩ ලබා දීමට බලාපොරොත්තු වන අතර එනිසා ඒවා පිළිගෙන ඒ අනුව ජීවත් වන ලෙස අද මම ඔබගෙන් ඉල්ලා සිටිනවා. ප්‍රිය දරුවෙනි, මම ඔබට ප්‍රේම කරන අතර සුවි ශේෂී ආකාරයකට සර් වබලධාරී තැනැත්තා මාව එවූ වි ට මම මෙම මීසම තෝරා ගෙන ඇත. එබැවි න් මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ මාව පිළිගන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 මාර් තු 24 (ඉරිදා)
"ප්‍රිය දරුවෙනි, ඔබ දින කීපයකට පෙර පාපෝච්චාරණය කර තිබුණත් අද දින මා ඔබව පාපෝච්චාරණය සඳහා කැඳවමි. මාගේ උත්සව දවස ඔබ සියල්ලන්ම අද්දැකීම මා බලාපොරොත්තු වෙනවා. එහෙත් ඔබ ඔබව දෙවිට අත හැරියේ නැත්නම් එය අද්දකින්නට නොහැක. එබැවි න් දෙවි සමග සමගි වන්නට මා ඔබව කැඳවමි.

වර් ෂ 1985 මාර් තු 28
"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව යාච්ඤා කරන්නට, යාච්ඤා කරන්නට, යාච්ඤා කරන්නට කැඳවන්නට කැමැත්තෙමි. යාච්ඤාව තුළින් ඔබට මහත් සන්තෝෂයක් මෙන්ම ගැලවි ය නොහැකි සෑම තත්ත්වයකින්ම ගැලවී මක් ලැබෙනු ඇත. යාච්ඤාව ආරම්භ කිරීම ගැන ඔබට ස්තූතියි. සෑම කෙනෙක්ම මගේ හදවතට කිට්ටුයි. එමෙන්ම තමන්ගේ පවුලේ යාච්ඤාව ආරම්භ කර ඇති සෑම කෙනෙකුටම ස්තූති කරනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 අප්‍රේල් 4 (මහ බ්‍රහස්පතින්දා)
"ප්‍රිය දරුවෙනි, දෙවිගේ මහිමය ගැන ඔබගේ හෘදයන්හි කල්පනා කරන්නට පටන් ගැනීම ගැන මා ඔබට ස්තූති කරනවා. ඇතැම් පුද්ගලයන් මාව පිළිනොගත් නිසා මා පණිවුඩ දීම නැවැත්වී මට සිටි දිනය අදයි. ලෝකයේ පටන්ගැන්මේ සිට ඉතිහාසයේ නොවූ ලෙසින් මීසම වෙනස් වී ඇති අතර එනිසා මා පණිවුඩ දෙන්නට කැමතියි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 අප්‍රේල් 5 (මහ සිකුරාදා)
"ප්‍රිය දරුවෙනි, ඔබගේ මීසමේ සියල්ලන්ට වි ශාල කුරුසියක් ඇති අතර එය උසුලන්නට භිය වෙන්න එපා. ඔබට උදවි කරන්නාවූ මගේ පුත්‍රයා මෙහි සිටිනවා. (ඉවන්කාට මෙම පණිවුඩය දෙනු ලැබුවා.)

වර්ෂ 1985 අප්‍රේල් 11

"ප්‍රිය දරුවෙනි, අද දින ඥාණාලෝකය සදහා විශේෂිත ආකාරයකට ශුද්ධාත්මය සඳහා යාච්ඤා කරන ලෙස අද දින මීසමේ සියල්ලන්ට කියන්න කැමතියි. ඇදහිලෙන් එය ශක්තිමත් කරන පිණිස අද දින සිට දෙවි විශේෂ ආකාරයකට මීසම පරීක්ෂා කරන්නට යනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1985 අප්‍රේල් 18

"ප්‍රිය දරුවෙනි, ඔබගේ හෘදයේ සෑම විවෘතයක් සඳහාම අද දින මා ඔබට ස්තූති කරනවා. විශේෂයෙන්ම මීසමෙන් දෙවිට විවෘත වෙන සෑම හෘදයක් සඳහාම මට මහත් සතුටක් දැනෙනවා. මා සමග සතුටු වන්න. පව්කාර හදවත් විවෘත වීම සඳහා සියලු යාච්ඤා කරන්න. මා එයට සතුටුයි. දෙවි එය මා තුළින් කැමති වෙනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1985 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, ඔබ කෙතෙහි වැඩ කරන ආකාරයට ඔබගේ හදවත්වල වැඩ කරන්නට පටන් ගන්නැයි අද කියන්නට කැමතියි. දෙවිගෙන් වූ නව ආත්මයක් එහි ස්ථානය ගන්නා පිණිස වැඩ කර ඔබගේ හදවත් වෙනස් කර ගන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1985 මැයි 2

"ප්‍රිය දරුවෙනි, අද දින මා යාච්ඤාවෙන් ඉදිරියට යෑම ගැන යාච්ඤා කරන්නට ඔබව කැඳවන්නට කැමතියි. එබැවින් මා ඔබට මවක් මෙන් අනතුරු අඟවන්නට කැමතියි. නිතර යාච්ඤාව ඔබගේ හදවත්වල තිබෙන්නට යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1985 මැයි 9

"ප්‍රිය දරුවෙනි, නැත, දෙවි ඔබට දෙන අනුග්‍රහයන් ප්‍රමාණය ඔබ දන්නේ නැත. මේ දිනවල ශුද්ධාත්මය විශේෂිත ආකාරයකට ක්‍රියා කරන විට ඔබට වර්ධනය වන්නට උවමනාවක් නැත. ඔබගේ හදවත් පොළොවේ දේවල් කෙරෙහි යොමු වී ඇති අතර ඔබ ඒවායේ නියැලී සිටින්නහුය. ඔබගේ හදවත් යාච්ඤාව වෙතට හරවා ගෙන ශුද්ධාත්මය ඔබ මතට වගුරුවා ගන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1985 මැයි 16

"ප්‍රිය දරුවෙනි, මම ඔබව කැඳවන්නේ යාච්ඤාවේ හා ශුද්ධ පූජාවේ ක්‍රියාකාරීව සිටින්නටයි. ඔබගේ පූජාව දෙවි සමග අද්දැකීමක් වෙනවාට මා කැමතියි. වි සමග අද්දැකීමක් වෙනවාට මා කැමතියි. මේ දිනවල සාතන් ක්‍රියාකාරීව සිටින නිසා දෙවි ඔබව ඔහු වෙතට ඇද ගැනීමට කැමැත්තෙන් සිටින බැවින් ශුද්ධාත්මයට විවෘතව සිටින්න කියා විශේෂයෙන් යෞවනයන්ට කියන්න මා කැමතියි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1985 මැයි 23

"ප්‍රිය දරුවෙනි, මේ දිනවල මා විශේෂාකාරයෙන් ඔබෙන් ඉල්ලා සිටින්නේ ශුද්ධාත්මයට ඔබගේ හෘදයන් විවෘත කරන ලෙයසි. විශේෂාකාරයෙන් මේ දිනවල ශුද්ධාත්මය ඔබ තුළින් ක්‍රියා කරමින් සිටිනවා. යේසුස් ඔබගේ හදවත් තුළින් ක්‍රියා කර ඔබගේ ඇදයහිල්ල ශක්තිමත් කරනු පිණිස ඔබගේ හදවත් විවෘත කර ඔබගේ ජීවිත ඔහුට භාර දෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1985 මැයි 30

"ප්‍රිය දරුවෙනි, මා නැවත ඔබව හෘදයේ යාච්ඤාවට කැඳවමි. හෘදයෙන් යාච්ඤා කරන්නට බැරි වෙන ආකාරයට කෙත්වල වැඩ ඔබව වෙහෙසට පත් කරවන විට විශේෂිත ආකාරයකින් ප්‍රිය දරුවෙනි යාච්ඤාව ඔබගේ දෛනික ආහාරය වේවා. යාච්ඤා කරන්න,

එවි ට ඔබගේ සියලු වෙහෙස නැති වනු ඇත. යාච්ඤාව ඔබගේ ප්‍රීතිය හා වි වේකය වනු ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 ජූනි 6

"ප්‍රිය දරුවෙනි, මේ දිනවල සියලු රටවල්වලින් ජනයා මීසමට පැමිණෙනවා ඇත. දැන් මා ඔබව කැදවන්නේ ප්‍රේම කිරීමටයි: පළමුකොට ඔබගේ පවුලේ සාමාජිකයන්ට ප්‍රේම කරන්න, එවි ට පැමිණෙන සියල්ලන්ව පිළිගෙන ප්‍රේම කරන්නට ඔබට හැකි වෙනු ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 ජූනි 13

"ප්‍රිය දරුවෙනි, සංවත්සර දිනය දක්වා මම ඔබව, මීසමේ සියල්ලන්ව කැදවන්නේ වැඩියෙන් යාච්ඤා කරන්නටත් එය දෙවිට ඔබගේ බැදියාවේ සලකුණක් කර ගන්නටත් කියාය. ප්‍රිය දරුවෙනි ඔබ සියල්ලන් වෙහෙසව සිටින බව මා දන්නා නමුත් ඔබව මා හට කැප කරන ආකාරය ඔබ දන්නේ නැත. මේ දිනවල ඔබව සම්පූර් ණයෙන්ම මා හට කැප කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

ඔබගේ හදවත් සියලු හදවත්වල ස්වාමියාට වි වෘත කරන්න. ඔබගේ සියලු හැගීම් හා ඔබගේ සියලු ගැටළු මට දෙන්න. ඔබගේ සියලු පරීක්ෂාවලදී ඔබට සහනය දෙන්නට කැමැත්තෙමි. ඔබව සාමයෙන්, ප්‍රීතියෙන් හා දේව ප්‍රේමයෙන් පුරවන්නට කැමැත්තෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 ජූනි 25 (අගහරුවාදා)

"සියලු දෙනාට කොන්තය කියන්නැයි කියන්න. සාතන් කතෝලික පල්ලිය මතට ගෙනෙන පීඩා සියල්ල කොන්තයෙන් ඔබට පරාජය කල හැකිය. සියලුම පූජකයන්ද කොන්තය කිව යුතුය. ඔබගේ කාලය කොන්තයට වැය කරන්න. (මෙම පණිවුඩය අපගේ මාතාව පැවසුවේ මාරිජා පැව්ලොවි ක්ගේ පැනයට,එනම් අපගේ මාතාව ඔබ පූජකයන්ට නිර් දේශ කරන්නේ කුමක්ද යන්නට පිළිතුරු වශයෙනි.)

වර් ෂ 1985 ජූනි 28 (සිකුරාදා)

"ප්‍රිය දරුවෙනි, අද දින ඔබව යටහත් පහත් භාවයට කැදවන පණිවුඩයක් දෙන්නට කැමැත්තෙමි. මේ දිනවල මෙහි පැමිණි සියල්ලන් ගැනත් ඔබගේ අද්දැකීම් ප්‍රේමයෙන් පවසන්නට ලැබීම ගැනත් ඔබට මහත් සතුටක් ඇත. දැන් මා ඔබට කියන්නේ යටහත් පහත් වන්නටත් මෙහි එන සියල්ලන්ට ඔබගේ හදවත වි වෘත කරන ලෙසත්ය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 ජූලි 4

"ප්‍රිය දරුවෙනි, ඔබ ඔප්පුකළ සියලු යාගවලට ස්තූතියි. තවද ඔබ ප්‍රේමයෙන් ඒවා ඔප්පු කරන්නැයි ඉල්ලමි. අසරණ අයගෙන් මා ඉල්ලා සිටින්නේ වි ශ්වාසයෙන් උපකාර කරන ලෙසත් එවි ට ස්වමින් වි ශ්වාසයෙන් දෙන බවත්ය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 ජූලි 11

"ප්‍රිය දරුවෙනි, මා මීසමට ප්‍රේම කරන අතර මගේ සළුවෙන් එය සාතන්ගෙන් ආරක්ෂා කරන්නෙමි. සාතන් මීසමෙනුත් මීසමට එන අයගෙනුත් ඈත් වන ලෙස යාච්ඤා කරන්න.

එයාකාරයෙන් ඔබට දෙවිගේ සෑම ඇමතුමක්ම ඇසිය හැකි අතර ඔබගේ ජීවි තයෙන් එයට පිළිතුරු දීමට හැකිය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 ජූලි 18

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ යම් ශුද්ධ වස්තුවක් පැළඳගෙන එවන් යමක් ඔබගේ නිවසේද තබා ගන්නා ලෙසය. සෑම වස්තුවක්ම ශුද්ධව තබා ගන්න එවි ට සාතන් ඔබට අඩුවෙන් පහර දෙනවා ඇත. මන්ද එය ඔබට ආරක්ෂාවක් වන්නේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, මම ඔබට මග පෙන්වන්නට කැමති වුනත් ඔබ මගේ පණිවුඩවලට සවන් දෙන්නට කැමති නැත. අද දින මා ඔබට කියන්නේ මගේ පණිවුඩයට සවන් දෙන්න. එවි ට දෙවි ඔබට කියන්නැයි මට කියන දෙවල් අනුව ජීවත් වෙන්නට පුළුවන් වෙනු ඇත. ඔබව දෙවිට වි වෘත කරන්න. එවි ට දෙවි ඔබ තුළින් ක්‍රියා කරමින් ඔබට අවශ්‍ය සියල්ල දෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 අගෝස්තු 1

"ප්‍රිය දරුවෙනි, මා මිය යන්නට කැමති නැති මලක් තෝරා ගෙන ඇති බව කියන්න කැමතියි. ඔබව නැවුම්ව හා පාපයෙන් තොරව දෙවිට ඔප්පු කරනු පිණිස
ඔබව මට යටත් කරන මෙන් ඉල්ලන්නට කැමැත්තෙමි. සාතන් සැලැස්මේ කොටසක් ලබාගෙන ඇති අතර එය අයිතිව තබා ගන්නට කැමැත්තෙන් සිටියි. ඔහුට එය සාර් ථක නොවී ඔබව දෙවිට ම වි සින් ලබා දිය හැකි වනු පිණිස යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 අගෝස්තු 8

"ප්‍රිය දරුවෙනි, අද දින සාතන්ට වි රුද්ධව යාච්ඤාවෙන් පිබිදෙන ලෙස වි ශේෂකාරව ඉල්ලමි. ඔහු ක්‍රියා කරමින් සිටින බව ඔබ දැන ගන්නට ඔබ වඩාත් ක්‍රියාශීලී වන්නට යනවා. ප්‍රිය දරුවෙනි, සටනට අවි පැලදගෙන කොන්තය අතැතිව ඔහුව පරාජය කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 අගෝස්තු 15

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට ආශීර් වාද කරනවා. මා ඔබට ප්‍රේම කරනවා. ඔබ මාගේ පණිවුඩවලට එකගව ජීවත් වෙන්නැයි කියන්න කැමතියි. සර් වබලධාරීන් මට ලබා දෙන්නාවූ තනි ආශීර් වාදයක් අද දින මා ඔබට ලබා දෙනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 අගෝස්තු 22

"ප්‍රිය දරුවෙනි, ඔබට යාච්ඤාවෙන් ජය ගත හැකි පරීක්ෂා දෙවි ඔබට ලබා දෙන්නට යන බව මා අද ඔබට කියන්නට කැමතියි. දෛනික අමාරුකම්වලින් දෙවි ඔබව පරීක්ෂා කරනවා. සෑම පරීක්ෂාවක්ම සාමකාමීව ජය ගන්නට යාච්ඤා කරන්න. දෙවි පරීක්ෂා කරන සැමෙකකින්ම ඔබ තවත් දෙවිට සමීප වී ඔහුට ප්‍රේම කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1985 අගෝස්තු 29

“ප්‍රිය දරුවෙනි, ඔබව යාච්ඤාවට කැඳවමි. ඔබගේ මිදි වත්තේ පලවලින් සාතන් වි ශේෂයෙන්ම ප්‍රයෝජන ගැනීමට කැමැත්තෙන් සිටිනවා. තමාගේ සැලැස්මෙහි සාතන් සාර් ථක නොවනු පිණිස යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1985 සැප්තැම්බර් 5

“ප්‍රිය දරුවෙනි, සියලු යාච්ඤාවන්ට අද දින මා ස්තූති කරන්න කැමතියි. මෙම ස්ථානයෙන් සාතන් දු රස් වන පිණිස දිගටම යාච්ඤා කරන්න. ප්‍රිය දරුවෙනි, සාතන්ගේ සැලසුම් අසාර් ථක වී ඇත. මෙම මීසමේ දෙවි සැලසුම් කරන දේවල් සාර් ථක වෙන්නට යාච්ඤා කරන්න. වි ශේෂයෙන්ම යෞවනයන් ඔප්පු කර ඇති දේවල්වලට මා ඔවුන්ට ස්තූති කරනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1985 සැප්තැම්බර් 12

“ප්‍රිය දරුවෙනි, කුරුසිය මේ දින මධ්‍ය ගතව තබා ගන්නා ලෙස ඔබගෙන් ඉල්ලන්නට කැමතියි. බොහෝ අනුග්‍රහයන් ලැබෙන කුරුසිය ඉදිරිපිට වි ශේෂයෙන් යාච්ඤා කරන්න. ඔබගේ නිවාසවලද කුරුසියට වි ශේෂිත ස්ථානයක් ලබා දෙන්න. යේසුස් අමනාප නොකරන බවත් කුරුසියට අවමන් නොකරන බවත් පොරොන්දු වෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1985 සැප්තැම්බර් 19,
වර් ෂ 1985 සැප්තැම්බර් 20 (සිකුරාදා)

“ප්‍රිය දරුවෙනි, අද දින ඔබ මෙම පණිවුඩවලට අනුව ජීවත් වී මෙහි හා ඒ බව පැවසීමෙහි දැඩිනොවෙන්න. ඔබගේ හදවත්වල පණිඩුව තබාගෙන ඒ අනුව ජීවත් වෙනවා නම් සැමෝටම එය දැනෙනවා ඇත. එයට කීකරු නොවන්නන්ට ඉන් පලක් නොවනු ඇත. ප්‍රිය දරුවෙනි, ඔබ ඒ අනුව ජීවත් වෙමින් ඔබගේ ජීවි ත වලින් ඒ බව සාක්ෂි දැරිය යුතුය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1985 සැප්තැම්බර් 26,

“ප්‍රිය දරුවෙනි, සියලු යාච්ඤාවන්ට ඔබට ස්තූතියි. සියලුම යාග සඳහාත් ඔබට ස්තූතියි. මා ඔබට දෙන පණිවුඩ අලුත් කරන ලෙස මා ඔබට කියන්නට කැමතියි. වි ශේෂයෙන්ම නිරාහාරව සිටින්න. මන්ද එසේ කිරීමෙන් දෙවි මෙඩ්ජුගෝර් ජෙහි කරන්නට සැලසුම් කරන දෙය ඉටු වන අතර ඔබ මාව වැඩිසතුටට පත්කරනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1985 ඔක්තෝබර් 3,

“ප්‍රිය දරුවෙනි, දෙවි ඔබට ලබා දී ඇති අනුග්‍රහයන් සියල්ලට ස්තූති කරන්නැයි මා ඔබට කියන්න කැමතියි. සියලුම එල සඳහා ස්වාමීන්ට ස්තූති කර ඔහුව මහිමවත් කරන්න. ප්‍රිය දරුවෙනි, කුඩා දේවලදී ස්තූති කරන්නට පුරුදු වන්න, එවි ට ලොකු දේවලටත් ඔබට ස්තූති කරන්නට පුළුවන් වෙනු ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1985 ඔක්තෝබර් 10,

“ප්‍රිය දරුවෙනි, අද දින මා පණිවුඩවලට එකගව මීසමේ ජීවත් වන ලෙස කියන්න කැමතියි. වි ශේෂයෙන්ම මට ඉතා හිතවත් මීසමේ යෞවනයන්ව අමතන්න කැමතියි. ප්‍රිය දරුවෙනි, ඔබ පණිවුඩ අනුව ජීවත් වෙනවා නම් ඔබ ශුද්ධකමේ බීජය අනුව ජීවත් වෙනවා ඇත. මව හැටියට ඔබ අන්‍යයන්වද ශුද්ධවත් කරනු පිණිස ඔබට මුලින්ම ශුද්ධව සිටින්නැයි මා කියන්න කැමතියි. ඔබ අන්‍යයන්ට කණ්නාඩියකි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1985 ඔක්තෝබර් 17,

“ප්‍රිය දරුවෙනි, සෑම දෙයකටම කාලයක් ඇත. අද දින ඔබට ඔබේම හදවතින් වැඩ කරන්නට මා කැඳවන්නට කැමතියි. දැන් කෙතේ සියලු වැඩ නිම වී ඇති බැවි න් ඔබට දැන් සැලකිල්ලක් නොදැක්වූ ක්ෂේත්‍රයන්ද

පිරිසිදු කරන්නට කාලයක් ඇත. එහෙත් ඔබගේ හදවත ඔබ පසෙක තබා ඇත. වෙහෙස වී ඔබගේ හදවතේ සියලු කොටස් ප්‍රේමයෙන් පවි ත්‍ර කර ගන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1985 ඔක්තෝබර් 24,

“ප්‍රිය දරුවෙනි, දිනෙන් දින ඔබගේ ස්වාමියාට ඔබ වඩාත් ලස්සන හා සූදානමින් සිටින පිණිස දිනෙන් දින ඔබව ශුද්ධකමින් යහපත්කමින් හා දෙවිගේ ප්‍රේමයෙන් පලදන්නට මා කැමතියි. ප්‍රිය දරුවෙනි, මගේ පණිවුඩවලට සවන් දී ඒ අනුව ජීවත් වෙන්න. මා ඔබට මගපෙන්න කැමතියි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1985 ඔක්තෝබර් 31,

“ප්‍රිය දරුවෙනි, අද දින පල්ලියේ වැඩ කරන්නට මා ඔබව කැඳවන්නට කැමතියි. මා සියල්ලන්ට එක සමානව ප්‍රේම කරන අතර ඔබ හැකිතාක් වැඩ කරනවා නම් මා කැමතියි. ප්‍රිය දරුවෙනි, ඔබ මේවා පහත් ලෙස සලකන බැවි න් ඔබට පුළුවන් වුනත් ඔබ කරන්නට නොකැමැති බව මා දන්නවා. සියල්ලන්ට ෂතුටු වි ය හැකි ලෙසින් පල්ලියටත් යේසුස්ටත් එසේ කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1985 නොවැම්බර් 7,

“ප්‍රිය දරුවෙනි, අසල්වැසියන්ටත් ඔබට නපුර කරන්නන්ටත් ප්‍රේම කරන්නැයි මා අද ඔබට කියන්න කැමතියි. එලෙසින් ඔබට හදවත්වල අරමුණ තේරුම් ගැනීමට හැකි වෙනවා ඇත. ප්‍රිය දරුවෙනි, ප්‍රේම කර යාච්ඤා කරන්න. අපොහොසත් යයි ඔබ සිතන දේ පවා ප්‍රේමයෙන් ඔබට කළ හැකි වෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1985 නොවැම්බර් 14,

“ප්‍රිය දරුවෙනි, ඔබගේ මව වන මා ඔබට ප්‍රේම කරන අතර යාච්ඤා කරන්නට ඔබට කියන්න කැමතියි. ප්‍රිය දරුවෙනි, මට වෙහෙසක් නොදැනෙන අතර ඔබ මාගේ හදවතෙන් ඈත්ව සිටින වි ටත් මා ඔබට කියන්නේ යාච්ඤා කරන්නයි. මා මවක්. නොමග යන සෑම කෙනෙක් ගැනම මට දු

කක් දැනුනත් මා පහසුවෙන් සමාව දෙන අතර මා වෙතට නැවත හැරෙන සෑම දරුවෙක් ගැනම මා සතුටු වෙනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1985 නොවැම්බර් 21,

“ප්‍රිය දරුවෙනි, මෙම සමය මීසමෙන් වි ශේෂාකාරව ඔබට වෙන් කර ඇති බව මම කියන්නට කැමතියි. වසන්ත සෘතුවේ ඔබට වැඩ වි ශාල ප්‍රමාණයක් තිබුණා. දැන් ඔබට කෙත්වල වැඩ නැති බැවි න් ඔබව සකස් කිරීමට කාලය ගන්න. මෙය ඔබට දෙනු ලැබූ කාලය බැවි න්

පූජාවට එන්න. ප්‍රිය දරුවෙනි අයහපත් කාලගුනයක් තිබුණක් එසේ එන අය හුගක් ඉන්නවා. හේතුව ඔවුන් මට ප්‍රේම කරන අතර ප්‍රේමය වි ශේෂාකාරව පෙන්වන්නට කැමැත්තෙන් සිටිනවා. මට වුවමනා වී ඇත්තේ පූජාවට පැමිණීමෙන් මට ඔබේ ප්‍රේමය පෙන්වන්නටයි. ස්වාමීන් ඔබට බොහෝ සේ ප්‍රතිඵල දෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1985 නොවැම්බර් 28,

"ප්‍රිය දරුවෙනි, ඔබ මට කර ඇති සියල්ල වෙනුවෙන් සියල්ලන්ට වි ශේෂාකාරයෙන් යෞවනයන්ට ස්තූති කරන්නට කැමතියි. දැනුම් තේරුම් ඇතිව යාච්ඤා කරන්නැයි, ප්‍රිය දරුවෙනි, ඔබෙන් ඉල්ලන්න කැමතියි. යාච්ඤාවෙන් ඔබට දෙවිගේ මහත් තත්ත්වය දැන ගත හැකිය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1985 දෙසැම්බර් 5,

"ප්‍රිය දරුවෙනි, යාච්ඤාවෙන් හා ත්‍යාගශීලී කටයුතුවලින් නත්තලට සූදානම් වන ලෙස මා ඔබෙන් ඉල්ලා සිටිනවා. ප්‍රිය දරුවෙනි, ද්‍රව්‍යමය දේවල් ගැන සිත යොමු නොකරන්න. මන්දයත් එවි ට ඔබට නත්තල අද්දකින්නට නුපුළුවන. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1985 දෙසැම්බර් 12,

"ප්‍රිය දරුවෙනි, නත්තලට මාගේ ආරාධනාවඑක්ව යේසුස්ව මහිමවත් කරන්නයි. එදින මා ඔහුව වි ශේෂාකාරයකට ඔබට ඉදිරිපත් කරන අතර මම ඉල්ලා සිටින්නේ එදින ඔහුව මහිමවත් කරන්නයි. ප්‍රිය දරුවෙනි, එදින වැඩියෙන් යාච්ඤා කර වැඩියෙන් යේසුස් ගැන කල්පනා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1985 දෙසැම්බර් 19,

"ප්‍රිය දරුවෙනි, අද දින මා අසල්වැසියන්ට ප්‍රේම කරන්නැයි ඔබෙන් ඉල්ලන්න කැමතියි. ඔබ ඔබේ අසල්වැසියන්ට වැඩියෙන් ප්‍රේම කරන තරමට ඔබ නත්තල් දිනයේ යේසුස්ව අද්දකිනවා ඇත. ඔබව ඔහුට භාර කරනවා නම් දෙවි ඔබට මහත් ත්‍යාග ලබා දෙනවා ඇත. මව්වරුන්ට මා නත්තල් දිනයේ මගේ වි ශේෂාකාර මාතෘ ආශීර්වාදය ලබා දීමට කැමති අතර යේසුස් ඉතිරි අයට තමාගේ ආශීර්වාදය ලබා දෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1985 දෙසැම්බර් 19,

"ප්‍රිය දරුවෙනි, මාගේ පණිවුඩවලට සවන් දී නත්තල් දිනයේ ඒ අනුව ජීවත් වූ ඔබ සියල්ලන්ට මා ස්තූති කරන්නට කැමතියි. පාපයෙන් කිලිටු නොවී මා ප්‍රේමයෙන් ඔබට මග පෙන්වන්නට කැමතියි. ඔබගේ හදවත් මට භාර දෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

1986

වර්ෂ 1986 ජනවාරි 2

"ප්‍රිය දරුවෙනි, දෙවි වෙනුවෙන් තීරණයක් ගැනීමට මා ඔබෙන් ඉල්ලා සිටිමි. ප්‍රිය දරුවෙනි, මා ඔබට පවසන්නේ ඔබව සහමුලින්ම කැප කරන්නේ නම් ඔබට මා පවසන සෑම දෙයක්ම ක්‍රියාවට නැගිය හැකි බවයි. ඔබව සහමුලින්ම දෙවිට භාර දීමට අපහසුතාවයක් නොමැත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 ජනවාරි 9

"ප්‍රිය දරුවෙනි, යේසුස් මෙහි කරමින් සිටින සැලසුම් ඉටු කර ගැනීමට ඔබේ යාච්ඤාවෙන් ඔහුට උපකාර කරන ලෙස මා ඉල්ලා සිටිමි. තමන් සියල්ල සැලසුම් කළ ආකාරයට ඉටු වන පිණිසත් සාතන්ට කිසිවක් කළ නොහැකිවන පිණිසත් ඔබගේ යාග සියල්ල ඔහුට ඔප්පු කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 ජනවාරි 16

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැඳවන්නේ යාච්ඤාවටයි. ඔබ සියල්ලන් තුළින් දෙවි මහිමයට පත්වන පිණිස ඔබගේ යාච්ඤා මට අවශ්‍යව ඇත. ප්‍රිය දරුවෙනි, මා ඔබෙන් අයැද සිටින්නේ මවගේ ආරාධනයට කීකරුව ඒ අනුව ජීවත් වන ලෙයසි. මන්දයත් මා ඔබට උපකාර කරන පිණිස මා ඔබ අමතන්නේ ප්‍රේමයෙනි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 ජනවාරි 23

"ප්‍රිය දරුවෙනි, නැවතත් හෘදයෙන් යාච්ඤා කරන ලෙස මා ඔබෙන් ඉල්ලන්නට කැමැත්තෙමි. ඔබ හෘදයෙන් යාච්ඤා කරන්නේ නම් ප්‍රිය දරුවෙනි, ඔබගේ සහෝදරයන්ගේ ඇස්වල ඇති අයිස් දිය වී සෑම බාධකයක්ම අතුරුදහන් වනු ඇත. එය පිළිගැනීමට කැමති සියල්ලන් සඳහා හැරීම වඩාත් පහසු වෙනවා ඇත. ඔබගේ අසල්වැසියා සඳහා යාච්ඤාවෙන් ඔබ අත් කර ගත යුතු ත්‍යාගය එයයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 ජනවාරි 30

"ප්‍රිය දරුවෙනි, අප සම්බන්ධයෙන් ඇති දෙවිගේ සැලසුම් මෙන්ම දෙවි ඔබ තුළින් ආශාවන දේවල් ඉටු වන පිණිස අද මා ඔබව යාච්ඤාවට කැඳවමි. අන්‍යයන්ට හැරෙන්නට උපකාර කරන්න. ඔබ මාගේ පැමිණ සිටීම ගැන සාක්ෂිකරුවන් වන ලෙස යාච්ඤා කරන්න. ඔබ නැතිව තමන් කැමති දෙය දෙවිට ඉටු කර ගත නොහැකිය. දෙවි සෑම කෙනෙකුටම නිදහස් කැමැත්ත ලබා දී ඇති අතර එය ඔබගේ පාලනයේ පවතී. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 පෙබරවාරි 6

"ප්‍රිය දරුවෙනි, මා තෝරාගෙන ඇති මෙම මීසම වි ශේෂිත එමෙන්ම අන් සියල්ලට වඩා වෙනස් එකක් වන්නේය. එමෙන්ම හෘදයෙන් යාච්ඤා කරන සියල්ලන්ට මම මහත් අනුග්‍රහයක් ලබා දෙමි. ප්‍රිය දරුවෙනි, මා මෙම පණිවුඩ මුලින්ම මීසමේ අයටත් දෙවනුව අන් අයටත් ලබා දෙමි. පළමුකොට ඔබත් පසුව අන් අයත් පණිවුඩ පිළිගත යුතුය. ඔබ මටත් මාගේ පුත් යේසුස්ටත් වගකිව යුතුය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 පෙබරවාරි 13

"ප්‍රිය දරුවෙනි, මෙම ගාවි නාවල කාලය ඔබට වෙනස් වෙන්නට සුවි ශේෂී අවස්ථාවක්. මේ මොහොතේ සිට පටන්ගන්න. රූපවාහිනිය නිවා දමා වැදගැන්මකට නැති වි වි ධ දේවල් අත්හරින්න. ප්‍රිය දරුවෙනි ඔබට වෙනස් වන්නට මා පෞද්ගලිකව ඉල්ලා සිටිමි. මේ සමය ඔබ සඳහා වෙන්කර ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 පෙබරවාරි 20

"ප්‍රිය දරුවෙනි, ගාවි නාවේ දවස්වල දෙවන පණිවුඩය වන්නේ ඔබ යාච්ඤාව කුරුසිය ඉදිරිපිටදී අලුත් කර ගත යුතු බවය. ප්‍රිය දරුවෙනි, මා ඔබට අලුත් අනුග්‍රහයන් ලබා දෙන අතර යේසුස් ඔබට වි ශේෂිත තෑගි කුරුසියෙන් ලබා දෙනවා. ඒවා ලබාගෙන ජීවත් වන්න.

යේසුස්ගේ අනුකම්පාව කල්පනා කර යේසුස් සමග ඔබගේ ජීවි තය තුළ එක්සත් වන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1986 පෙබරවාරි 27

"ප්‍රිය දරුවෙනි, යටහත් පහත්ව මාගේ පණිවුඩ අනුව ජීවත් වන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1986 මාර් තු 6

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ දෙවිට ඔබ තුළින් ක්‍රියා කළ හැකි වන පිණිස ඔහුට වඩාත් වි වෘත වෙන ලෙසය. ඔබ ඔබ වි වෘත වන තරමට පල ලබනවා ඇත. නැවතත් යාච්ඤා කරන ලෙස ඉල්ලමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1986 මාර් තු 13

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබෙන් ඉල්ලා සිටින්නේ ගාවි නාවේ කාලය තුළ ඔබගේ කුඩා යාගයන් මගින් ජීවත් වෙන හැටියටයි. ඔබ මට ගෙනා සියලුම යාගවලට ස්තූතියි. ප්‍රිය දරුවෙනි, දිගටම එලෙස ජීවත් වෙමින් එම යාග පිළිගැන්වී මට ඔබගේ ප්‍රේමයෙන් උපකාර කරන්න. එයට දෙවි ඔබට ප්‍රතිඵල දෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1986 මාර් තු 20

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට යාච්ඤා ක්‍රියාවලියට ලගා වෙන ඉල්ලමි. මා ඔබට කියන ආකාරයට ඔබ ජීවත් වෙන්නට වෑයම් කළත් ඔබ සාර් ථක නොවන්නේ ඔබ යාච්ඤා නොකරන නිසාය. ප්‍රිය දරුවෙනි, ඔබව වි වෘත කර යාච්ඤා කරන්නට පටන් ගන්නා ලෙස මා ඔබෙන් යටහත්ව ඉල්ලමි. යාච්ඤාව ඔබගේ ප්‍රීතිය වෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1986 මාර් තු 27

"ප්‍රිය දරුවෙනි, මා ඔබට සියලුම යාගයන් සඳහා ස්තූති කරන අතර වඩාත් ශ්‍රේෂ්ඨ පරිත්‍යාගය වන ප්‍රේමයේ පරිත්‍යාගය වෙනුවෙන් ස්තූති කරන්නට කැමැත්තෙමි. ප්‍රේමය නොමැතිය ඔබට මාව හෝ මාගේ පුත්‍රයාව පිළිගත නොහැකිය. ප්‍රේමය නොමැතිව ඔබට ඔබගේ අද්දැකීම් පිළිබඳ වාර් තාවක් අන් අයට ලබා දිය නොහැකිය. එබැවි න් ප්‍රිය දරුවෙනි, ඔබ තුළ ප්‍රේමය ක්‍රියාවට නගන්නට මා ඔබෙන් ඉල්ලමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1986 අප්‍රෙල් 3

"ප්‍රිය දරුවෙනි, පූජාවෙහි ජීවත් වන ලෙස මා ඔබෙන් ඉල්ලා සිටින්නට කැමැත්තෙමි. පූජාවෙහි අලංකාරය දැක ඇති ඔබ බොහෝ දෙනෙක් සිටිනවා. එහෙත් අකැමැත්තෙන් පැමිණෙන අයත් ඉන්නවා. ප්‍රිය දරුවෙනි, මා ඔබව තෝරා ගෙන ඇතත් යේසුස් තමාගේ අනුග්‍රහය ලබා දෙන්නේ පූජාවේදීය. එබැවි න් පූජාවෙහි ජීවත් වන ලෙසත් ඊට පැමිණීම ප්‍රීතිමත් එකක් කරන ගන්නා ලෙසත් ඉල්ලමි. ප්‍රේමයෙන් ඊට පැමිණ පූජාව ඔබගේම කර ගන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1986 අප්‍රෙල් 10

"ප්‍රිය දරුවෙනි, ප්‍රේමයෙහි වර් ධනය වෙන ලෙස ඔබෙන් ඉල්ලන්න කැමතියි. මලකට ජලය නොමැතිය සාමාන්‍යයෙන් වර් ධනය වි ය නොහැකිය. එසේම ඔබත් ප්‍රිය දරුවෙනි, දෙවිගේ

ආශීර්වාදය නොමැතිව වර්ධනය විය නොහැකිය. ඔබත් සාමාන්‍ය ලෙස වර්ධනය වී ඔබගේ සියලුම ක්‍රියා ඔහු හා එකගව කරනු පිණිස දිනපතා ඔබ ඔහුගේ ආශීර්වාදය සෙවිය යුතුය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1986 අප්‍රේල් 17

"ප්‍රිය දරුවෙනි, ඔබ ද්‍රව්‍යමය දේවලට ගොදුරු වී සිටින්නහුය. එහෙත් ද්‍රව්‍යමය දේවලින් දෙවි ඔබට දෙන්නට යන දේවල් ඔබ නැති කර ගන්නහුය. ප්‍රිය දරුවෙනි, මාගේ මෙහි සිටීමටත් මා ඔබට දෙන සියල්ලටත් සාක්ෂිදැරීමට හැකි වන පිණිස අවශ්‍ය වන්නා වූ ශුද්ධාත්මයේ දීමනාවට යාච්ඤා කරන ලෙස මා ඔබගෙන් ඉල්ලා සිටිමි. ප්‍රිය දරුවෙනි, ඔබට සම්පූර්ණයෙන්ම මග පෙන්වීමට හැකි වන පිණිස මට ඉඩ දෙන්න. ද්‍රව්‍යමය දේවලට සම්පූර්ණයෙන්ම ගොදුරු නොවන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1986 අප්‍රේල් 24

"ප්‍රිය දරුවෙනි, අද දින මාගේ ආරාධනාව ඔබට යාච්ඤා කරන්නටයි. ප්‍රිය දරුවෙනි, ඔබ සියල්ලන් වැදගත් බව ඔබට අමතක වී ඇත. පවුලක වයස්ගත අය විශේෂාකාරයෙන් වැදගත්ය. ඔවුන්ගෙන් යාච්ඤා කරන ලෙස ඉල්ලා සිටින්න. යෞවන අය තමන්ගේ ජීවිතයෙන් හා යේසුස්ට සාක්ෂි දැරීමෙන් අන්‍යයන්ට ආදර්ශයක් විය යුතුය. ප්‍රිය දරුවෙනි, යාච්ඤාවෙන් වෙනස් වන්නට පටන් ගන්න. එවිට ඔබ කළ යුතු දෙය ඔබ දැනගන්නවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1986 මැයි 1

"ප්‍රිය දරුවෙනි, පවුලේ ඔබගේ ජීවිතය වෙනස් කරන ලෙස ඔබගෙන් ඉල්ලා සිටිමි. පවුල මා යේසුස්ට දෙන්නට බලාපොරොත්තු වන එකගත්වයේ මලක් වේවා. පවුලේ ඵල මා යම් දිනක දකින්නට කැමැත්තෙන් සිටින බැවින් සෑම පවුලක්ම යාච්ඤාවෙහි ක්‍රියාශීලීව සිටිය යුතුය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1986 මැයි 8

"ප්‍රිය දරුවෙනි, පණිවුඩ සඳහා වගකිව යුත්තේ ඔබයි. අනුග්‍රහයේ මාධ්‍යය මෙහි තිබුණත් ප්‍රිය දරුවෙනි, ත්‍යාගයන් ප්‍රවාහනය කරන භාජන ඔබයි. එබැවින් ප්‍රිය දරුවෙනි, මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ වගකීමෙන් ඔබගේ කාර්යය කරන ලෙයසි. සෑම කෙනෙක්ම තමාගේ හැකියාව අනුව වගකිව යුතුය. ප්‍රිය දරුවෙනි, මා ඔබව කැඳවන්නේ ප්‍රේමයෙන් ත්‍යාගයන් ඔබටම තබා නොගෙන එය අන්‍යයන්ට බෙදා දෙන ලෙයසි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1986 මැයි 15

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ මාගේ හා සමාන ලෙස වෙනස් කරන්නට ඔබගේ හෘදයන් මට දෙන ලෙයසි. ප්‍රිය දරුවෙනි මා ඔබෙන් ඉල්ලා සිටින දෙයට ඔබට ප්‍රතිචාරය දැක්විය නොහැක්කේ මන්දැයි ඔබ කල්පනා කරන්නෙහිය. ඊට හේතුව එය වෙනස් කරනු පිණිස ඔබ මට ඔබගේ හදවත් භාර නොදීමයි. ඔබ කථා කරමින් සිටියත් ක්‍රියා කරන්නේ නැත. මා ඔබට කියන්නේ මා කියන සෑම දෙයක්ම කරන ලෙයසි. එලෙස මට ඔබ සමග සිටින්නට පුළුවන. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි.".

වර්ෂ 1986 මැයි 22

"ප්‍රිය දරුවෙනි, අද දින මගේම ප්‍රේමය ඔබට දෙන්නට කැමැත්තෙමි. ප්‍රිය දරුවෙනි ඔබ දන්නවාද මාගේ ප්‍රේමය කොතරම් මහත්ද කියා. එහෙත් ඔබ එය පිළිගන්නා අන්දම දන්නේ නැත. වි වි ධාකාරයෙන් මා එය ඔබට පෙන්වන්නට කැමතියි. එහෙත් දරුවෙනි ඔබ එය පිළිගන්නේ නැත. ඔබ මාගේ වදන් හෘදයෙන් තේරුම් නොගන්නා අතර මාගේ ප්‍රේමයට අනුකූලව කටයුතු කරන්නටද නොදන්නෙහිය. ප්‍රිය දරුවෙනි මාව ඔබගේ ජීවි තයේ පිළිගන්න. එවි ට මා ඔබව කැඳවන එමෙන්ම කියන දේවල්ද ඔබ පිළිගන්නවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.".

වර්ෂ 1986 මැයි 29

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ ඔබ ජීවි තය තුළ දෙවිටත් අසල්වාසින්ටත් ප්‍රේම කරන ලෙයසි. ප්‍රේමය නැතිව දරුවෙනි ඔබට කිසිවක් කළ නොහැකිය. එබැවි න් අන්‍යෝන්‍ය ප්‍රේමයෙන් ජීවත් වන ලෙස ඔබගෙන් ඉල්ලා සිටිමි. මාවත් ඔබගේ මීසමට පැමිණෙන අයවත් ඔබට ප්‍රේමකර පිළිගත හැක්කේ එලෙස පමණි. සෑම කෙනෙකුටම ඔබ තුළින් මාගේ ප්‍රේමය දැනෙනවා ඇත. එබැවි න් ප්‍රිය දරුවෙනි මා ඔබගෙන් ඉල්ලන්නේ මා ඔබට ප්‍රේම කරන ලෙසින්ම අද සිට ප්‍රේම කරන ලෙයසි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.".

වර්ෂ 1986 ජූනි 5

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඉල්ලා සිටින්නේ ඔබ මා ලබා දෙන්නා වූ පණිවුඩවලට එකගව ජීවත් වෙන්නට කැමතිද නැද්ද යන්න තීරණය කරන ලෙයසි. පණිවුඩය අනුව ජීවත් වී එය පතුරුවනවාට මා කැමැත්තෙමි. වි ශේෂයෙන්ම ප්‍රිය දරුවෙනි, අන්ධකාරයේ ගමන් කරන මෙම නොඇදහිලිවන්ත ලෝකය ආලෝකමත් කරමින් ඔබ යේසුස්ගේ ප්‍රතිරූපයක් වන්නේ නම් මා කැමැත්තෙමි. ඔබ සියල්ලන් සඳහා ආලෝකයක් වී ඔබ ආලෝකයේ සිට සාක්ෂි දරනවාට මා කැමැත්තෙමි. ප්‍රිය දරුවෙනි, ඔබව ආලෝකයට කැඳවා ඇත්තේ ඔබගේම ජීවි තයෙන් නොවේ. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.".

වර්ෂ 1986 ජූනි 12

"ප්‍රිය දරුවෙනි, අද දින ජීවමාන ඇදහිල්ලක් ඇතිව කොන්තය යාච්ඤා කරන්නට කැඳවමි. එයාකාරයෙන් මට ඔබට උපකාර කළ හැකිය. ප්‍රිය දරුවෙනි, ඔබ අනුකම්පාව බලාපොරොත්තු වුනත් ඔබ යාච්ඤා කරන්නේ නැත. ඔබ පටන් ගන්නට කැමති නැති නිසා මා ඔබට උපකාර කරන්නට වි දියක් නැත. ප්‍රිය දරුවෙනි, මා කොන්තය කියන්නට ඔබට කියන අතර එය ප්‍රීතියෙන් ඔබ ඉටු කරන බැඳියාවක් වි ය යුතුය. එයාකාරයෙන් මා ඔබ සමග මෙතරම් කාලයක් කටයුතු කරන්නට හේතුව තේරුම් ගන්නවා ඇත. යාච්ඤා කරන්නට උගන්වන්නට මා කැමැත්තෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 ජූනි 19

"ප්‍රිය දරුවෙනි, මේ දවස්වල මාගේ ස්වාමීන් වැඩිඅනුකම්පාවක් ඔබට ලබා දෙන්නට මට ඉඩ හැර ඇත. එබැවි න් නැවතත් ප්‍රිය දරුවෙනි, අත්නෑර යාච්ඤා කරන්නට ඔබගෙන් අයැද සිටින්නට කැමැත්තෙමි. එයාකාරයෙන් ස්වාමීන් මට දෙන්නා වූ ප්‍රීතිය ඔබට ලබා දීමට මට හැකි වනු ඇත. මෙම අනුග්‍රහයන් ලැබීමෙන් ඔබගේ දු ක ප්‍රීතියක් බවට පත්වෙනවාට මා කැමැත්තෙමි. ඔබගේ මව මමයි, මා කැමති වන්නේ ඔබට උපකාර කරන්නටයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 ජූනි 26

“ප්‍රිය දරුවෙනි,  දෙවි තමන් සමග සාමයේ මෙම පණිවුඩය ඔබ වෙතට ගෙනෙන්නට මට ඉඩ හැර තිබෙනවා. මා ඔබගෙන් ඉල්ලන්නේ එය කිලිටි නොවන පිණිස එය ආරක්ෂා කරන ලෙයසි. තමන්ගේ නොසැලකිල්ලෙන් සාමය හා යාච්ඤාව වි  නාශ කරන අය සිටිනවා. මා ඔබට ආරාධනා කරන්නේ සාක්ෂි දරමින් සාමය පවත්වා ගැනීමට ඔබගේ ජීවි  තයෙන් උපකාර කරන ලෙයසි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි.”

වර්ෂ 1986 ජුලි 3

“ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබ සියල්ලන්ව යාච්ඤාවට කැදවමි. යාච්ඤාව නොමැතිව ප්‍රිය දරුවෙනි, ඔබට දෙවිව, මාව හෝ මා ඔබට දෙන අනුග්‍රහය අද්දකින්නට නොහැකිය. එනිසා ඔබට මාගේ ඉල්ලීම වන්නේ දවසේ ආරම්භයත් අවසානයත් යාච්ඤාවෙන් කරන ලෙයසි. ප්‍රිය දරුවෙනි මා වැඩිවැඩියෙන් ඔබව යාච්ඤාවට යොමු කිරීමට කැමති වුනත් ඔබ ඊට අකැමැති බැවි  න් ඔබට වැඩෙන්නට නුපුළුවන. මාගේ ඉල්ලීම ප්‍රිය දරුවෙනි යාච්ඤාවට මුල් තැන දෙන ලෙයසි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි.”

වර්ෂ 1986 ජුලි 10

“ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට ශුද්ධකමට කැදවමි. ශුද්ධකම නොමැතිව ඔබට ජීවත් වන්නට නොහැකිය. එබැවි  න් ප්‍රේමයෙන් සෑම පාපයක්ම එමෙන්ම ඔබට එන සෑම දු ෂ්කරත්වයක්ම යටපත් කරන්න. ප්‍රිය දරුවෙනි, ප්‍රෙමය ඔබ තුළ ප්‍රානවත්ව තබා ගන්නා ලෙස මා ඉල්ලමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි.”

වර්ෂ 1986 ජුලි 17

“ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබ සමග මෙතරම් කාලයක් සිටීමට හේතුව කල්පනා කරන ලෙස ඉල්ලමි. මා සිටින්නේ ඔබත් දෙවිත් අතරය. එබැවි  න් ප්‍රිය දරුවෙනි, නිතර ප්‍රෙමයෙන් ජීවත් වන ලෙස ඉල්ලන්න කැමතියි. දරුවෙනි යටහත්ව මා ඔබට දෙන පණිවුඩ අනුව ජීවත් වෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි.”

වර්ෂ 1986 ජුලි 24

“ප්‍රිය දරුවෙනි, ශුද්ධකමේ මාර්ගයට පැමිණ සිටින ඔබ සියල්ලන් වෙනුවෙන් මා සතුටු වෙමි. එමෙන්ම ශුද්ධ ලෙස ජිවත් වන්නට නොදන්නා අයට ඔබගේ සාක්ෂිය තුළින් උගන්වන ලෙස මා ඉල්ලමි. එබැවි  න් දරුවෙනි, ඔබගේ පවුල් ශුද්ධකම ආස්වාස කරන ස්ථානයක් වේවා. සියල්ලන්ට ශුද්ධකමෙන් ජීවත් වෙන්නට සෑම කෙනෙකුටම වි  ශේෂයෙන් ඔබගේ  පවුලේ අයට උපකාර කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි.”

වර්ෂ 1986 ජුලි 31

“ප්‍රිය දරුවෙනි, වෛරය වි  රුද්ධවාදිකම උත්පාදනය කරන අතර කිසිවක් හෝ කිසිවෙක් තකන්නේ නැත. මා නිතර ඉල්ලා සිටින්නේ එකගත්වය හා සාමය ගෙනෙන ලෙයසි. වි  ශේෂයෙන්ම ප්‍රිය දරුවෙනි ඔබ ජීවත් වන ස්ථානයේ ප්‍රේමයෙන් ක්‍රියා කරන්න. ඔබගේ එකම උපකරණය නිතර ප්‍රේමය වේවා. සාතන් වි  නාශ කර අත්පත් කර ගැනීමට වෑයම්වි කරන්නාවූ සැමෙකක්ම ප්‍රේමයෙන් යහපතට හරවන්න. ඔබට සම්පූර්ණයෙන්ම මා ෂතවු වි  ය හැක්කේත් මට ඔබට උපකාර කළ හැක්කේත් එලෙසින් පමණි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි.”

වර්ෂ 1986 අගෝස්තු 7

"ප්‍රිය දරුවෙනි, මා ඔබට සාමයේ තත්ත්වයක්
පොරොන්දු වූ බව ඔබ
දන්නෙහිය. එහෙත් එය අභියස සාතන් වි සින් ඔබ පරීක්ෂාකර ඔබව අතරමං කිරීමට වෑයම් කරන්නාවූ කාන්තාරයක් ද ඇති බව ඔබ නොදන්නෙහිය. ප්‍රිය දරුවෙනි ඔබගේ තැනේ ඇති සාතන්ගේ සියලුම බලපෑම් ඔබට ජයගත හැක්කේ යාච්ඤාවෙන් පමණි. මා ඔබ සමග සිටියත් ඔබගේ නිදහස මට ඉවත් කළ නොහැකිය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 අගෝස්තු 14

"ප්‍රිය දරුවෙනි, මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ ඔබගේ යාච්ඤාව ස්වාමීන් සමග ගැටීමක ප්‍රීතියක් කර ගන්නා හැටියටයි. ඔබ යාච්ඤාවේ ප්‍රීතිය අද්නොදකිනතෙක් මට ඔබට මග පෙන්වන්නට නොහැකිය. දිනෙන් දින මා ඔබට යාච්ඤාවෙන් මගපෙන්වන්නට කැමති වුනත් මා ඔබට බල කරන්නට කැමති නැත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 අගෝස්තු 21

"ප්‍රිය දරුවෙනි, ඔබ මට පෙන්වන ප්‍රේමයට ස්තූතියි. ප්‍රිය දරුවෙනි මා ඔබට අසීමිතව ප්‍රේම කරන බව ඔබ දන්නා අතර දිනපතා මා ස්වාමීන්ට යාචඤා කරන්නේ මා ඔබට පෙන්වන ප්‍රේමය තේරුම් ගැනීමට ඔබට උපකාර කරන ලෙයසි. එ බැවි න් දරුවෙනි යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න.

වර්ෂ 1986 අගෝස්තු 28

"ප්‍රිය දරුවෙනි, මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ සියල්ලේම විශේෂයෙන්ම යාච්ඤාවෙහි හා සාක්ෂි දැරීමෙහි ඔබ අන්‍යයන්ට ආකෘතියක් වන ලෙසය. ප්‍රිය දරුවෙනි ඔබ නැතිව මට ලෝකයට උපකාර කළ නොහැකිය. ඔබ මා සමග සියල්ලෙහි, ඉතා කුඩා දේවලදී පවා සහයෝගී වන්නේ නම් මා කැමැත්තෙමි. එබැවි න් ප්‍රිය දරුවෙනි ඔබගේ යාච්ඤා හෘදයෙන් ඉදිරිපත් කිරීමෙන් එමෙන්ම ඔබව මට සම්පූර් ණයෙන් භාර දීමෙන් මට උපකාර කරන්න. එයාකාරයෙන් මා ඔබ සමග පටන් ගෙන ඇති මාර් ගයේ ඔබට උගන්වා මගපෙන්වන්නට පුළුවන. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 සැප්තැම්බර් 4

"ප්‍රිය දරුවෙනි, අද දින මා යළිත් ඔබ කැඳවන්නේ යාච්ඤාවට හා නිරාහාරව සිටීමටය. ප්‍රිය දරුවෙනි ඔබගේ උපකාරය ඇතිව සියල්ල ඉටු කර ගන්නටත්
දු ෂ්ටකම පෙලඹවී මක් නොකර
මෙම ස්ථානයෙන් තමාව ඉවත් කර ගැනීමට සාතන්ට බලකරන්නටත් මට පුළුවන් බව ඔබ දන්නවා. ප්‍රිය දරුවෙනි, සාතන් සෑම පුද්ගලයෙක් ගැනම බලා සිටිනවා. වි ශේෂයෙන්ම දෛනික කටයුතුවලදී ඔබ සෑම කෙනෙකුවම අකුල කරන්නට ඔහුට උවමනා වී ඇත. එබැවි න් ප්‍රිය දරුවෙනි, මා කියන්නේ ඔබගේ දවස යාච්ඤාවටත් සම්පූර් ණයෙන් දෙවිට යටත් වී මටත් යොදා ගන්නා ලෙයසි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 සැප්තැම්බර් 11

"ප්‍රිය දරුවෙනි, මේ දිනවල ඔබ ප්‍රීතියෙන් කුරුසියට උත්සව පවත්වන කාලයේ එම කුරුසිය ඔබට ප්‍රීතියක් වී ම මා ආශා කරමි. ප්‍රිය දරුවෙනි, යේසුස් රෝග හා
දු ක්වේදනා පිළිගත් ලෙසින්
එබටත් එය පිළිගත හැකි වනු පිණිස යාච්ඤා කරන්න. යේසුස් මට ඉඩ දෙන්නා වූ අනුග්‍රහයන් හා සුවකිරීම් ම වි සින් ඔබට ලබා දිය හැකි වන්නේ එයාකාරයෙනි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 සැප්තැම්බර් 18

"ප්‍රිය දරුවෙනි, මේ දිනවල ඔබ මා වෙනුවෙන් ඉටු කර ඇති සියල්ල වෙනුවෙන් ඔබට ස්තූති කියමි. විශේෂයෙන්ම මා ඔබට යේසුස්ගේ නාමයෙන් ඔබ පසුගිය සතියේ ඔප්පු කළ යාග සඳහා ස්තූති කරමි. ප්‍රිය දරුවෙනි, සාතන් ව ඔබගෙන් ඈත් කිරීමටත් ඔබට ම විසින් උපකාර කිරීමටත් හැකි වන පිණිස මා යාගවලට කැමති බව ඔබ අමතක කරන්නහුය. එබැවින් මා නැවතත් ඔබ අමතන්නේ දෙවි කෙරෙහි විශේෂිත ගෞරවයක් ඇතිව යාග ඔප්පු කරන ලෙයසි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1986 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, ඔබගේම සාමයෙන් මා ඔබෙන් ඉල්ලා සිටින්නේ අන්‍යයන්ට සාමය දැකීමටත් සාමය සෙවීමටත් උපකාර කරන ලෙයසි. ඔබ ප්‍රිය දරුවෙනි, සාමයෙන් සිටන අතර සාමයේ අඩුවක් නැතිව සිටින්නහුය. එබැවින් මා ඔබට කියන්නේ ඔබගේ යාච්ඤාවෙන් හා ජීවිතයෙන් ජනයා තුළ දු ෂ්ට සියල්ල විනාශ කිරීමටත් එමෙන්ම සාතන් පාවිච්චි කරමින් සිටින බොරුව එළිදැක්වීමටත්ය. සියලු හෘදයන්හි සත්‍යය පවතින පිණිස ඔබ යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1986 ඔක්තෝබර් 2

"ප්‍රිය දරුවෙනි, අද මම නැවතත් ඔබව යාච්ඤාවට කැඳවමි. ඔබ ප්‍රිය දරුවෙනි, යාච්ඤා නොකරන තෙක් එහි අගය නොදන්නෙහිය. දැන් යාච්ඤාව සඳහා අවස්ථාවයි. වෙනත් කිසිවක් මට වැදගත් නැත. දැන් දෙවි හැර වෙනත් කිසිවෙක් මට වැදගත් නැත. දැන් ප්‍රිය දරුවෙනි, දෙවි නැවතත් ඔබට අනුග්‍රහය දක්වනු පිණිස විශේෂ ප්‍රේමයකින් ඔබව යාච්ඤාවට යොමු කර ගන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1986 ඔක්තෝබර් 9

"ප්‍රිය දරුවෙනි, ඔබ දන්නවා මා බලය පාවිච්චි කරමින් ඔබට මගපෙන්වීමට කැමති බව. මා කැමතියි ඔබ සෑම කෙනෙක්ම මා විසින් දිනෙන් දින ශුද්ධකම කරා මෙහෙයවනු පිණිස ආත්ම පරිත්‍යාගීව තමන්ටම උපකාර කර ගන්නේ නම් කැමැත්තෙමි. එබැවින් ප්‍රිය දරුවෙනි, මගේ පණිවුඩ අනුව කටයුතු කරන්නට බල කරන්නට මා නොකැමැත්තෙමි. එහෙත් මා ඔබ සමග සිටි මෙතරම් දීර්ග කාලය මා ඔබට අසීමිතව ප්‍රේම කරන බවටත් මා ඔබන් ශුද්ධත්වයට පත් වීම ඉල්ලා සිටින බවටත් ලකුණකි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1986 ඔක්තෝබර් 16

ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට ප්‍රේම කරන තරම නැවතත් පෙන්වීමට කැමති වුනත් සෑම කෙනෙකුටම මගේ ප්‍රේමයේ ප්‍රමාණය පෙන්වීමට නොහැකි වීම ගැන මම කණගාටු වෙමි. එබැවින් ප්‍රිය දරුවෙනි සාතන්ට ඔබට දෛනික කටයුතු මගින් හා ඔබගේ ජීවිතයේ ප්‍රථම ස්ථානය ලබා ගැනීමට වුවමනා වී ඇති බැවින් මා ඔබව යාච්ඤාවටත් සම්පූර්ණයෙන් දෙවිට කැපවීමටත් කැඳවමි. එබැවින් ප්‍රිය දරුවෙනි අත්නෑර යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1986 ඔක්තෝබර් 23

ප්‍රිය දරුවෙනි, අද දින මා නැවතත් ඔබව යාච්ඤාවට කැඳවමි. විශේෂාකාරයෙන් දරුවෙනි මා ඔබට කැඳවන්නේ සාමය සඳහා යාච්ඤා කිරීමටයි. ඔබගේ යාච්ඤාව නොමැතිව දරුවෙනි ස්වාමීන් ඔබට දෙන්නට මට දී ඇති පණිවුඩය ඉටු කරන්නට මට ඔබට උපකාර කළ

නොහැකිය. එබැවි න් දරුවෙනි යාච්ඤා කරන්න. එමගින් දෙවි ඔබට දෙන දෙය ඔබට තේරුම් ගත හැකිය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1986 ඔක්තෝබර් 30

ප්‍රිය දරුවෙනි, අද දින මා නැවතත් ඔබගෙන් ඉල්ලන්නේ මා ඔබට දෙන පණිවුඩය හොඳින් සලකා ඒ අනුව ක්‍රියා කරන ලෙයසි. ප්‍රිය දරුවෙනි, මා මෙතරම් කාලයක් බලා සිටියේ ඔබ නිසයි. එමෙන්ම මා ඔබට දෙන පණිවුඩ ඉටු කර ගත හැකි වන පිණිසයි. එබැවි න් ප්‍රිය දරුවෙනි, මට ප්‍රේමයෙන් මා දෙන පණිවුඩ අනුව කටයුතු කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1986 නොවැම්බර් 6

ප්‍රිය දරුවෙනි, අද දින ශුද්ධගිනිස්ථානයේ ආත්ම වෙනුවෙන් යාච්ඤා කරන ලෙස වි ශේෂයෙන් මා ඉල්ලන්නට කැමතියි. සෑම කෙනෙකුටම දෙවි වෙතට එන්නටත් දෙවිගේ ප්‍රේමය ලැබීමටත් යාච්ඤාව අවශ්‍යයි. එසේ කිරීමෙන් ප්‍රිය දරුවෙනි, පොළොවේ දේවල් ජීවි තය සඳහා වැදගත් නොවන බව තේරුම් ගැනීමට ඔබට උපකාර කරන්නාවූ අලුත් අතරමැදියන් ඔබට ලබා ගත හැකිය. එමෙන්ම වෑයම් කළ යුත්තේ ස්වර් ගය සඳහා බවත් ඔබ තේරුම් ගන්නවා ඇත. එබැවි න් ප්‍රිය දරුවෙනි අත්නෑර ඔබ වි සින් ඔබට උපකාර කළ හැකි වන පිණිසත් ඔබගේ යාච්ඤා ප්‍රීතියක් වන්නාවූ අන් අය උදෙසාත් යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1986 නොවැම්බර් 13

ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට මුළු හෘදයෙන්ම යාච්ඤා කරන්නටත් දිනෙන් දින ඔබගේ ජීවි තය වෙනස් කිරීමටත් කැඳවමි. වි ශේෂයෙන්ම දරුවෙනි මා කියන්නේ ඔබගේ යාච්ඤා හා යාග මගින් ඔබ ශුද්ධව ජීවත් වෙන්නට පටන් ගන්නා බවයි. මන්දයත් ඔබට පාරාදීසයේදී වි ශේෂිත තෑග්ගක් මට දිය හැකි වන අතර එය ශුද්ධකම වනු ඇත. එබැවි න් ප්‍රිය දරුවෙනි සම්පූර් ණයෙන්ම ශුද්ධ වන පිණිස යාච්ඤා කර ඔබගේ ජීවි තය වෙනස් කර ගන්න. මා නිතරම ඔබේ ලඟින් සිටින්නම්. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1986 නොවැම්බර් 20

ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබෙන් ඉල්ලන්නේ ජීවත් වී මා ඔබට දෙන වි ශේෂිත පණිවුඩ අනුගමනය කරන ලෙයසි. ප්‍රිය දරුවෙනි ඔබ ඇල්මැරුන තත්වයෙන් හෝ අතිරික තත්ත්වයෙන් දෙවිට අවශ්‍ය නොවන අතර ඔනෑ කරන්නේ ඔබ සම්පූර් ණයෙන් ඔබට භාර වී මයි. මා ඔබට ප්‍රේම කරන බවත් ප්‍රේමයෙන් මා බලා සිටින බවත් ඔබ දන්නෙහිය. එබැවි න් ප්‍රිය දරුවෙනි, ඔබත් බලා සිට දෙවිගේ ප්‍රේමය අද්දකින පිණිස ප්‍රේමය උදෙසා තීරණයක් ගන්න. ප්‍රේමය එනම් මිනිස් ප්‍රේමය නොව දේව ප්‍රේමය ඔබ තුළ පවතින පිණිස ප්‍රිය දරුවෙනි, ප්‍රේමය උදෙසා තීරණයක් ගන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1986 නොවැම්බර් 27

ප්‍රිය දරුවෙනි, නැවතත් අද මා ඔබගෙන් ඉල්ලන්නේ මට ප්‍රේමයෙන් ඔබට මග පෙන්වි ය හැකි වන පිණිස ඔබගේ ජීවි ත ප්‍රේමයෙන් පුදන ලෙයසි. ප්‍රිය දරුවෙනි, වි ශේෂ ප්‍රේමයකින් මා ඔබට ප්‍රේම කරන අතර ඔබව දෙවි වෙතට ස්වර් ගයට ගෙනෙන්නට කැමැත්තෙමි. ස්වර් ගය සමග සැසඳීමේදී මෙම ජීවි ය කෙටි බව ඔබ තේරුම් ගත යුතුයි. එබැවි න් ප්‍රිය දරුවෙනි, අද දින දෙවි උදෙසා තීරණයක් ගන්න. ඔබ මට කොතරම් සමීපද කියාත් ඔබ ගැලවෙනවාට මෙන්ම මා සමග ස්වර් ගයේ සිටිනවාට මා කොතරම් කැමතිද කියා මට පෙන්වි ය හැක්කේ එසේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1986 දෙසැම්බර් 4

ප්‍රිය දරුවෙනි, ස්වාමීන් ඔබගේ අතීත පාපවලින් ඔබව ශුද්ධ කරන්නට කැමතිවන මේ දවස් සඳහා ඔබගේ හදවත් සූදානම් කරන ලෙස ඉල්ලමි. දරුවෙනි මා මෙහි උපකාර කරමින් සිටින්නේ තනියම ඔබට කිසිවක් කළ නොහැකි නිසයි. දරුවෙනි ඔබ යාච්ඤා කරන්න. ස්වාමීන් ඔබව සම්පූර්ණයෙන්ම ශුද්ධ කරනු පිණිස ඔබව ස්වාමීන්ට දිය හැක්කේ එලෙසින් පමණි. එබැවින් ප්‍රිය දරුවෙනි අත්නෑර යාච්ඤා කරන්න. ඔබගේ හදවත් නිරාහාරව සිටීමෙන් සූදානම් කර ගන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1986 දෙසැම්බර් 11

ප්‍රිය දරුවෙනි, මා විශේෂයෙන්ම මේ දිනවල අලුත උපන් යේසුස්ව හමු වී මේ ප්‍රීතිය අද්දකින්න පිණිස ඔබව කැඳවන්නේ යාච්ඤා කිරීමටයි. ප්‍රිය දරුවෙනි මා මේ දිනවල් අද්දකින ආකාරයට ඔබත් අද්දකිනවාට මා කැමැත්තෙමි. ප්‍රීතියෙන් මා ඔබට මග පෙන්වන්නටත් මා ඔබ සෑම කෙනෙක්වම ගෙනෙන්නට කැමති වන ප්‍රීතිය ඔබට පෙන්වන්නටත් කැමැත්තෙමි. එබැවින් ප්‍රිය දරුවෙන් යාච්ඤා කර ඔබව සම්පූර්ණයෙන්ම මට භාර දෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1986 දෙසැම්බර් 18

ප්‍රිය දරුවෙනි, නැවතත් මා ඔබව යාච්ඤාවට කැඳවන්නට කැමතියි. ඔබ යාච්ඤා කරන විට මල් මෙන් වඩාත් ලස්සනයි. එලෙස ඔබත් දරුවෙනි යාච්ඤාවෙන් පසු වඩාත් ලස්සන වන්නේ කුමක්දැයි දෙවි ඉදිරියේ පෙන්වන්න. එබැවින් ප්‍රිය දරුවෙන් යාච්ඤා කර ඔබගේ අභ්‍යන්තරය දෙවිට විවෘත කරන්න. එවිට ඔබව පාරාදීසයට ලස්සන මෙන්ම සුදුසු මලක් බවට ඔබව පත් කරන්නට ඔහුට පුළුවන. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1986 දෙසැම්බර් 25 (නත්තල් දිනය)

ප්‍රිය දරුවෙනි, අද දිනත් ස්වාමීන් මට කරන සියල්ල වෙනුවෙන් විශේෂයෙන්ම අද දින මට ඔබත් සමග සිටින්නට හැකි වීම වෙනුවෙන් මා ඔහුට ස්තූතිය දෙනවා. ප්‍රිය දරුවෙනි පියානන්ට තමන්ගේ හෘදයන් විවෘත කරන සියල්ලන්ට ඔහු විශේෂිත අනුග්‍රහයන් ලබා දෙන්නේ මේ දිනවලදීය. මම ඔබට ආශීර්වාද දරන අතර ප්‍රිය දරුවෙනි ඔබ අනුග්‍රහයන්ට ජීවමාන වන්නේ නම් එලෙසම දෙවි ඔබ තුළින් වඩාත් මහිමවත් වන්නට සියල්ල ඔහුට භාර දෙන්නේ නම් ආශා වෙමි. මගේ හදවත ඔබගේ වර්ධනය ගැන සැලකිලිමත් වෙනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

1987

වර්ෂ 1987 ජනවාරි 1

"ප්‍රිය දරුවෙනි, ඔබ ජීවත් වන නව වසරේ මා දෙන පණිවුඩයට අනුව ජීවත් වන ලෙස අද මම ඔබගෙන් ඉල්ලන්න කැමතියි. ප්‍රිය දරුවෙනි ඔබ ශුද්ධකමේ වර්ධනයක් ලබන පිණිස මා මෙතෙක් කල් ඔබ සමග රැඳී සිටිය බව ඔබ දන්නවා. එබැවින් දරුවෙනි දිගටම යාච්ඤා කරමින් මා ඔබට දෙන පණිවුඩ අනුව ජීවත් වෙන්න. මන්ද මා එසේ කරන්නේ ඔබටත් දෙවිටත් තිබෙන ප්‍රේමය නිසාය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1987 ජනවාරි 8

"ප්‍රිය දරුවෙනි, මාගේ පණිවුඩයට ප්‍රතිචාරය වෙනුවෙන් ස්තූති කරන්න කැමතියි. විශේෂයෙන්ම දරුවෙනි ඔබගේ සියලු යාග හා යාච්ඤාවන්ට ස්තූතියි. දරුවෙනි මා ඔබට බ්‍රහස්පතින්දාවන්හි පමණක් නොව සෑම මසකම 25වන දිනත්

තවදු රටත් පනිවුඩ දෙන්න කැමතියි. ස්වාමීන්ගේ කැමැත්ත ඉටු වන අවධිය පැමින තිබේ. දැන් මම ඔබට අඩුවෙන් පණිවුඩ දෙන නමුත් මා සිටින්නේ ඔබ සමගයි. එබැවි න් දරුවෙනි මා ඉල්ලන්නේ මගේ පණිවුඩවලට සවන් දී ඒ අනුව පිවත් වෙන්න. ඔබට මග පෙන්වන්න හැක්කේ එවි ටය. දරුවෙනි මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1987 ජනවාරි 25 "ප්‍රිය දරුවෙනි, අද දින සිට අලුත් ජීවි තයක් ගත කරන්නට ඔබව කැඳවන්න කැමතියි. ප්‍රිය දරුවෙනි දෙවි ඔබ එක් එක්කෙනාව මිනිස් වර්ගයාව ගලවා ගැනීමේ මහත් සැලැස්මේ පාවි ච්චි කරන පිණිස තෝරාගෙන ඇති බව ඔබ දැන ගත යුතුය. දෙවිගේ සැලැස්මේ ඔබගේ කාර්ය භාරය ඔබට තේරුම් ගැනීමට නුපුළුවන. එබැවි න් ඔබ සම්බන්ධයෙන් දෙවිගේ සැලැස්ම ඔබ තේරුම් ගන්නා පිණිස යාච්ඤා කරන්න. එය සම්පූර්ණයෙන් ඔබ ඉටු කරනු පිණිස මා ඔබ සමග සිටිමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1987 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද දින ඔබ සියල්ලන්ව මාගේ වස්ත්‍රයේ ඔතාගෙන වෙනස් වී මේ මාර්ගයේ ගෙන යන්නට කැමැත්තෙමි. ප්‍රිය දරුවෙනි ඔබගේ අතීතයත් ඔබගේ හෘදයන්හි ඇති සියලුම දු ෂ්ට දෙවල්ද ස්වාමීන්ට භාර කරන්න. ඔබ සෑම කෙනෙක්ම ෂතුටින් සිටිනවාට මා කැමති නමුත් පව් ඇතිව කිසිවෙකුට ෂතුටු වි ය නොහැකිය. එබැවි න් ප්‍රිය දරුවෙනි යාච්ඤා කරන්න. එවි ට යාච්ඤාවෙන් ඔබ ෂතුටු ව සිටීමේ නව මගක් දකිනු ඇත. ප්‍රීතිය ඔබගේ හදවත්වල ජනිත වෙන අතර මමත් මගේ පුත්‍රයාත් ඔබෙන් ඉල්ලන දෙය ප්‍රීතියෙන් ඔබ සාක්ෂි දරනු ඇත. මා ඔබට ආශීර්වාද කරනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1987 මාර්තු 25

"ප්‍රිය දරුවෙනි, අද දින ඔබ මෙහි එනම් ඔබට වි ශේෂ අනුග්‍රහයන් ලබා දෙන ස්ථානයට පැමිණීම ගැන ඔබට ස්තූති කරනවා. දෙවි ඔබගෙන් ඉල්ලා සිටින එමෙන්ම ප්‍රේමයේ හා දයාවේ යහපත් ක්‍රියා කරන ජීවි තයකි ගත කරන ලෙස මා අද දින ඔබගෙන් ඉල්ලා සිටිනවා. ඔබ පණිවුඩයට අනුව ජීවත් වන අතර මාව අසතුටට පත් කරන පාපයන් කරන ජීවි තයක් ඔබ ගත කිරීම මා කැමති නැහැ. එබැවි න් දෙවි ඔබ තුළ නිපදවන හා ඔබට දෙන සියල්ල නැති කර නොගන්නා නව ජීවි තයක් ඔබ එක් එක්කෙනා ගත කිරීම මට ඕනෑ කර තිබේ. මා ඔබට මගේ වි ශේෂ ආශීර්වාද ලබා දෙන අතර ඔබගේ සියලු වෙනස් වී ම්වලදී මා ඔබ සමග සිටිනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1987 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබගෙන් ඉල්ලන්නේ යාච්ඤා කරන ලෙයසි. දෙවි යාච්ඤාවෙන් වි ශේෂ අනුග්‍රහයන් ලබා දෙන බව ඔබ දන්නවා. එබැවි න් මා ඔබට මෙහි ලබා දෙන සියල්ල කරනු පිණිස සොයා යාච්ඤා කරන්න. මා ඔබෙන් ඉල්ලා සිටින්නේ දරුවෙනි හෘදයෙන් යාච්ඤා කරන ලෙයසි. දෙවි ඔබ එක් එක්කෙනා තුළින් කරන්නට යන දෙය යාච්ඤාව නොමැතිව ඉටු කරන්නට බැරි බව ඔබ දන්නවා. එබැවි න් යාච්ඤා කරන්න. ඔබ සෑම කෙනෙක් මාර්ගයෙන්ම දෙවිගේ සැලැස්ම එනම් දෙවි ඔබගේ හෘදයේ පැල කර ඇති දෙය වර්ධනය වී මක් ඉටු වී ම මාගේ ආශාවයි. එබැවි න් ඔබට තර්ජනය කරන්නා වූ සියලු දු ෂ්ට දෙවලින් දෙවිගේ ආශීර්වාදය ඔබව ආරක්ෂා කරන ලෙස යාච්ඤා කරන්න. ප්‍රිය දරුවෙනි මා ඔබට ආශීර්වාද කරනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1987 මැයි 25

"ප්‍රිය දරුවෙනි, ඔබ සෑම කෙනෙක් ම දෙවිගේ ප්‍රේමයෙහි ජීවත් වන ලෙස මා ඉල්ලන්න කැමතියි. ප්‍රිය දරුවෙනි ඔබ පව් කර ඔබව සාතන්ගේ අතට පත් කර ගැනීමට ඔබ සූදානමින් සිටිනවා. ඔබ සෑම කෙනෙක්ම දෙවි වෙනුවෙන් හා සාතන්ට වි රුද්ධව තීරණය කරන ලෙස මා ඔබගෙන් ඉල්ලා සිටිනවා. මා ඔබගේ මව වන අතර ඔබව ශුද්ධකමට මගපෙන්න මා කැමතියි. ඔබ සෑම කෙනෙක්ම මෙහි පොළොවේ සතුටින් සිට මා සමග ස්වර් ගයේ සිටිනවාට මා කැමතියි. ප්‍රිය දරුවෙනි මා මෙහි පැමිණීමේ හා මාගේ ආශාවේ අරමුණ එයයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තුතියි."

වර් ෂ 1987 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට ස්තූති කරන්නට කැමතියි. අද මා ඔබ සියල්ලන්ට ආශීර් වාද කරන්න කැමතියි. මා ඔබට දෙවිගේ ආශීර් වාදයෙන් ආශීර් වාද කරන අතර මාව අනුගමනය කර මාගේ මගෙහි ජීවත් වන ලෙස ප්‍රිය දරුවෙනි මා ඔබගෙන් ඉල්ලා සිටිනවා. ප්‍රිය දරුවෙනි මා ඔබට ප්‍රේම කරනවා. මා ඔබව අමතන වාර ගණන පවා මා ගණන් කරන්නේ නැහැ. එමෙන්ම මාගේ අභිප්‍රායන් උදෙසා ඔබ කරන දේවල්වලට මා ඔබට ස්තූති කරනවා. ඔබව දෙවිට ඉදිරිපත් කිරීමටත් ඔබව ගලවා ගැනීමත් මට උපකාර කරන ලෙස මා ඔබගෙන් අයැද සිටිනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1987 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, අද දින සිට ශුද්ධකම පැළඳ ගන්නා ලෙස මා ඔබගෙන් උදක් ඉල්ලා සිටිනවා. මා ඔබට ප්‍රේම කරන නිසා ඔබ ශුද්ධව සිටිනවාට මා කැමතියි. එම මාර් ගයේ සාතන් ඔබට බාධා කරනවාට මා කැමති නැහැ. ප්‍රිය දරුවෙනි දෙවි තිත්තකමේ මාර් ගයේ ඔබට ලබා දෙන සියල්ල පිළිගෙන යාච්ඤා කරන්න. එහෙත් ඒත් සමගම එම මාර් ගයේ යෑමට කැමතිවන කවරෙකුට නමුත් දෙවි සියලු රසවත්කම් ලබා දෙනවා ඇත. එමෙන්ම ඔහු දෙවිගේ සෑම කැඳවී මකටම පිළිතුරු දෙනවා ඇත. ලස්සන දෙවල්වලට වැදගත්කමක් ලබා නොදෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1987 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, අද දිනත් මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ මාගේ පනිවුඩවලට එකගව ජීවත් වන්නට ඔබ සෑම කෙනෙක්ම තීරණයක් ගන්නා ලෙයසි. පල්ලිය මට කැප කර ඇති ලෙසින් ඔබට කථා කරන්නටත් ඔබව ශුද්ධකමට පොළඹවන්නටත් මේ වසරේ දෙවි මට අවසරය ලබා දී ඇත. එබැවි න් ප්‍රිය දරුවෙන, දෙවි මා තුළින් ඔබට ලබා දෙන අනුග්‍රහයන් සොයන්න. ඔබගේ ශුද්ධකම සම්පූර් ණ වන පිණිස ඔබ සොයන්නා වූ සියල්ල වෙනුවෙන් දෙවි සමග කටයුතු කරන්නට මා සූදානම්. එබැවි න් ප්‍රිය දරුවෙනි සොයන්නට අමතක කරන්න එපා, මන්දයත් ඔබ වෙනුවෙන් අනුග්‍රයන් ලබා ගන්නට දෙවි මට අවසර දී ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1987 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද දිනත් මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ යාච්ඤා කරන ලෙයසි. යාච්ඤාව ඔබගේ ජීවි තය වේවා. ප්‍රිය දරුවෙනි ඔබගේ කාලය යේසුස්ට පමණක් කැප කරන්න එවි ට ඔබ සොයන්නා වූ සියල්ල ඔහු ඔබට ලබා දෙනවා ඇත. ඔහු පූර් ණ ලෙස තමාව ඔබට එළිදක්වනවා ඇත. ප්‍රිය දරුවෙනි සාතන් ඉතා ශක්තිමත් අතර ඔබ සෑම කෙනෙක්වම පරීක්ෂා කරන්න බලා සිටිනවා. ඔබට හානි කරන්න හෝ ශුද්ධ කමට යන මාර් ගයේ බාධා කරන්න නොහැකි වන පිණිස යාච්ඤා කරන්න. ප්‍රිය දරුවෙනි යාච්ඤාවෙන් දිනෙන් දින දෙවි වෙතට වර් ධනය වෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1987 ඔක්තෝබර් 25

"මගේ ප්‍රිය දරුවෙනි, අද දින පාරාදීසය වෙනුවෙන් තීරනයක් ගන්නා මෙන් ඔබගෙන් ඉල්ලන්න කැමතියි. දෙවි වෙනුවෙන් තීරණයක් නොගත් අයට එම මාර් ගය අපහසු එකකි. ප්‍රිය දරුවෙනි දෙවි පූර් ණ ලෙස තමා ඔබට ඉදිරිපත් කරමින් සිටින බව වි ශ්වාස කරමින් තීරණය කරන්න. ඔබව ආරාධනා කර ඇති අතර ඔබ මා තුළින් වූ පියාණන්ගේ ඇමතුමට පිළිතුරු දිය යුතුය. යාච්ඤා කරන්න එවි ට යාච්ඤාවෙන් ඔබට පූර් ණ ප්‍රේමය අත් කර ගන්නට හැකි වෙනවා ඇත. මා ඔබට ආශීර් වාද කරන අතර ඔබ සෑම කෙනෙක්ම මාගේ වස්ත්‍රය යට සිටින පිණිස ඔබට උපකාර කරන්නටත් කැමතියි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1987 නොවැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද දිනත් මා ඔබෙන් ඉල්ලා සිටින්නේ ඔබ සියල්ල සම්පූර් ණයෙන්ම මට භාර දෙන්නට තීරණයක් ගන්නා ලෙයසි. ඔබ සෑම කෙනෙක්වම මට දෙවිට ඉදිරිපත් කරන්නට පුළුවන් වෙන්නේ එයාකාරයෙන් පමණි. ප්‍රිය දරුවෙනි ඔබට මා අසීමිතව ප්‍රේම කරන බව ඔබ දන්නා අතර ඔබ සෑම කෙනෙක්වම මට වෙන්කර ගැනීමට මා කැමති බවත් ඔබ දන්නවා. එහෙත් දෙවි ඔබට නිදහස ලබා දී ඇති අතර මා එය ප්‍රේමනීයව ගෞරවයෙන් හා යටහත් පහත් කමින් පිළිගන්නවා. ප්‍රිය දරුවෙනි දෙවි මෙම මීසමේ සැලසුම් කර ඇති සියල්ල ඉටු වන පිණිස ඔබ උපකාර කරනවා නම් මා කැමතියි. ඔබ යාච්ඤා කරන්නේ නැත්නම් ඔබට මාගේ ප්‍රේමයත් දෙවි මෙම මීසම සහ එහි සෑම කෙනෙක් වෙනුවෙනුත් තබා ඇති සැලැස්මත් තේරුම් ගත නොහැකි වනු ඇත. සාතන් තමාගේ උඩගුකමින් හා මායාකාරී ශක්තියෙන් ඔබව නොපොළඹවනු පිණිස යාච්ඤා කරන්න. මා ඔබ සමග සිටින අතර මා ඔබට ප්‍රේම කරන බව ඔබ වි ශ්වාස කරනවාට මා කැමැත්තෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1987 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මා සමග ප්‍රීති වෙන්න. යේසුස් නිසා මාගේ හදවත ප්‍රීතිවෙන අතර අද දින මා කැමතියි ඔහුව ඔබට දෙන්නට. ප්‍රිය දරුවෙනි මා කැමතියි ඔබ සෑම කෙනෙක්ම ඔබගේ හදවත් යේසුස්ට වි වෘත කරනවා නම්. එවි ට මා ප්‍රේමයෙන් ඔහුට ඔබට දෙන්නම්. ප්‍රිය දරුවෙනි මා කැමතියි ඔහු ඔබව වෙනස් කරනවාට. ඒ වගේම ඔබට උගන්වා ඔබව ආරක්ෂා කරනවාට. අද දින මා වි ශේෂාකාරයෙන් ඔබ සෑම කෙනෙක් වෙනුවෙන්ම යාච්ඤා කරන අතර දෙවි ඔබ තුළින් පිළිඹිබු වන පිණිස මා ඔබව දෙවිට ඉදිරිපත් කරනවා. මා ඔබගෙන් ඉල්ලන්නේ ඔබගේ සෑම යාච්ඤාවක්ම දෙවි සමග බන්දනයක් වන පිණිස හෘදයෙන්ම අවංකව යාච්ඤා කරන ලෙයසි. ඔබගේ වැඩ වලදීත් ඔබගේ දෛනික ජීවි තයේදීත් දෙවිව පළමුවන ස්ථානයේ තබන්න. අද මම දැඩිලෙස මට කීකරු වන ලෙසත් මා ඔබට කියන ලෙස කරන ලෙසත් ඉල්ලා සිටිනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

1988

වර් ෂ 1988 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව කැදවන්නේ ආගමට හැරවී ම අවසන් කරවන්නටයි. මෙය දෙවි ව තෝරාගෙන නැති අයට අපහසු දෙයකි. ඔබ ඔහුගෙන් සොයන්නාවූ සෑම දෙයක්ම දෙවිට ලබා දෙන්නට පුළුවන. එහෙත් ඔබ දෙවි ව සොයන්නේ රෝග, ගැටලු හා අපහසුකම් ඔබට ඇති වි ට පමණි. තවද ඔබ දෙවි ඔබගෙන් ඈත්ව සිටින බව, ඔබට සවන් නොදෙන බව හා ඔබගේ යාච්ඤා නොඅසන බව සිතනවා. ප්‍රිය දරුවෙනි, එය සැබෑවක් නොවේ. ඔබ දෙවිගෙන් ඈත්ව සිටින වි ට ඔබ ස්ථිර ඇදහිල්ලකින් අනුග්‍රහයන් නොසොයන බැවි න් ඔබට ඒවා ලබා ගත නොහැකිය. දිනෙන් දින මා ඔබට යාච්ඤා කරනවා. එමෙන්ම ඔබට දෙවි වෙතට ලගා කරවී මට මට අවශ්‍යයි. එහෙත් ඔබට එය එපා නම් මට එය කළ නොහැකිය. එබැවි න් දරුවෙනි, ඔබගේ ජීවි ත දෙවි ගේ අතේ තබන්න. මා ඔබ සියල්ලන්ට ආශීර් වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1988 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබ දෙවි ට සම්පූර් ණයෙන් භාර කිරීම සඳහා යාච්ඤාවට කැඳවමි. මා ඔබට ප්‍රේම කරන බවත් මා ප්‍රේමය නිසා මෙහි පැමිණෙන බවත් ඔබ දන්නවා. එවි ට මට සාමයේ මාවතත් ඔබගේ ආත්ම වෙනුවෙන් ගැලවී මත් ලබා දිය හැකිය. මට ඔනෑ කරන්නේ ඔබ මට කීකරු වී මයි. ඔබගේ යාච්ඤා මට කැප කරන්න. එවි ට සාතන්ගේ බලපෑම යටතේ සිටින අයව ගලවා ගන්නට පුළුවන. ඔබගේ ජීවි තයෙන් සාක්ෂි දරන්න. ලෝකයේ ගැලවී ම සඳහා ඔබගේ දිවි පුදන්න. මා ඔබ සමග සිටින අතර ඔබට කෘතඥ පූර් වක වෙමි. එහෙත් ස්වර් ගයේදී ඔබ ඔබට පොරොන්දු වී ඇති පියානන්ගේ තෑග්ග ලබානවා ඇත. එබැවි න් දරුවෙනි භය නොවන්න. ඔබ යාච්ඤා කලොත් සාතන්ට පොඩ්ඩක්වත් ඔබට හානි කරන්නට බැරිය. හේතුව ඔබ දෙවි ගේ දරුවන් වන අතර ඔහු ඔබව බලා සිටින නිසාය. යාච්ඤා කරන්න ඔබගේ කොන්තය නිතර අතේ තබා ගන්න. එය ඔබ මට අයත් බවට සාතන්ට ලකුණක් වන්නේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1988 මාර් තු 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට කියන්නේ සම්පූර් ණයෙන් දෙවි ට ඔබ භාර කරන්න කියාය. ප්‍රිය දරුවෙනි දෙවි මෙතරම් මහත් ප්‍රේමයකින් ඔබට ප්‍රේම කරන බව ඔබ කල්පනා කරන්නේ නැත. මන්ද ඔහු ඔබට උපදෙස් දෙන්නටත් සාමයේ මාර් ගය සොයා ගන්නට ඔබට උපකාර කරන්නටත් හැකි වන පිණිස මට ඔබ සමග සිටින්නට අවසර දී ඇත. කෙසේ වෙතත් ඔබ යාච්ඤා නොකරන්නේ නම් මෙම මාර් ගය ඔබට සොයා ගත නොහැකිය. එබැවි න් ප්‍රිය දරුවෙනි සියල්ල අත්හැර ඔබගේ කාලය දෙවි ට භාර කරන්න. එවි ට දෙවි ඔබට තෑගී ලබා දී ඔබට ආශීර් වාද කරනවා ඇත. කුඩා දරුවෙනි ඔබගේ ජීවි ත අද දින ඉතා ලස්සනව පවතින මලක් ලබ අමතක නොකරන්න. එහෙත් එය හෙට පරවනු ඇත. එබැවි න් ඔබගේ යාච්ඤාවත් දෙවි ට ඔබගේ කැපවී මත් මාර් ග ෂලකුණක් මෙන් වන පිණිස යාච්ඤා කරන්න. එයාකාරයෙන් ඔබගේ සාක්ෂිය ඔබට පමණක් නොව සදාකාලයටම වටිනා යමක් වනු ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1988 අප්‍රෙල් 25

"ප්‍රිය දරුවෙනි, ඔබව ශුද්ධවත් කරන්නට දෙවි ට ඔනෑ වී ඇත. එබැවි න් මා තුලින් ඔහු ඉල්ලා සිටින්නේ සම්පූර් ණයෙන් භාර වෙන ලෙයසි. ඔබගේ ජීවි තය ශුද්ධ පූජාවක් වේවා. පල්ලිය දෙවි ගේ මාලිගාව බවත් එහි මා ඔබව එකතු කරන බව හා දෙවිට යන මාර් ගය පෙන්වන බව මතක තබා ගන්න. පැමිණ යාච්ඤා කරන්න. අනුන් දිහා නොබලන්න ඔවුන්ට අපහාස නොකරන්න. ඒ වෙනුවට ඔබගේ ජීවි තය ශුද්ධකමේ සාක්ෂියක් වේවා. පල්ලිවලට ගෞරවය අවශ්‍යයි. ඒවා ශුද්ධයි. මන්දයත් මනුෂ්‍යයා වූ දෙවි ඒවායේ දිවා රාත්‍රී වාසය කළ නිසාය. එබැවි න් ප්‍රිය දරුවෙනි පියානන් ඔබගේ ඇදහිල්ල වැඩිකරනු පිණිස වි ශ්වාස කර යාච්ඤා කර පසුව ඔබට අවශ්‍ය දේ ඉල්ලන්න. මා ඔබ සමග සිටින අතර මා ඔබගේ හැරීම ගැන ප්‍රීතිමත් වෙනවා. එමෙන්ම මා මාතෘ වස්ත්‍රයෙන් ඔබව ආරක්ෂා කරනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1988 මැයි 25

"ප්‍රිය දරුවෙනි, මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ දෙවි ට සම්පූර් ණයෙන් කැප කරන ලෙයසි. සුලගට වැනෙන අතු මෙන් ඔබව නොගෙන යනු පිණිස ප්‍රිය දරුවෙනි යාච්ඤා කරන්න. දෙවි තුළ ශක්තිමත්ව සිටින්න. ඔබ තුළින් ප්‍රීතියේ දෙවි ව ලෝකය හඳු නා ගන්නා පිණිස මා කැමතිවෙමි. ඔබගේ ජීවි තයෙන් දෙවි ගේ ප්‍රීතිය පිලිබඳව සාක්සි දරන්න. කනස්සල්ලෙන් සිටින්න හෝ කරදර වෙන්න එපා. දෙවි ම ඔබට උපකාර කර මාර් ගය පෙන්වනවා ඇත. මාගේ ප්‍රේමයෙන් ඔබ සියලු මිනිසුන්ට ප්‍රේම කරනවාට මම කැමැත්තෙමි. ප්‍රේමයට ලොව

පාලනය කළ හැක්කේ එයාකාරයෙන් පමණි. කුඩා දරුවෙනි ඔබ මාගේය. සාතන් ඔබගෙන් ප්‍රයෝජන නොගන්නා පිණිස මා ඔබට ප්‍රේම කරමි. ඔබ මගේ වී ම පිලිබඳ දැනුමට යාච්ඤා කරන්න. ප්‍රීතියේ ආශීර් වාදයන්ගෙන් මා ඔබට ආශීර් වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1988 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, මා ඔබව කැඳවන්නේ දෙවිට පක්ෂපාත හා ප්‍රසන්න ප්‍රේමයක් පෙන්වී මටයි. කුඩා දරුවෙනි, ප්‍රේමය ව සිටින යේසුස් වෙනුවෙන් ප්‍රේමය තිත්ත මෙන්ම අපහසු සියල්ල දරා ගන්නේය. එබැවි න් දරුවෙනි දෙවි ඔබගේ උපකාරයට පැමිනීම සඳහා, ඔබගේ ආශාව අනුව නොව ඔහුගේ ප්‍රේමයට අනුව පැමිනීම සඳහා යාච්ඤා කරන්න. ඔබ තුළ ප්‍රේමයේ මාවතට බාධාවක් ව පවතින සියල්ල සමා කර දෙවි ඔබව සුව කර ඔබව සනසන පිණිස ඔබව ඔහුට භාර කරන්න. මෙයාකාරයෙන් දෙවිට ඔබගේ ජීවි තය වෙනස් කළ හැකි අතර ඔබ ප්‍රේමයෙන් වර් ධනය වෙනු ඇත. ප්‍රිය දරුවෙනි, දෙවිගේ ප්‍රේමය ඔබ තුළ දිනෙන් දින සම්පූර් ණයෙන් වර් ධනය වන පිණිස ප්‍රේමයේ ගීතිකාවකින් දෙවිව මහිමවත් කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1988 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, අද දින දෙවිට ඔබව සම්පූර් ණයෙන් භාර කරන්නට ඔබව කැඳවමි. ඔබ සතු සියල්ලේ රජ හැටියට දෙවි ඔබගේ ජීවි තය පාලනය කරන පිණිස ඔහු කරන සියල්ල හා ඔබට ඇති සියල්ල ඔහුට භාර කරන්න. එයාකාරයෙන් මා තුලින් දෙවිට ඔබව ආත්මික ජීවි තයේ ගැඹුරට මග පෙන්වන්නට පුළුවන. කුඩා දරුවෙනි, භය නොවන්න. මන්ද ගැලවී මට මගක් නැතැයිද සාතන් පූර් ණ පාලනයේ සිටින්නේ යයි ඔබ සිතුවත් මම ඔබ සමග සිටිමි. මම ඔබගේ මව. මම ඔබට සාමය ගෙනෙන්නෙමි. සාමයේ රැජින වෙමි. දෙවි ඔබගේ ජීවි තයේ සියල්ල වන පිණිස මම ඔබව ප්‍රීතියේ ආශීර් වාදයෙන් ආශීර් වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1988 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, අද දින දෙවි ඔබට දෙන ජීවි තයෙන් සතුටු වන්නට ඔබව කැඳවමි. කුඩා දරුවෙනි, මැවුම්කරු වන දෙවි තුළ සතුටු වන්න. මන්දයත් ඔහු ඔබව ඉතා පුදු ම සහගත ලෙස මවා ඇත. ඔබගේ ජීවි තය සන්තෝෂයේ ගංගාවක් මෙන් හෘදයෙන්ම ගලන්නාවූ ස්තූතියක් වන්නට යාච්ඤා කරන්න. කුඩා දරුවෙනි, ඔබට ඇති සියල්ල වෙනුවෙන් දෙවි ඔබට දී ඇති ඉතා කුඩා දෙය සඳහාත් නොනැවතී ස්තූතිය දෙන්න. එවි ට ප්‍රීතිමත් ආශීර් වාදයක් දෙවිගෙන් ඔබගේ ජීවි තයට ලැබෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1988 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද දින කිසි වෙනසක් නැතිව ඔබගේ ජීවි තයේ ශුද්ධකමේ මාර් ගය වෙතට ඔබව කැඳවමි. දෙවි ඔබට ශුද්ධකමේ ත්‍යාගය වන අනුග්‍රහය ලබා දී ඇත. ඔබ එය තබා ගැනීමටත් එයාකාරයෙන් ඔබගේ ජීවි තය තුලින් දෙවිට සාක්ෂිදැරීමටත් හැකිවන පිණිස යාච්ඤා කරමි. ප්‍රිය දරුවෙනි මා ඔබට ආශීර් වාද කරන අතර ඔබගේ මාර් ගය හා සාක්ෂිය සම්පූර් ණ මෙන්ම ප්‍රීතිමත් එකක් වනු පිණිස මා දෙවිට මැදිහත්කම් කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1988 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, මා ඔබට දෙන පණිවුඩ දෛනික එකක්. මා එසේ කරන්නේ ඔබව යේසුස්ගේ හෘදයට ලං කරවී මට මට උවමනා නිසාය. එබැවි න් කුඩා දරුවෙනි, ඔබ සෑම කෙනෙක්ම යේසුස්ගේ වන පිනිස මගේ පුත් යේසුස්ට කැප වී මට යාච්ඤා කරන ලෙස මා අද දින ඔබව කැදවමි. එමෙන්ම මාගේ පිරිසිදු හෘදයට කැප වන්නටද කැදවමි. ඔබ දෙමව්පියන් හැටියට, පවුල් හැටියට හා මීසම්වාසීන් හැටියට මගේ හෘදය තුළින් දෙවි ට අයත් වන්නට කැප වන්නට ආරාධනා කරමි. එබැවි න් මා ඔබට දෙන මෙම මහත් පණිවුඩයට අනුකූල වන ලෙස යාච්ඤා කරමි. මට කිසිවක් මා වෙනුවෙන් අවශ්‍ය නැත. අවශ්‍ය වන්නේ ඔබගේ ආත්මවල ගැලවී ම උදෙසාය. සාතන් ශක්තිමත් බැවි න් කුඩා දරුවෙනි ඔබ අකණ්ඩ යාච්ඤාවෙන් මගේ මාතෘ හෘදයට තදින් ඇලෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1988 නොවැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මම ඔබව යාච්ඤාවට කැදවමි. එසේ දෙවි සමග සම්බන්ධ වන්න. දෙවි තමාව ඔබට දෙන්නේය. එහෙත් ඔහුට උවමනා වන්නේ ඔබ නිදහසේම ඔහුගේ ආරාධනාවට අනුකූල වී මය. දවස තුළ සාමයෙන් හා යටහත් භාවයෙන් යාච්ඤා කිරීමට ඔබ කාලය සොයා ගත යුත්තේ එනිසාය. එසේ ඔබට මැවුම්කරු වන දෙවි සමග සම්බන්ධ වන්නට පුළුවන. මම ඔබ සමග සිටින අතර දෙවි ඉදිරියේ ඔබ වෙනුවෙන් මැදිහත්කම් කරන්නෙමි. එනිසා උද්‍යෝගයෙන් සිටින්න. එවි ට යාච්ඤාවෙන් ඇති වන සෑම බන්ධනයක්ම දෙවි සමග සම්බන්ධතාවයේ ප්‍රීතියක් වනු ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1988 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මම ඔබව සාමයට කැදවමි. එය ඔබගේ හෘදයේ හා ඔබ අවට සැම සමග ගත කරන්න. එවි ට සියල්ලන්ට සාමය දැනෙනවා ඇත. සාමය එන්නේ ඔබගෙන් නොව දෙවිගෙන්ය. කුඩා දරුවෙනි අද මහත් දවසක්. මා සමග සතුටු වන්න. මා ඔබට දෙන සාමය තුළින් යේසුස්ව මහිමවත් කරන්න. මා සාමයේ රැජින හැටියටත් ඔබගේ මව හැටියටත් පැමිණ ඇත්තේ මෙම සාමය උදෙසාය. අද දින මම මගේ වි ශේෂිත ආශීර් වාදය ඔබට දෙමි. එය සියලු මැවි ලි වෙතට ගෙන යන්න. එවි ට සියලු මැවි ලි සාමය දැන ගන්නවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

1989

වර් ෂ 1989 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව ශුද්ධකමේ මාර් ගයට කැදවමි. දෙවි තමාව වි ශේෂිත ආකාරයට ඔබට එළිදරව් කරන මෙම මාර් ගයේ ලස්සන හා උතුම්කමට ඔබ අනුකූල වන පිනිස යාච්ඤා කරන්න. දෙවි ඔබ තුළින් කරන සියල්ලට ඔබ වි වෘත වන පිනිස යාච්ඤා කරන්න. එසේ ඔබගේ ජීවි තයේදී ඔබට දෙවිට ස්තූති කරන්නට පුළුවන් වන්නේය. එමගින් සෑම පුද්ගලයෙක් තුළින්ම ඔහු සිදු කරන සියල්ල පිළිබඳව ෂතුටු වන්නටද හැක්කේය. මා ඔබට මාගේ ආශීර් වාදය දෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1989 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා හෘදයේ යාච්ඤාවට ඔබව කැදවමි. මෙම අනුග්‍රහයේ කාලය පුරා ඔබ සෑම කෙනෙක්ම යේසුස් සමග එකතු වෙනවාට කැමැත්තෙමි. එහෙත් යාච්ඤාව නොමැතිව ඔබට ඔබව ඔප්පු කළ නොහැකිය. එබැවි න් දරුවෙනි සෑම වි ටම කුඩාම

යාච්ඤාවෙන්වත් ඔබගේ හෘදය පුරාවා ගන්න. මා ඔබ සමග සිටින අතර මට දෙන ලද සෑම හෘදයක් ගැනම නොනැවතී බලා සිටිමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1989 මාර්තු 25

"ප්‍රිය දරුවෙනි, මා දෙවිට පූර්ණ කැප වී මක් කරන ලෙස ඔබව කැඳවමි. මා ඔබව මහත් ප්‍රීතියක් හා සාමයක් සඳහා කැඳවමි. එය දිය හැක්කේ දෙවිට පමණි. මා ඔබ සමග සිටින අතර ඔබ වෙනුවෙන් දෙවි ඉදිරියේ අතර මැදිව සිටිමි. කුඩා දරුවෙනි මගේ පණිවුඩයට සවන් දීමටත් ඒ අනුව ජීවත් වි මටත් ඔබව කැඳවමි. දැනටමත් වසර ගණනාවක් පුරා ඔබව ශුද්ධත්වයට කැඳවා තිබුණත් ඔබ තවමත්
දු රස්ව සිටිනවා. මා ඔබට
ආශීර්වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1989 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, ඔබව දෙවිට පූර්ණ කැප වී මක් කරන ලෙස මා ඔබව කැඳවමි. ඔබ සතු සියල්ල දෙවිගේ හස්තයේ තිබේවා. ඔබට ඔබගේ හෘදයේ ප්‍රීතිය තබා ගත හැක්කේ එයාකාරයෙන් පමණි. කුඩා දරුවෙනි ඔබට ඇති සියල්ලෙන් සතුටු වන්න. ඒ සියල්ල ඔබට දෙන ලද දෙවිගේ තෑගි වන බැවි න් ඔහුට ස්තූති කරන්න. එයාකාරයෙන් ඔබට සියල්ල වෙනුවෙන් ඔබට ස්තූති දිය හැකි වන අතර කුඩා මලෙහි පවා දෙවිව සොයා ගැනීමට හැකි වන්නේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1989 මැයි 25

"ප්‍රිය දරුවෙනි, මා දැන් ඔබව දෙවිට වි වෘත වන්නට ඔබව කැඳවමි. ස්වභාව ධර්මය තමාව වි වෘත කර ජීවි තය හා පළ දෙන ආකාරය දරුවනි බලන්න. එයාකාරයෙන්ම දෙවි සමග ජීවත් වන්නට හා ඔබව සම්පූර්ණයෙන් කැප කරන්නට මා ඔබව කැඳවමි. මා ඔබ සමග සිටින අතර ඔබව දිගටම ජීවි තයේ ප්‍රීතියට
හඳු න්වා දෙන්නට කැමැත්තෙමි.
සෑම කෙනෙක්ම දෙවි තුළ පමණක් සොයා ගත හැකි එමෙන්ම දෙවි ට පමණක් දිය හැකි ප්‍රීතිය හා ප්‍රේමය සොයා ගැනීම මා ආශා කරමි. දෙවි ට ඔබගෙන් කිසිවක් අවශ්‍ය නැත. ඔබගේ කැපවී ම පමණකි ඔනෑ කරන්නේ. අන් සියල්ල නැති වී යන බැවි න් දැඩිතීරණයක් ගන්න. නැති වී යන්නේ දෙවි පමණකි. දෙවි ඔබට ලබා දෙන ජීවි තයේ ප්‍රීතිය සොයා ගැනීමට හැකි වන පිණිස යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1989 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, පසු ගිය වසර අට පුරා මා ඔබට
දු න් පණිවුඩ අනුව ජීවත්
වන්නට මා අද ඔබව කැඳවමි. මෙය අනුග්‍රහයේ කාලය වන අතර දෙවි ගේ අනුග්‍රහය ඔබ සෑම කෙනෙක්ටම ලැබීම මා ආශා කරමි. මා ඔබට ආශීර්වාද කරන අතර වි ශේෂ ප්‍රේමයකින් මා ඔබට ප්‍රේම කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1989 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, අද දින ඔබගේ හෘදයන් අලුත් කරන්නට මා ඔබව කැඳවමි. ඔබගේ හෘදයන් වි වෘත කර ඔබගේ සියලු
දු ෂ්කරතා හා කුරුසියන් දෙවිට
භාර කරන්න. දෙවි සියල්ල ප්‍රීතියක් බවට මාරු කරනවා ඇත. කුඩා දරුවනි ඔබ යාච්ඤා නොකර ඔබට ඔබව දෙවිට වි වෘත කරන්නට බැරිය. එබැවි න් අද දින සිට දවසේ වේලාවක්

වෙන් කරන්නට තීරණය කරන්න. කුඩා දරුවනි මා ඔබට බල කරන්නට කැමති නැහැ. ඒ වෙනුවට දෙවිගේ දරුවන් මෙන් නිදහස්ව කාලය දෙවි  ට දෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි."

වර් ෂ 1989 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, ඔබව යාච්ඤාවට කැඳවමි. යාච්ඤාවෙන් කුඩා දරුවෙනි ඔබ ප්‍රීතිය හා සාමය ලබන්නේය. යාච්ඤාවෙන් ඔබ දෙවි  ගේ අනුකම්පාවෙන් පොහොසත් වන්නේය. එබැවි  න් කුඩා දරුවෙනි යාච්ඤාව ඔබ සෑම කෙනෙකුගේම ජීවි  තය වේවා. වි  ශේෂයෙන් මා යාච්ඤාවට කැඳවන්නේ දෙවි  ගෙන් ඈත්ව සිටින සියල්ලන්ම හැරෙන පිණිසය. එවි  ට දෙවි   සියල්ලන්ගේ හෘදයන්හි පාලනය කරන නිසා අපගේ හෘදයන් ධනවත් වන්නේය. එබැවි  න් කුඩා දරුවෙනි යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤාව මුළු ලොකයම පාලනය කරාවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි."

වර් ෂ 1989 සැප්තැම්බර්  25

"ප්‍රිය දරුවෙනි, ඔබගේ ජීවි  තය පුරා ඔබ සොයාගෙන ඇති සියලුම තෑගි වෙනුවෙන් ඔබ කල්පනා කර ඇති කුඩා ම තෑග්ගට පවා දෙවි  ට ස්තූති කරන්නට මා අද ඔබව කැඳවමි. මාද ඔබ සමග ස්තූතිය දෙන අතර මෙම තෑගිවල ප්‍රීතිය අද්දකිනවාට කැමැත්තෙමි. එමෙන්ම ඔබ සෑම කෙනෙකුටම දෙවි   සියල්ල වී  ම මා කැමැත්තෙමි. එවි  ට කුඩා දරුවෙනි ඔබට ශුද්ධකමේ මාර් ගයේ දිගටම වැඩෙන්නට පුළුවන. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි."

වර් ෂ 1989 ඔක්තෝබර්  25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව යාච්ඤාවට කැඳවමි. මා ඔබව නිතර කැඳෙව්වත් ඔබ දු                                                                 රස්ව සිටින්නෙහිය. එබැවි  න් අද දින සිට කාලය දෙවි  ට වෙන් කරන්නට දැඩිතීරණයක් ගන්න. මා ඔබ සමග සිටින අතර හෘදයෙන් යාච්ඤා කරන්නට උගන්වන්නට කැමැත්තෙමි. හෘදයෙන් යාච්ඤාවේදී ඔබට දෙවි  ව හමු වෙනවා ඇත. එබැවි  න් කුඩා දරුවෙනි යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි."

වර් ෂ 1989 නොවැම්බර්  25

"ප්‍රිය දරුවෙනි, මා ඔබට ලබා දෙන පණිවුඩ මගින් වසර ගණනාවක් පුරා ඔබට ඇරයුම් කර ඇත්තෙමි. කුඩා දරුවෙනි මුල් ප්‍රතිරූපය මෙන් ඔබව දෙවි  ට ඔප්පු කරනු පිණිස මෙම පණිවුඩ මගින් මා ඔබව හෘදයන්හි වඩාත් ලස්සන කරන්නට බලාපොරොත්තු වෙමි. එබැවි  න් කුඩා දරුවෙනි ඔබගේ තීරණය දෙවි   ඉදිරියේ නිදහස්ව තිබෙනවාට කැමැත්තෙමි. මන්ද ඔහු ඔබට නිදහස දී ඇත. එබැවි  න් සාතන්ගෙන් කිසියම් බලපෑමකින් තොරව අප දෙවි   වෙනුවෙන් තීරණයක් ගනු පිණිස යාච්ඤා කරන්න. මා ඔබ වෙනුවෙන් දෙවි   ඉදිරියේ යාච්ඤා කරමි. ඔබ දෙවි   ඉදිරියේ කැප වී  ම බලාපොරොත්තු වෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි."

වර් ෂ 1989 දෙසැම්බර්  25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව මගේ මාතෘ ආශීර් වාදයෙන් වි  ශේෂිත ආකාරයට ආශීර් වාද කරමි. දෙවි   ඔබට හෘදයේ වෙනස් වී  මේ තෑග්ග දෙන පිනිස දෙවි   ඉදිරියේ ඔබ වෙනුවෙන් අතර මැදිකම් කරමි. වසර ගණනාවක් පුරා ඔබව කැඳවමින් ආත්මික ජීවි  තයකට අවවාද දු                                                                 න්නත් ඔබ සීතලව සිටින්නහුය. එබැවි  න් කුඩා දරුවෙනි මා ඔබට දී ඇති පණිවුඩ සෑම දිනකම කියවන්න. ඒවා

ජීවි තයට අදාල කර ගන්න. මා ඔබට ප්‍රේම කරන අතර දෙවි සමග ගැලවී මේ මාර් ගයට ඔබ සෑම කෙනෙක්වම කැදවමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

1990

වර් ෂ 1990 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා නැවතත් දෙවි වෙනුවෙන් තීරණයක් ගැනීමටත් ඔහුව අන් සියල්ලට වඩා හා ඉහලින් තෝරා ගැනීමටත් කැදවමි. එවි ට ඔහු ඔබගේ ජීවි තයේ ආශ්චර් යයන් සිදු කරන අතර ඔබගේ ජීවි තය ඔහු සමග දිනෙන් දින ප්‍රීතිමත් වෙනවා ඇත. එබැවි න් දරුවෙනි, යාච්ඤා කරන්න. එකිනෙකා පිළිබද වරදවා වටහාගැනීම්, තේරුම් නොගැනීම් හා නොපිළිගැනීම් මගින් සාතන්ට ඔබගේ ජීවි තයේ ක්‍රියා කරන්නට ඉඩ නොදෙන්න. ජීවි ත දීමනාවේ ලස්සන හා මහත්කම වටහා ගැනීමට ඔබට හැකිවන පිණිස යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1990 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, දෙවි ට කැප වී මට මා ඔබට ආරාධනා කරමි. මෙම කාලයේ ඔබ බැඳී සිටින සියලු දේවල් මෙන්ම ඔබගේ ආත්මික ජීවි තයට හානි කරන දෑ අත් හැරීම මට වි ශේෂයෙන් ඔබගෙන් උවමනා කර ඇත. එබැවි න් කුඩා දරුවෙනි, සම්පූර් ණයෙන් දෙවි වෙනුවෙන් තීරණයක් ගන්න. ඔබටත් ඔබගේ ආත්මික ජීවි තයටත් යන දෙකටම හානි කරන දේවල් තුළින් ඔබගේ ජීවි තයට පැමිණෙන්නට සාතන්ට ඉඩ නොහරින්න. කුඩා දරුවෙනි, දෙවි තමාව පූර් ණව ඔප්පු කරමින් සිටින අතර ඔබට ඔහුට සොයා ගත හැක්කේ යාච්ඤාවෙන් පමණි. එබැවි න් යාච්ඤාව සදහාප තීරණයක් ගන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1990 මාර් තු 25

"ප්‍රිය දරුවෙනි, ඔබ ඒ පිලිබදව තේරුම් නැතිව සිටියත් මා ඔබ සමග සිටිමි. සාතන් ඔබට ඉදිරිපත් කරන සියල්ලෙන් ඔබට ආරක්ෂා කිරීමට මට උවමනා වී ඇත. ඔහුට එමගින් ඔබව වි නාශ කිරීමට උවමනා කර ඇත. මා යේසුස්ව මාගේ කුසේ දැරුවාක් මෙන් කුඩා දරුවෙනි ඔබවත් ශුද්ධකමට දරාගෙන යාමට මා කැමැත්තෙමි. ඔබට ගලවා ගැනීමට දෙවි ට උවමනා වී ඇති අතර පණිවුඩ මිනිසුන්, ස්වභාව ධර් මය, සහ වෙනත් බොහෝ දේ වලින් එවන අතර ඔබ ජීවි තය වෙනස් කළ යුතු බව තේරුම් ගැනීමට එමගින් උපකාරවත් වන්නේය. එබැවි න් කුඩා දරුවෙනි, දෙවි මා තුළින් දෙන දීමනාවේ මහත්කම තේරුම් ගන්න. එවි ට මගේ වස්ත්‍රයෙන් මට ඔබව ආරක්ෂා කර ජීවි තයේ ප්‍රීතියට මගපෙන්වන්නට පුළුවන. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1990 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව කැදවන්නේ මා දෙන පණිවුඩ බරපතළ ලෙස සලකා ඒ අනුව ජීවත් වෙන්නටයි. මා ඔබ සමග සිටින අතර ප්‍රිය දරුවෙනි ඔබ සෑම කෙනෙක්ම මාගේ හදවතට කිට්ටුවෙන් සැමදා සිටීම මාගේ ආශාවයි. එබැවි න් ප්‍රිය දරුවෙනි, ශුද්ධකමේ මාර් ගය සොයා සදාකාලයටම එහි වර් ධනය වෙන්න. මා ඔබ වෙනුවෙන් යාච්ඤා කරමින් ඔබ සමග මට සිටින්නට දෙවි මට දෙන්නාවූ මහත් වූ මෙම දීමනාව තේරුම් ගැනීමට හැකි වන පිණිස දෙවිට මැදිහත්කම් කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1990 මැයි 25

"ප්‍රිය දරුවෙනි, මෙම නුවානයේ වගකීමෙන් කටයුතු කරන ලෙස ඉල්ලන්නට කැමැත්තෙමි. යාච්ඤා හා යාගයන්ට කාලය වෙන් කරන්න. මා ඔබ සමග සිටින අතර ඔබව පරිත්‍යාගශීලී හා යටහත්පහත් භාවයට වර් ධනය වන්නට උපකාර කරන්නට කැමැත්තෙමි. එලෙසින් වි ශේෂිත ආකාරයකට සිය ජීවි ත මට දෙන්නා වූ අයගේ ජීවි තයේ අලංකාරය ඔබට දැකගත හැකි වනු ඇත. ප්‍රිය දරුවෙනි දෙවි ඔබට දිනෙන් දින ප්‍රේම කරන අතර ඔබගේ ජීවි තයේ වෙනසක් ආශාවෙන් සිටින්නේය. එබැවි න් ඔබගේ ජීවි තයේ වෙනසක් කරන්නට ඔබට ශක්තිය ලැබෙන පිණිස යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1990 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, අද දින ඔබගේ සියලු යාග හා යාච්ඤාවන්ට ඔබට ස්තූති කරන්නට කැමැත්තෙමි. මම ඔබට මාගේ වි ශේෂිත වූ මාතෘ ආශීර් වාදයෙන් ආශීර් වාද කරමි. දිනෙන් දින යාච්ඤාවෙන් දෙවි ගේ කැමැත්ත ඔබට සොයා ගත හැකි වන පිණිස දෙවි වෙනුවෙන් තීරණයක් ගැනීමට ඔබට ආරාධනා කරමි. ඔබගේ හෘදයෙහි ප්‍රීතිය පවතින පිණිස ප්‍රිය දරුවෙනි පූර් ණ පරිවර් තනයක් කරන්නට ඔබව කැඳවන්නට කැමැත්තෙමි. ඔබ මහත් සංඛ්‍යාවෙන් මෙහි අද පැමිණ සිටීම ගැන මම සතුටු වෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1990 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, අද ඔබව සාමයට කැඳවමි. මා අද සාමයේ රැජින ලෙස මෙහි පැමිණ සිටින අතර මගේ මාතෘ සාමයෙන් ඔබව පොහොසත් කරන්නට කැමැත්තෙමි. ප්‍රිය දරුවෙනි මා ඔබට ප්‍රේම කරමි. දෙවි පමණක් දෙන සාමයට ඔබ සියල්ලන්ව රැගෙන යාමට මා බලාපොරොත්තු වන අතර එය සෑම හෘදයක්ම පොහොසත් කරන්නේය. ඔබ මෙම අසමගියෙන් යුත් ලෝකයට මාගේ සාමය ගෙන යනන්නාවූ සාක්ෂිකරුවන් වී මට මම ආරාධනා කරමි. සාමය ගැන බලාසිටින්නාවූද සාමයෙන් තොර වූද මෙම මුළු ලෝකයේ සාමය රජ කරාවා. මම මගේ මාතෘ ආශීර් වාදයෙන් ඔබට ආශීර් වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1990 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, මම ඔබට දෙන්නාවූ පණිවුඩ වැදගත් කොට සලකමින් එය ක්‍රියාවට නගන ලෙස ඔබට ආරාධනා කරන්නට කැමැත්තෙමි. කුඩා දරුවෙනි මා ඔබ සමග සිටින බවත් එම මාර් ගයේම ඔබව ස්වර් ගයට මග පෙන්වන්නට කැමති බවත් ඔබ දන්නෙහිය. එය යාච්ඤාවෙන් සොයා ගන්නාවූ අයට ඉතා ලස්සන එකකි. එබැවි න් කුඩා දරුවෙනි මා ඔබට දෙන පණිවුඩ ඔබගේ ජීවි තවලට අදාල කර ගත යුතු බව අමතක නොකරන්න. එවි ට ඔබට මම එම පනිවුඩ පිලිගෙන ඒ අනුව ජීවත් වෙන්නට වෑයම් කළෙමි යයි කියන්නට පුළුවන් වන්නේය. ප්‍රිය දරුවෙනි මම මගේම යාච්ඤාවෙන් ස්වර් ගීය පියානන් ඉදිරියේ ඔබව ආරක්ෂා කරමින් සිටින්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1990 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, ඔබගේ යාච්ඤා දෙවි සමග සංවාදයක් වන පිණිස හෘදයෙන් යාච්ඤා කරන්නට ආරාධනා කරමි. ඔබ සෑම කෙනෙක්ම වැඩිකාලයක් දෙවි ට කැප කරනවාට මා කැමැත්තෙමි. සාතන් ශක්තිමත්ය. දරුවෙනි ඔබගේ ජීවි ත ඔබටත් ඔබට හමුවන සියල්ලන්ටත් යහපත් වන පිණිස දිනපතා යාච්ඤා කරන්න. මම ඔබ සමග සිටිමි. සාතන් මගේ සැලසුම් මෙතැන ස්වර් ගීය පියාණන්ට කරන්නට ඇති සැලසුම් වි නාශ කරන්නට වෑයම් කළත් මම ඔබව ආරක්ෂා කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1990 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, ලෝකයේ සාමය පිනිස ඔබ යාග හා යහපත් ක්‍රියා ඔප්පු කරමින් ශුවි ශේෂි ආකාරයකට යාච්ඤා කරනවාට කැමැත්තෙමි. සාතන් ශක්තිමත්ව සිටින අතර ඔහුගේ මුළු ශක්තියෙන් දෙවි ගෙන් පැමිණෙන සාමය වි නාශ කරන්නට කැමැත්තෙන් සිටින්නේය. එබැවි න් ප්‍රිය දරුවෙනි මා සමග සාමය උදෙසා සුවි ශේෂිත ආකාරයකට යාච්ඤා කරන්න. මා ඔබ සමග සිටින අතර මගේ යාච්ඤාවලින්"ඔබට වි ශේෂිත ආකාරයකට උපකාර කර සාමයේ මාවතේ මගපෙන්නන්නට කැමැත්තෙමි. මම මාගේ මාතෘ ආශීර්වාදයෙන් ඔබට ආශීර්වාද කරමි. සාමයේ පනිවුඩ අනුව ජීවත් වෙන්නට අමතක නොකරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1990 නොවැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ප්‍රේමයෙන් අනුකම්පාවේ ක්‍රීයාවන් කරන්නට ඔබට ආරාධනා කරමි. මටත් මගේ මෙන්ම ඔබගේ සහෝදර සහෝදරියන්ටත් ඇති ප්‍රේමය නිසා එසේ කරන්න. ප්‍රිය දරුවෙනි ඔබ අන් සියල්ලන්ට කරන සියල්ල ප්‍රීතියෙන් හා දෙවි කෙරෙහි යටහත් පහත් කමෙන් එසේ කරන්න. මා ඔබ සමග සිටින අතර දිනෙන් දින ලෝකයේ ගැලවී ම සඳහා වූ ඔබගේ යාග හා යාච්ඤා දෙවි ට ඔප්පු කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1990 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා වි ශේෂිත ආකාරයකට සාමය උදෙසා යාච්ඤා කරන්නට ආරාධනා කරමි. ප්‍රිය දරුවෙනි සාමය නොමැතිව ඔබට කුඩා යේසුස්ගේ උපත අද කහෝ ඔබගේ දෛනික ජීවි තයේ අද්දකින්නට නුපුළුවන. එබැවි න් සාමයේ ස්වාමීන් සිය සලුවෙන් ඔබව ආරක්ෂා කරන පිනිස යාච්ඤා කරන්න. එසේ ඔහු සාමයේ උතුම්කම හා වැදගත්කම ඔබගේ හෘදයේ තේරුම් ගැනීමට උපකාර කරනවා ඇත. මෙයාකාරයෙන් ඔබට සාමය ලොව පුරා ඔබගේ හෘදයෙන් පතුරුවා ලීමට හැකිවන්නේය. මා ඔබ සමග සිටින අතර ඔබ වෙනුවෙන් දෙවි ඉදිරියේ අතර මැදිව සිටිමි. සාතන්ට සාමය සඳහා වූ මගේ සැලසුම් වි නාශ කරන්නට උවමනා වී ඇති බැවි නී යාච්ඤා කරන්න. එකිනෙකා සමග සමගියෙන් සිටින්න. ඔබගේ ජීවි ත මගින් මුළු ලෝකයේම සාමය රජයන්නට උපකාර කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

1991

වර්ෂ 1991 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද දින පෙර කවරදාකටත් වැඩියෙන් ඔබව යාච්ඤාවට කැඳවමි. ඔබගේ යාච්ඤාව සාමය සඳහා වූ යාච්ඤාවක් වේවා. සාතන් ශක්තිමත්ව සිටින අතර මනුෂ්‍ය ජීවි තය පමණක් නොව ස්වභාවධර්මයත් අප ජීවත් ග්‍රහලෝකයත් වි නාශ කරන්නට ආශාවෙන් සිටියි. එබැවි න් දෙවි ගේ සාමය සඳහා වූ ආශීර්වාදයෙන් ඔබට ඔබව ආරක්ෂා කර ගත හැකි වන පිණිස ප්‍රිය දරුවෙනි යාච්ඤා කරන්න. දෙවි මාව ඔබ අතරට එවා ඇත්තේ මා ඔබව ආරක්ෂා කරන පිණිසය. ඔබ එයට කැමැත්තේ නම් කොන්තය අතට ගන්න. කොන්තයට පවා ලෝකයේ හා ඔබගේ ජීවි තවල ආශ්වර්යයන් කළ හැකිය. මා ඔබට ආශීර්වාද කරන අතර දෙවි ගේ කැමැත්තේ පමණට ඔබ සමග සිටිමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1991 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද දින දෙවි වෙනුවෙන් තීරණයක් ගැනීමට මම ඔබට කියමි. මන්දයත් දෙවි ගෙන් ඈත් වී ම ඔබගේ හෘදයේ සාමය අඩු වී මට හේතුවන නිසාය. දෙවි සාමය

වන්නේය. එබැවි න් ඔබගේ පෞද්ගලික යාච්ඤාවෙන් ඔහු වෙතට ලගා වී ඔබගේ හෘදයේ සාමයෙන් ජීවත් වෙන්න. එයාකාරයෙන් ඔබගේ හෘදයන්ගෙන් සාමය ගංගාවක් මෙන් මුළු ලෝකය තුළට ගලා යනු ඇත. සාමය ගැන කථා නොකර සාමයෙන් ක්‍රියා කරන්න. මම ඔබ සෑම කෙනෙකුටත් ඔබගේ සෑම තීරණයකටත් ආශීර්වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1991 මාර්තු 25

"ප්‍රිය දරුවෙනි, අද දින යාච්ඤාව තුළින් යේසුස්ගේ අනුග්‍රහයෙන් හා ඔහුගේ එක්සත්කමෙන් ජීවත් වන්නට මම ඔබට ආරාධනා කරමි. මෙම අනුග්‍රහයේ දවස් ඔබට ලබා දු න් දෙවි ට වැඩිකාලයක් දෙන්නට තීරනය කරන්න. එබැවි න් ප්‍රිය දරුවෙනි යාච්ඤා කර ඔබගේ හෘදයන්හි යේසුස් සදහා ඇති ප්‍රේමය වි ශේෂ ආකාරයකින් අලුත් කර ගන්න. මම ඔබ සමග සිටින අතර මම මගේ ආශීර්වාදයන්ගෙන් හා යාච්ඤාවන්ගෙන් ඔබ කැටුව සිටිමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1991 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, අද දින ඔබගේ යාච්ඤා හෘදයේ යාච්ඤා වන පිනිස ඔබ සියල්ලන්ට ආරාධනා කරමි. යාච්ඤාවෙන් ඔබ දෙවි සොයා ගන්නා පිණිස ඔබ සෑම කෙනෙක්ම යාච්ඤාව සදහා කාලය සොයා ගනීවා. ඔබ යාච්ඤාව ගැන කථා කරනවාට නොව යාච්ඤා කරනවාට කැමැත්තෙමි. ඔබගේ සෑම දිනක්ම ඔබට ඇති සියල්ල වෙනුවෙනුත් ජීවි තය සදහාත් දෙවි ට කෘතඥතාවේ යාච්ඤාවෙන් පිරි එකක් වේවා. ඔබගේ ජීවි තය වචනවලින් ගත වී ම නොව ක්‍රියාවන්ගෙන් ඔබ දෙවි ව මහිමවත් කරන්නාවූ එකක් වී ම මා ආශා කරමි. මා ඔබ සමග සිටින අතර ඔබ සමග ගත කරන සෑම මොහොතක් සදහාම මම දෙවිට කෘතඥ වෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1991 මැයි 25

"ප්‍රිය දරුවෙනි, මාගේ සාමයේ පණිවුඩ අසා ඇති ඔබ සියලුදෙනා එය බරපතළ ලෙස සැලකීමටත් එය ජීවි තයෙන් ක්‍රියාවට නැගීමටත් මම අද ඔබට ආරාධනා කරමි. පණිවුඩ ගැන කථා කිරීමෙන් තමන් බොහෝ දේ කරන බව සිතන හුගක් සිටියත් ඔවුන් ඒ අනුව ජීවත් වෙන්නේ නැත. ප්‍රිය දරුවෙන් මා ඔබව ජීවි තයටත් ඔබ තුළ ඇති නිශේධාත්මක සියල්ල ඉවත් කිරීමටත් කැදවන අතර එවි ට ඒ සියල්ල ධනාත්මක හා ජීවන දායක වන්නේය. ප්‍රිය දරුවෙනි මා ඔබ සමග සිටින අතර ඔබ සෑම කෙනෙකුටම ජීවත් වෙන්නට ජීවත් වී මෙන් හොද පණිවුඩය ගැන සාක්ෂි දැරීමටත් උපකාර කරන්නට කැමැත්තෙමි. ප්‍රිය දරුවෙනි මා මෙහි සිටින්නේ ඔබට උපකාර කරන්නටත් ඔබට මෝක්සය වෙතට මග පෙන්වන්නටත් දැන් පවා මෝක්ස ජීවි තයක් ගත කරමින් මෝක්ස ප්‍රීතිය ලබා දෙන්නටත්ය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1991 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, අද දින ඔබ මට ලබා දී ඇති මෙම මහත් දවසේ මා ඔබ සියල්ලන්ම ආශීර්වාද කරන්නට කැමැත්තෙන් සිටින අතර මා ඔබ සමග සිටින මෙම දවස් අනුග්‍රහයේ දවස් යයි කියන්නට කැමැත්තෙමි. ඔබට උගන්වා ශුද්ධකමේ මාවත්වල ගමන් කිරීමට උපකාර කරන්නට කැමැත්තෙමි. මගේ පනිවුඩ තේරුම් ගැනීමට අකමැති මා කියන දෙයෙහි බරපතලකම පිළිගැනීමට අකමැති බොහෝ දෙනෙක් සිටිති. නමුත් මා එබැවි න් ඔබව කැදවන්නේ ඔබගේ ජීවි තවලින් හා ඔබගේ දෛනික කටයුතුවලින් මගේ පැමිණීම ගැන සාක්සි දැරීමටය. එබැවි න් කුඩා දරුවෙනි යාච්ඤා කර ශුද්ධ වචනය කියවන්න. එවි ට එහි

ඔබ සඳහා ඇති පණිවුඩ මගේ පැමිණීම තුළින් ඔබ සොයා ගන්නවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1991 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, අද දින සාමය උදෙසා යාච්ඤා කරන්නට මම ඔබට ආරාධනා කරමි. මෙම කාලයේ සාමයට වි ශේෂිත ආකාරයකට තර් ජන එල්ල වේ. මා ඉල්ලා සිටින්නේ නිරාහාරව සිට ඔබගේ පවුල් තුළ යාච්ඤා කරන්නටයි. ප්‍රිය දරුවෙනි තත්ත්වයේ බරපතළකම තේරුම් ගැනීමට මා ඔබෙන් ඉල්ලන අතර සිදු වන බොහෝ දෑ ඔබගේ යාච්ඤාව මත රදා පවතිනවා. එහෙත් ඔබ යාච්ඤා කරන්නේ ඉතා පොඩ්ඩකි. ප්‍රිය දරුවෙනි මා ඔබ සමග සිටින අතර යාච්ඤා කිරීම ආරම්භ කිරීමටත් මාගේ පැමිණීමේ මුල් කාලයේදී මෙන් නිරාහාරව සිටින්නටත්ය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1991 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, මගේ සැලසුම් පෙර කවරදාකටත් වඩා ඉටු වන්නට පටන් ගෙන ඇති අද දින මා යාච්ඤාවට ඔබට ආරාධනා කරමි. සාතන් ශක්තිමත්ව සිටින අතර සාමයේ හා ප්‍රීතියේ සැලසුම් නැති කර මගේ පුත්‍රයා සිය තීරණවලදී ශක්තිමත් නැතැයි ඔබට කල්පනා කරන්නට ෂලස්වමින් කටයුතු කරන්නට වෑයම් කරයි. එබැවි න් ප්‍රිය දරුවෙනි යාච්ඤා කරන්නටත් තවත් ස්ථිරව නිරාහාරව සිටින්නටත් ඔබ සියල්ලන්ට ආරාධනා කරමි. පාතිමාවේ මා කී රහස් ඉටු වන පිණිස ඒවා තේරුම් ගැනීමට මා ඔබගෙන් ඉල්ලා සිමි. තත්ත්වයේ බරපතළකමත් මගේ පැමිණීමේ වැදගත්කමත් තේරුම් ගන්නා ලෙස ප්‍රිය දරුවෙනි මා ඔබට පවසමි. සියලු ආත්ම ගලවා දෙවි ට ඉදිරිපත් කරන්නට මට ඔනෑව ඇත. එබැවි න් මා පටන්ගෙන ඇති සියල්ල සම්පූර් ණ වන පිණිස අපි යාච්ඤා කරමු.. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1991 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා වි ශේෂාකාරයෙන් යාච්ඤා කරන්නට හා යළි එකතු කරන්නට ඔබට ආරාධනා කරමි. මන්දයත් සාතන් පෙර කවරදාකටත් වඩා සිය ලැජ්ජාසහගත මුහුණ ලෝකයට පෙන්වමින් හැකි තරම් වැඩිපිරිසක් මරණයට හා පාපයට පොළඹවා ගන්නට වෑයම් කරයි. එබැවි න් ප්‍රිය දරුවෙනි මාගේ පිරිසිදු හෘදය පවිකාර ලෝකයේ ජයනද දෙන්නට මට උපකාර කරන්න. මාගේ අභිප්‍රායන් දෙවි ට ඉදිරිපත් කර වඩාත් අවශ්‍ය කරවන දෙය කරනු පිණිස යාච්ඤා හා යාග ඉදිරිපත් කරන ලෙස ඔබ සියල්ලන්ගෙන් ඉතා යටහත්ව ඉල්ලා සිටිමි. ඔබගේ ආශාවන් අමතක කර ප්‍රිය දරුවෙනි ඔබගේ ආශාවන් උදෙසා නොව දෙවි ගේ ආශාවන් උදෙසා යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1991 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න.

වර් ෂ 1991 නොවැම්බර් 25 "ප්‍රිය දරුවෙනි, මෙවරත් මම ඔබව යාච්ඤාවට ආරාධනා කරමි. දෙවි මාගේ පැමිණීමෙන් හා මා ඔබට දෙන පණිවුඩ තුළින් ඔබට කියන්නට කැමති වන්නාවූ දෙය අනුව කටයුතු කරන්නට හැකි වන පිණිස යාච්ඤා කරන්න. මා ඔබව යේසුස් හා ඔහුගේ පුදු ම සහගත හෘදය වෙතට ඇද ගැනීමට කැමැත්තෙන් සිටින අතර එසේ කිරීමෙන් ඔබට ඔබ එක් එක්කෙනාට දු න්නාවූ අසීමිත ප්‍රේමය වටහා ගැනීමට හැකි වනු ඇත. එබැවි න් ඔබගේ හෘදයෙන් ප්‍රේමයේ උල්පත ගලන පිණිස ප්‍රිය

දරුවෙනි යාච්ඤා කරන්න. එයාකාරයෙන් යේසුස්ව නොදැන සිටින්නාවූ අයට බලාපොරොත්තුවක් නොමැතිව පවතින මෙම
දු ක්ඛිත ලෝකයේ සියලු පීඩා ජය ගැනීමට ඔබට යේසුස් තුළින් හැකි වන්නේය. ඔබගේ සියලු යාග හා යාච්ඤා සඳහා ස්තූතියි. ම වි සින් තවත් වැඩියෙන් ඔබට උපකාර කරන්නට හැකි වන පිණිස යාච්ඤා කරන්න. ඔබගේ යාච්ඤා මට අවශ්‍යව ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1991 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද දින වි ශේෂිත ආකාරයකින් මා කුඩා යේසුස්ව ඔබ වෙතට ගෙනෙන්නෙමි. එවි ට ඔහුට තමාගේ සාමයේ හා ප්‍රේමයේ ආශීර් වාදයෙන් ආශීර් වාද කරන්නට හැකි වන්නේය. ප්‍රිය දරුවෙනි මෙය බොහෝදෙනෙක් තේරුම් හා පිළි නොගන්නා අනුග්‍රහයක් බව අමතක නොකරන්න. එබැවි න් ඔබ මාගේ යයි පවසා මාගේ උපකාරය පතා ඇති ඔබ ඔබව මුළුමනින්ම දෙන්න. පළමුකොට ඔබගේ ප්‍රේමය හා ආදර් ශය පවුලේ තබන්න. නත්තල පවුලේ මංගල්‍යයක් යයි ඔබ කියන්නෙහිය. එබැවි න් ප්‍රිය දරුවෙනි දෙවි ව පළමුකොට ඔබගේ පවුල්වල තබන්න. එවි ට ඔහු ඔබට සාමය ලබා දී යුද්ධයෙන් ඔබව ආරක්ෂා කරනවා පමණක් නොව සාතන්ගේ සෑම පහරකින්ද සාමයෙන් ඔබව ආරක්ෂා කරනවා ඇත. දෙවි ඔබ සමග සිටින වි ට ඔබට සියල්ල තිබෙනවා ඇත. එහෙත් ඔබට ඔහුව ඔනෑ නැති වි ට එවි ට ඔබ අසරණව සිටින අතර අතරමං වනවා ඇත. තවද ඔබ කාගේ පැත්තේ සිටිනවාදැයි ඔබ නොදන්නවා ඇත. එබැනවි න් ප්‍රිය දරුවෙනි දෙවි වෙනුවෙන් තීරණයක් ගන්න. එවි ට ඔබට සෑම දෙයක්ම ලැබෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

1992

වර් ෂ 1992 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද මා ඔබව ආරාධනා කරන්නේ ඔබගේ පවුලේ යාච්ඤාව අලුත් කරන්නටයි. එසේ කිරීමෙන් සෑම පවුලක්ම මගේ පුත් යේසුස්ට ප්‍රීතියක් වන්නේය. එබැවි න් ප්‍රිය දරුවෙනි යාච්ඤා කර යේසුස් සඳහා වැඩිකාලයක් සොයන්න. එවි ට ඔබට සියල්ල එනම් වඩාත් අමාරු රෝග හා කුරුසියන්ද තේරුම් ගෙන පිළිගැනීමට හැකි වන්නේය. මා ඔබ සමග සිටින අතර ඔබව මාගේ හෘදයට ගෙන ඔබව ආරක්ෂා කරන්නට කැමැත්තෙන් සිටියත් ඔබ තවමත් තීරණයක් ගෙන නොමැත. එබැවි න් ප්‍රිය දරුවෙනි ඔබ යාච්ඤා කරන්න. එවි ට යාච්ඤාව මගින් ඔබ මට උපකාර කරන්නට ඉඩ ලබා දෙන්නේය. මගේ කුඩා ප්‍රිය දරුවෙනි යාච්ඤා කරන්න. එය ඔබේ දෛනික ආහාරය කර ගන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1992 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද දින යාච්ඤාවෙන් තවත් දෙවි ට ළං වෙන්නට මා ඔබට ආරාධනා කරමි. මට ඔබට උපකාර කර සාතන්ගේ සෑම ප්‍රහාරයකින්ම ආරක්ෂා කරන්නට හැකි වන්නේ එයාකාරයෙන් පමණි. මා ඔබ සමග සිටින අතර දෙවි ඔබව ආරක්ෂා කරන පිණිස මා ඔබ වෙනුවෙන් ඔහු සමග අතරමැදිව කටයුතු කරමි. එහෙත් මට ඔබගේ යාච්ඤා හා ඔබගේ "එසේය" අවශ්‍යව ඇත. ඔබ පහසුවෙන්ම ද්‍රව්‍ය හා මානුෂික දේවල අතරමං වන්නහුය. එවි ට දෙවි ඔබගේ මහත්ම මිත්‍රයා බව ඔබට අමතක වේ. එබැවි න් මගේ ප්‍රිය දරුවෙනි දෙවි ඔබව සියලු
දු ෂ්ටකම්වලින් ඔබව ආරක්ෂා කරන පිණිස ඔහුට කිට්ටු වෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1992 මාර් තු 25

"ප්‍රිය දරුවෙනි, අද දින පෙර කවරදාකටත් වඩා මගේ පණිවුඩ අනුව ජීවත් වන ලෙසත් එය ඔබගේ ජීවි තයේ භාවි තා කරන ලෙසත් ඔබෙන් ඉල්ලා සිටිමි. මා ඔබ වෙතට පැමිණ

සිටින්නේ ඔබට උපකාර කරන්නටයි. එනිසා ඔබගේ ජීවි ත වෙනස් කරන ලෙස ඉල්ලමි. මන්දයත් ඔබ දු කෙන් යුත් එමෙන්ම වි නාශයට යන මාවතක් පිවි ස සිටින්නෙහිය. ආගමට හරවන්න යාච්ඤා කරන්න නිරාහාරව සිටින්න පසුතැවි ලිවන්න යයි මම ඔබට පැවසූ වි ට ඔබ මෙම පණිවුඩ ගණනකට නොගත්තහුය. ඔබ ඒවා අනුව ජීවත් වන්නට පටන්ගත් නමුත් පසුව එය ඔබට අමාරු වූ බැවි න් ඔබ නවතා දැමුවහුය. නැත ප්‍රිය දරුවෙනි යමක් යහපත් වන වි ට ඔබ යහපත් දෙය ආරක්ෂා කළ යුතු අතර දෙවි ට මාව පෙනෙන්නේ නැත දෙවි සවන් දී සිටින්නේ නැත දෙවි උපකාර කරමින් සිටින්නේ නැත කියා කල්පනා නොකළ යුතුය. ඉතින් එලෙස ඔබ ඔබගේ දු ක්කදායක උනන්දු වී මි හේතුවෙන් දෙවි ගෙන් හා මගෙන් ඈතට ගොස් ඇත. මට ඔබව සාමයේ ප්‍රේමයේ හා යහපත්කමේ වෘතාන්තයක් ලෙස මවන්නට ඕනෑ කර ඇත. දෙවි ට ඔබව ඕනෑ කළේ ඔබගේ ප්‍රේමයෙන් හා ඔහුගේ උපකාරයෙන් පුදු මයන් සිදු කර එසේ ආදර් ෂයක් දීමටය. එබැවි න් මා ඔබට පවසන්නේ මෙයයි සාතන් ඔබත් ඔබගේ ආත්මත් සමග සෙල්ලම් කරමින් සිටින අතර ඔබ මාගේ හෘදයට ඈත්ව සිටින බැවි න් මට ඔබට උපකාර කරන්නට නුපුළුවන. එබැවි න් යාච්ඤා කරන්න මගේ පණිවුඩවලට අනුව ජීවත් වෙන්න එවි ට ඔබ ඔබගේ දෛනික ජීවි තයේදී දෙවි ගේ ප්‍රේමයේ පුදු මයන් දකිනු ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1992 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, අදත් මම ඔබව යාච්ඤාවට කැදවමි. යුද්ධය නැවැත්වි ය හැක්කේ යාච්ඤාවෙන් හා නිරාහාරව සිටීමෙන් පමණකි. එබැවි න් මාගේ ප්‍රිය කුඩා දරුවෙනි යාච්ඤා කර ඔබගේ ජීවි තවලින් ඔබ මගේ හා මට අයත් බව සාක්ෂි දරන්න. මන්දයත් මෙම පීඩාකාරී කාලයේ සාතන් හැකි තරම් ආත්ම වි නාශ කරන්නට වෑයම් කරන නිසාය. එබැවි න් දෙවි සඳහා තීරණයක් ගැනීමට ඔබට ආරාධනා කරමි. එවි ට ඔහු ඔබව ආරක්ෂා කර ඔබ කළ යුතු දෙය හා ඔබ ගත යුතු මාවත ඔබට පෙන්වනවා ඇත. "එසේය" කියා මට පැවසූ සෑම කෙනෙක්ම සිය කැපවී ම මගේ පුතාට හා ඔහුගේ හෘදයට හා මට අලුත් කරන ලෙස ඉල්ලමි. එවි ට මෙම අසමගිමත් ලෝකයේ සාමයේ උපකරන ලෙස ඔබව වඩාත් කිට්ටු කර ගත හැකි වන්නේය. මෙඩ්ජුගෝජේ ඔබ සියල්ලන්ට සළකුණක් වන්නේය. එය යාච්ඤාවට කැදවී මක් මෙන්ම දෙවි ඔබට දෙන මෙම දවස්වල අනුග්‍රහයෙන් ජීවත් වන්නට කාලයක් වන්නේය. එබැවි න් ප්‍රිය දරුවෙනි බරපතළකමින් යාච්ඤා කරන්නට කරන ආරාධනාව පිළිගන්න. මම ඔබ සමග සිටින අතර ඔබගේ වේදනාවන් මගේද වන්නේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1992 මැයි 25

"ප්‍රිය දරුවෙනි, අදත් මම ඔබව යාච්ඤාවට කැදවමි. එසේ ඔබ යාච්ඤාවෙන් තවත් දෙවි ට ලං වන්නෙහිය. මම ඔබ සමග සිටින අතර යේසුස් ඔබට දෙන ගැලවි මේ මාවතේ ඔබට මගපෙන්වන්නට කැමැත්තෙමි. ඔබ එය නොදැන සිටියත් දිනෙන් දින මම ඔබට වඩාත් ලංව සිටින්නෙමි. තවද ඔබගේ යාච්ඤා කිපයෙන් ඔබ මා සමග සුළුවෙන් බැදී සිටින බව ඔබ පිළිගන්නට නොකැමතිය. පරීක්ෂා හා ගැටලු පැන නගින වි ට අහෝ දෙවි යනි අහෝ මෑනියනි ඔබ කොහේදැයි ඔබ කියනවා. මා බලාසිටින්නේ ඔබ "එසේය" කියා කියනතෙක් ය. එවි ට මම එය යේසුස්ට ඉදිරිපත් කර ඔහුගේ අනුග්‍රහයෙන් ඔබව පුරවන්නෙමි. මගේ කැදවී ම පිළිගන්නා ලෙස මා යලිත් ඉල්ලා සිටින්නේ එනිසාය. යාච්ඤාව ඔබට ප්‍රීතියක් වනතෙක් අලුත් ක්‍රමයකට යාච්ඤා කරන්න. එවි ට දෙවි ඔබගේ ජීවි තයේ ඉතා ප්‍රභල කෙනෙක් බව ඔබ දකිනවා ඇත. මා ඔබ සමග සිටින අතර ඔබ එන තෙක් බලා සිටිමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1992 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, මෙම මාවතට පිවි ස එය නතර කර දැමූ අය ගැන මා තුළ යම් දු කක් තිබුණත් අද දින මා ඉතා සතුටින් සිටිමි. මගේ පැමිණීම ඔබව නව මාවතකට ගැළවී මේ මාවතට රැගෙන යාමය. දිනෙන් දින සංවාදයට මා ඔබව කැඳවන්නේ එනිසාය. එහෙත් ඔබ යාච්ඤා නොකරන්නේ නම් ඔබ ආගමට හැරවී මේ මාවතේ සිටින බව ඔබට කිව නොහැකිය. මා ඔබ වෙනුවෙන් යාච්ඤා කරන අතර ඔබ වෙනුවෙන් සාමය උදෙසා අතරමැදිකම් කරන්නෙමි. දෙවි ඔබගේ සාමයේ සිටින පිනිස පළමුකොට ඔබගේ හෘදයන්හි හා ඔබ අවට සාමය උදෙසා කටයුතු කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1992 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, අදත් මම ඔබව යාච්ඤාවට කැඳවමි. මෙම දු ක්මුසු දිනවල ඔබ අතර කිසිවෙක් යාච්ඤාවෙහි දු ක නොව තමාගේ මැවුම්කරුව හමුවී මේ ප්‍රීතිය ලබන පිණිස සන්තෝෂයේ යාච්ඤාවට ඔබව කැඳවමි. මට වඩාත් ලං වන පිණිසත් යාච්ඤාව තුළින් එය ඔබගෙන් වූ ආශාවක් බව පෙන්වමින් කුඩා දරුවෙනි යාච්ඤා කරන්න. මම ඔබ සමග සිටින අතර සෑම දිනකම අපගේ ස්වාමීන් ඔබගේ දෛනික ජීවි තයේ සිය අනුග්‍රහයෙන් බොහෝ සේ පුරවන පිණිස මම මගේ මාතෘ ආශිර්වාදයෙන් ඔබට ආශිර්වාද කරමි. මට ඔබ සමග සිටින්නට හැකියාව ලබා දීමෙන් දෙවි ලබා දී ඇති අනුග්‍රහයට ඔහුට ස්තූති කරන්න. මන්දයත් එය මහත් අනුග්‍රහයක් බව මා ඔබට සහතික වෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1992 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, මා ඔබට ප්‍රේම කරන බව අද දින මම ඔබට කියන්නට කැමැත්තෙමි. මම මගේ මාතෘ ප්‍රේමයෙන් ඔබට ප්‍රේම කරන අතර ඔබව සම්පූර්ණයෙන් මට වි වෘත කරන ලෙස ආරාධනා කරමි. එවි ට ඔබ එක් එක්කෙනා මගින් මට පාපයෙන් හා නරක දෙවල්වලින් පිරී ඇති මෙම ලෝකය හරවා ගලවා ගත හැකිය. මගේ කුඩා හිතවත් දරුවෙනි තමාව දිනෙන් දින ඔබට එළිදරව් කරන්නාවූ මැවුම්කරු වන දෙවි ගේ පුදු ම සහගත ප්‍රේමය වෙතට නිතර ඔබව උසුලාගෙන යන පිනිස ඔබ ඔබව සම්පූර්ණයෙන් මට වි වෘත කළ යුත්තේ එනිසාය. මා ඔබ සමග සිටින අතර ඔබට ප්‍රේම කරන දෙවිව එළිදරව් කරන්නටත් පෙන්වන්නටත් මා ආශාවෙන් සිටිමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1992 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මෙම දු ෂ්කර දවස්වලදීත් මම ඔබ සමග සිටින බවත් මා සහ මගේ පුත් යේසුස් ගොඩනගන සියල්ල සාතන් වි නාශ කර දැමීමට කැමැත්තෙන් සිටින බවත් අද දින මා යළිත් කියන්නට කැමැත්තෙමි. ඔහු වි ශේෂාකාරයෙන් ඔබගේ ආත්ම වි නාශ කර දැමීමට ආශාවෙන් සිටියි. ඔබව ක්‍රිස්තියානි ජීවි තයෙන් හා පල්ලිය ජීවත් වී ම සඳහා පනවන නීතිවලින් හැකි පමණ දු රස් කිරීමට ඔහුට උවමනා වී ඇත. සාතන් ඔබ වටා හා ඔබ තුළ ඇති සියලු ශුද්ධ දේවල් වි නාශ කිරීමට ෂතුටින් සිටියි. කුඩා දරුවෙනි යාච්ඤා දිගටම යාච්ඤා කරමින් මගේ පැමිණීමෙන් දෙවි ලබා දෙන සියල්ල ඔබ අල්ලා ගැනීමට වෑයම් කළ යුත්තේ එනිසාය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1992 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, සාතන් ශක්තිමත්ව සිටිමින් හැකි තරම් ආත්ම තමාගේ කර ගැනීමට කැමැත්තෙන් සිටින මේ කාලයේ ඔබට මම යාච්ඤා කිරීමට කැඳවමි. යාච්ඤා කරමින් ප්‍රිය දරුවෙනි මා කෙරෙහි වැඩිවි ශ්වාසයක් තබන්න. මන්දයත් මා මෙහි සිටින්නේ ඔබට උපකාර කරන්නටත් අලුත් මාවතක මග පෙන්වන්නටත්ය. එය වැදගත් වන්නේ මා තවදු රටත් ඔබ සමග නොසිටින කාලයක මාගේ වචන හා මා ඔබට පැවසූ සියල්ල මතක් කර ගැනීමටය. පටන්ගැන්මේ සිට ඔබගේ ජීවි ත වෙනස් කර ගැනීමට මම ඔබට කියමි. එමෙන්ම වචනයෙන් නොව ඔබගේම ජීවි තයෙන් වෙනස් වන්නට ඔබ තීරණය කළ යුතුය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1992 නොවැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද දින පෙර කවරදාකටත් වඩා මම ඔබව යාච්ඤාවට කැඳවමි. ඔබගේ ජීවි තය අඛණ්ඩ යාච්ඤාවක් වේවා. ප්‍රේමය නොමැතිව ඔබට යාච්ඤා කළ නොහැකිය. අන් සියල්ලට වඩා ඔබගේ ජීවි තවල මැවුම්කරුවන දෙවි ට ප්‍රේම කිරීමට මා ඔබට කියන්නේ එනිසාය. එවි ට ඔබට දෙවි ව දැන ගත හැකි වන අතර ඔහු ඔබට ප්‍රේම කරන ආකාරයටම සෑම දෙයකදීම ඔහුට ප්‍රේම කරන්නට ඔබටත් හැකි වන්නේය. ප්‍රිය දරුවෙනි මා ඔබ සමග සිටීම වරප්‍රසාදයකි. ඔබගේ යහපත පිණිස ඔබ මාගේ පණිවුඩ පිළිගෙන ඒ අනුව ජීවත් වි ය යුත්තේ එනිසාය. මා ඔබට ප්‍රේම කරන අතර ඔබට ඉගැන්වී මටත් වෙනස් වී මේ හා නැවත එක්සත් වී මේ නව ජීවි තයකටත් මග පෙන්වන්නටත් මා ඔබ සමග සිටින්නේ එනිසාය. ඔබට දෙවි ව සොයා ගත හැක්කේත් ඔබගෙන් ඉතා ඈත්ව ඇතැයි පෙනෙන සියල්ල අත්කර ගත හැක්කේත් මෙලෙසින් පමණකි. එබැවි න් මගේ ප්‍රිය දරුවෙනි යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1992 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, ඔබ සියල්ලන්ව මාගේ වස්ත්‍රය යටතේ තබා ගන්නටත් සාතන්ගේ සියලු දු ෂ්ට ප්‍රහාරයන්ගෙන් ඔබව ආරක්ෂා කිරීමටත් මා කැමැත්තෙන් සිටිමි. අද දින සාමයේ දිනයක් වුවත් මුළු ලෝකයේම සාමයේ මහත් හිගයක් ඇත. යාච්ඤාවෙන් සාමයේ අලුත් ලෝකයක් ගොඩනගන්නට මා ඔබව කැඳවන්නේ එනිසාය. ඔබ නොමැතිව මෙය මට කළ නොහැකිය. මාගේ මාතෘ ප්‍රේමයෙන් ඔබව මා කැඳවන්නේ එනිසාය. දෙවි ඉතිරි සියල්ල කරනවා ඇත. එබැවි න් දෙවි ගේ සැලැස්මට ඔබව වි වෘත කර ඔහුගේ සාමයට හා යහපත්කමට වූ ආකෘතියට ඔහු හා සහයෝගයෙන් ක්‍රියා කරන්නට වෑයම් කරන්න. ඔබගේ ජීවි ත ඔබට අයත් නොවන බව අමතක නොකරන්න. එය ඔබ අන්‍යයන්ට ප්‍රීතිය ගෙන ආ යුතු හා ඔවුන්ව සදා ජීවි තයට මගපෙන්වි ය යුතු දීමනාවකි. කුඩා යේසුස්ගේ මෘදු භාවය නිතර ඔබ සමග පවතීවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

## 1993

වර් ෂ 1993 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබගෙන් ඉල්ලන්නේ මගේ පණිවුඩ බරපතළ ලෙස සලකා ඒ අනුව ජිවත් වන ලෙසය. දෙවි වෙනුවෙනුත් යහපත වෙනුවෙනුත් සාමය වෙනුවෙනුත් ඔබ තීරණයක් ගත යුතු කාලය මෙයයි. වෛරය හා ඊර් ෂ්‍යාව ඔබගේ ජීවි තයෙන් හා සිතුවි ලිවලින් නැති වී දෙවි ට හා ඔබගේ අසල්වැසියාට ප්‍රෙමය පමණක් පවතීවා. කාලයේ ලකුණු ඔබට තේරුම් ගත හැකි වන්නේ එවි ට පමණකි. මා ඔබ සමග සිටින අතර අලුත් කාලයකට මා ඔබට මග පෙන්වන්නෙමි. එය තමාව වඩාත් හොඳින් හඳු නාගන්නා පිණිස අනුග්‍රහයක් හැටියට දෙවි දෙන කාලයකි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1993 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මාගේ මාතෘ ආශීර්වාදයෙන් මා ඔබට ආශීර්වාද කරමි. ඔබගේ
ජීවිතය වෙනස් කර ගැනීමට තීරණය කරන්න. එය වචනයෙන් හා සිතුවිලි වලින් නොව
ආදර්ශයෙන් පල්ලියේ වැඩ කිරීමෙන්ය. එවිට ඔබගේ ජීවිතය යේසුස්ට ප්‍රීතිමත් සාක්ෂියක්
වන්නේය. ඔබ හැරී සිටින බව කිව නොහැක. මන්දයත් ඔබගේ ජීවිතය දෛනික වෙනසක්
විය යුතු නිසාය. ඔබ කළ යුතු දෙය තේරුම් ගන්නා පිණිස යාච්ඤා කරන්න. එවිට දෙවි
ඔබ කළ යුතු සම්පූර්ණ දෙයත් ඔබ වෙනස් විය යුතු තැනත් ඔබට දෙනවා ඇත. මම ඔබ
සමග සිටින අතර ඔබව මාගේ වස්ත්‍රය යටතේ තබා ගනිමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය
දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1993 මාර්තු 25

"ප්‍රිය දරුවෙනි, අද දින පෙර කවරදාකටත් වඩා මම සාමය සඳහා එනම් ඔබගේ හෘදයන්හි
සාමය ඔබගේ පවුල්වල සාමය සහ මුළු ලෝකයේම සාමයට යාච්ඤා කරන්නට ඔබට
ආරාධනා කරමි. මන්දයත් සාතන්ට යුද්ධය අසමාදානය මෙන්ම යහපත් සියල්ල විනාශ කර
දැමීමට උවමනා නිසාය. එබැවින් ප්‍රිය දරුවෙනි යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා
කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1993 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබ සියල්ලන්ගෙන් ඉල්ලා සිටින්නේ ප්‍රේමයට ඔබගේ හෘදයන්
අවධි කරන ලෙසය. ස්වභාව ධර්මය වෙතට ගොස් එය අවධි වන ආකාරය බලන්න. එය
මැවුම්කරු වන දෙවිගේ ප්‍රේමයට ඔබගේ හෘදයන් විවෘත කරන්නට ඔබට උපකාරවත්
වෙනවා ඇත. ඔබගේ පවුල්වල ප්‍රේමය අවධි කරන්නට මා කැමැත්තෙමි. එවිට අසමගිය හා
වෛරය ඇති තැන ප්‍රේමය රජකම් කරනු ඇති අතර ප්‍රේමය ඔබගේ හෘදයන්හි ඇති විට
යාච්ඤාවත් පවතිනු ඇත. තවද ප්‍රිය දරුවෙනි මා ඔබ සමග සිටින බව අමතක නොකරන්න.
තවද ප්‍රේම කිරීමට දෙවි ඔබට ශක්තිය දෙන පිණිස මම මාගේ යාච්ඤාවලින් ඔබට උපකාර
කරමි. මම මාගේ මාතෘ ප්‍රේමයෙන් ඔබට ප්‍රේම කර ආශීර්වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය
දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1993 මැයි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා යාච්ඤාව මාර්ගයෙන් ඔබව දෙවිට විවෘත කරන ලෙස පවසමි.
එවිට ශුද්ධාත්මය ඔබ තුළ හා ඔබ තුළින් ආශ්චර්යයන් කරන්නට පටන් ගන්නවා ඇත. මා
ඔබ සමග සිටින අතර ඔබ සෑම කෙනෙක් වෙනුවෙන්ම දෙවි ඉදිරියේ අතර මැදිකම්
කරන්නෙමි. මන්දයත් ප්‍රිය දරුවෙනි ඔබ සෑම කෙනෙක්ම මාගේ ගැලවීමේ සැලැස්මේ
වැදගත් වන නිසාය. යහපතේ හා සාමයේ වාහකයන් වෙන්නට මම ඔබට ආරාධනා කරමි. ඔබ
හැරී යාච්ඤා කරන්නේ නම් පමණක් දෙවිට ඔබට සාමය ලබා දිය හැකිය. එබැවින් මාගේ
ප්‍රිය කුඩා දරුවෙනි යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. එමෙන්ම ශුද්ධාත්මය
ඔබට අනුබල දෙන දෙය කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1993 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, ඔබ අද මෙහි පැමිණීම ගැන මම සතුටු වෙමි. මම මාගේ මාතෘ
ආශීර්වාදයෙන් ඔබට ආශීර්වාද කරන අතර ඔබ සෑම කෙනෙක් වෙනුවෙන්ම දෙවි ඉදිරියේ
අතරමැදිකම් කරමි. අලුතින් මාගේ පණිවුඩවලට අනුව ජීවත් වෙන්නට මම ඔබට කැඳවන
අතර එය ජීවිතයට යොදා ගෙන ක්‍රියාවට නගන්නට කියමි. මම ඔබ සමග සිටින අතර
දිනෙන් දින ඔබට ආශීර්වාද කරමි. ප්‍රිය දරුවෙනි මේවා විශේෂ කාලයන් වන අතර
එබැවින් ඔබට ප්‍රේම කරන්නටත් ඔබව ආරක්ෂා කරන්නටත් ඔබගේ හෘදයන් සාතන්ගෙන්

ආරක්ෂා කරන්නට හා මගේ පුත් යේසුස් වෙතට ලගා කරන්නට මම ඔබ සමග සිටිමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1993 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, ඔබගේ යාච්ඤාවන්ට ස්තූතියි. ප්‍රිය දරුවෙනි නුවාන ඔප්පු කරමින් ඔබට වඩාත් සුදුසු යයි හැගෙන යාග ඔප්පු කරන්න. ඔබගේ ජීවි ත මට බැඳී තිබෙනාට කැමැත්තෙමි. කුඩා දරුවෙනි ඔබගේ මව මමයි. සාතන්ට ඔබව වැරදි මාර් ගයේ මගපෙන්වන්නට උවමනා නිසා ඔහු ඔබව රවටනවාට මා නොකැමැත්තෙමි. ඔබ ඔහුට අවසර නොදෙන්නේ නම් ඔහු එය කළ නොහැකිය. එබැවි න් කුඩා දරුවෙනි ඔබගේ හෘදයේ යාච්ඤාව අලුත් කර ගන්න. එවි ට ඔබට මගේ කැඳවී ම හා උපකාර කිරීමට ඇති ආශාව තේරුම් ගැනීමට හැකි වන්නේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1993 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, මම ඔබගේ මව බවත් මට ඔබට උපකාර කිරීමට හා ඔබව යාච්ඤාවට කැඳවී මට අවශ්‍යව ඇති බව ඔබ තේරුම් ගන්නවාට කැමැත්තෙමි. ඔබට මාගේ පණිවුඩ තේරුම් ගැනීමට හා පිළිගැනීමටත් ඒවා ක්‍රියාවට නැගීමටත් හැකි වන්නේ යාච්ඤාවෙන් පමණි. ශුද්ධ ලියවි ල්ල කියවා ඒ අනුව ජීවත් වෙන්න. කාලයේ ලකුණු තේරුම් ගැනීමට යාච්ඤා කරන්න. මෙය වි ශේෂ කාලයක් වන බැවි න් ඔබව මාගේ හා මාගේ පුත් යේසුස්ගේ හෘදය වෙතට ඇද ගැලීමට මා ඔබ සමග සිටිමි. ප්‍රිය දරුවෙනි ඔබ අන්ධකාරයේ නොව ආලෝකයේ දරුවන් වෙනවාට කැමැත්තෙමි. එබැවි න් මා කියන ආකාරයට ජීවත් වෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1993 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මම ඔබගේ මව වන අතර දෙවි ඔබගේ සාමය හා ඔබගේ ගැලවුම්කරු වන බැවි න් යාච්ඤාව තුළින් ඔහුට ලගා වන ලෙස මම ඔබට ආරාධනා කරමි. එබැවි න් කුඩා දරුවෙනි ද්‍රව්‍යමය දේවලින් සැනසිල්ල නොසොයා දෙවි ව සොයන්න. මම ඔබ වෙනුවෙන් යාච්ඤා කරන අතර සෑම පුද්ගලයෙක් වෙනුවෙන්ම මා දෙවි ඉදිරියේ අතරමැදිකම් කරමි. මම ඔබගේ යාච්ඤාවන් බලා සිටින්නෙමි. මුල් දවස්වලදී මෙන් ඔබ මාවත් මගේ පණිවුඩත් පිළිගෙන ඔබ හෘදයන් වි වෘත කර යාච්ඤා කරන්නේ නම් පමණක් ආශ්චර් යයන් සිදු වෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1993 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, මෙම වසරවල මම ඔබට යාච්ඤා කරන්නටත් මා කියන ලෙස ජීවත් වෙන්නටත් ඔබට කිව්වත් ඔබ එය එතරම් ගණන් ගන්නේ නැත. ඔබ කථා කරතත් ඔබ ජීවත් වන්නේ නැත. මෙම යුද්ධය කුඩා දරුවෙනි පවතින්නේ එනිසාය. ඔබව දෙවි ට වි වෘත කරන ලෙසත් ඔබගේ හෘදයෙන් දෙවි සමග ජීවත් වෙන ලෙසත් මම ඔබට ආරාධනා කරමි. යහපත්ව ජිවත් වෙමින් මම පණිවුඩවලට සාක්ෂි දරන්න. මම ඔබට ප්‍රේම කරන අතර සෑම දු ෂ්ටකමකින්ම ඔබව ආරක්ෂා කරන්නට කැමැත්තෙන් සිටියත් ඔබ එය ආශා කරන්නේ නැත. ප්‍රිය දරුවෙනි ඔබ දෙවි ගේ ආඥා අනුව ජීවත් නොවන්නේ නම් මට ඔබට උපකාර කළ නොහැකිය. ඔබ පූජාවෙන් ජීවත් වී පාපයෙන් දු රුව සිටිය යුතුය. ඔබ ප්‍රේමයේ හා යහපත්කමේ අපෝස්තුලුවරුන්ව සිටින්නට ආරාධනා කරමි. මෙම අසහනයේ ලෝකයේ දෙවි වෙනුවෙන් දෙවි ගේ ප්‍රේමය වෙනුවෙන් සාක්ෂි දරන්නේ නම් දෙවි ඔබට ආශීර් වාද කර ඔබ සොයන දෙය ඔබට ලබා දෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1993 නොවැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මෙම අවස්ථාවේ මම පෙර කවරදාකටත් වඩා ඔබට කියන්නේ යේසුස්ගේ පැමිණීමට සූදානම් වෙන්න කියාය. කුඩා යේසුස් ඔබගේ හෘදයේ රජකම් කරවා. එසේ යේසුස් ඔබගේ මිත්‍රයා වන වි ට ඔබ සතුටින් සිටිනවා ඇත. එවි ට ඔබට යාච්ඤා කරන්නටත් අපහසු නොවනු ඇත. ඔහු ඔබට මෙම කාලයේ ශක්තිය හා සතුට දෙනවා ඇත. මාගේ මැදිහත්වී මෙන් හා යාච්ඤාවෙන් මා ඔබ සමග සිටින අතර මා ඔබට ප්‍රේම කරනවා. ඔබට ආශීර්වාද කරනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1993 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද මා කුඩා යේසුස් සමග ප්‍රීතියෙන් සිටින අතර යේසුස්ගේ ප්‍රීතිය සෑම හෘදයක් තුළටම ඇතුල්වී ම ආශාවෙන් සිටිමි. කුඩා දරුවෙනි සෑම හෘදයකම සාමය රජ කරන පිණිස මම ඔබට දෙන පණිවුඩය සමග මගේ පුත් යේසුස් සමග ආශීර්වාදයක්ද දෙමි. කුඩා දරුවෙනි මම ඔබට ප්‍රේම කරමි. එමෙන්ම ඔබ සැම යාච්ඤාවෙන් මා ලගට එන්නට මම ඔබට ආරාධනා කරමි. ඔබ කථා කරමින් සිටියත් ඔබ යාච්ඤා කරන්නේ නැත. එබැවි න් කුඩා දරුවෙනි යාච්ඤා කරන්නට තීරණය කරන්න. ඔබ සතුටු වනු ඇත්තේත් ඔබ දෙවි ගෙන් සොයන දෙය ඔහු ඔබට දෙනවා ඇත්තේත් එයාකාරයෙන් පමණි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

1994

වර්ෂ 1994 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, ඔබ සියල්ලන්ම මගේ දරුවෝ. මම ඔබට ප්‍රේම කරමි. එහෙත් කුඩා දරුවෙනි යාච්ඤාව නොමැතිව ඔබට මගේ ළඟින් සිටින නොහැකි බව ඔබ අමතක නොකළ යුතුයි. මෙම කාලයේ සාතන්ට ඔබගේ හදවතේ හා පවුල්වල අක්‍රමිකත්වයක් ඇති කරන්නට අවශ්‍යව ඇත. කුඩා දරුවෙනි ඔහුට ඉඩ නොදෙන්න. ඔබටත් ඔබගේ ජීවි තයටත් මගපෙන්වන්නට ඔබ ඔහුට ඉඩ නොදිය යුතුයි. මම ඔබට ප්‍රේම කරන අතර ඔබ වෙනුවෙන් දෙවි ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1994 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද දින ඔබගේ යාච්ඤාවන්ට මම ඔබට ස්තූති කරමි. මෙම යුද්ධය හැකි ඉක්මනින් නිම වී මට ඔබ සියල්ලන්ම මට උදව් කර ඇත. මම ඔබට ළඟින් සිටින අතර ඔබ සෑමකෙනෙක් වෙනුවෙන්ම යාච්ඤා කරමි. මම ඔබගෙන් ඉල්ලන්නේ යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. අපට නපුර පරාජය කළ හැක්කේත් ඔබගේ ජීවි තයේ සාතන්ට වි නාශ කරන්නට උවමනා සියල්ල ආරක්ෂා කළ හැක්කේත් යාච්ඤාවෙන් පමණකි. මම ඔබගේ මව වන අතර ඔබව සමානාකාරයෙන් ප්‍රේම කරමි. මම ඔබ වෙනුවෙන් දෙවි ඉදිරියේ අතරමැදිකම් කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1994 මාර්තු 25

"ප්‍රිය දරුවෙනි, මම ඔබ සමග සතුටින් සිටින අතර ඔබගේ හදවත් මට වි වෘත කරන ලෙස ඉල්ලමි. ලෝකයේ ගැලවී ම පිනිස ඔබ මගේ අතේ උපකරණයක් වි ය යුතුය. ශුද්ධකමේ සුවඳ දන්නා ඔබ සැම දෙවි ට හා දෙවි ගේ ප්‍රේමයට සාගිනිව සිටින ලෝකයට ගෙන යන්නට මා දෙන මෙම පණිවුඩ ගෙනයාම ගැන මම ඔබ කෙරෙහි සතුටු වෙමි. මෙතරම් මහත් සංඛ්‍යාවන්ගෙන් ප්‍රතිචාරය දැක්වී ම ගැන මා ස්තූති කරන අතර මාගේ මාතෘ ආශීර්වාදයෙන් ආශීර්වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1994 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, අද දින මාගේ අභිප්‍රායන්ට අනුව යාච්ඤා කරන්නට තීරණය කරන ලෙස ඔබට ආරාධනා කරමි. කුඩා දරුවෙනි මෙම මීසම සම්බන්නධයෙන් මාගේ සැලසුම් සාර්ථක කරගන්නට උපකාර කරන ලෙස ඔබගෙන් ඉල්ලමි. දැන් මම කුඩා දරුවෙනි ඔබව ගැලවී මේ මාර්ගයේ යන්නට ආරාධනා කරන්නේ වි ශේෂාකාරයකටයි. ඔබ යාච්ඤා නොකරන්නේ නම් හා මා දෙන පණිවුඩවලට ඔබ කීකරු හා යටහත් නොවන්නේ නම් මට ඔබට උපකාර කරන්නට නොහැක. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1994 මැයි 25

"ප්‍රිය දරුවෙනි, මා කෙරෙහි වැඩිවි ශ්වාසයක් තබන්නටත් මාගේ පණිවුඩ බලවත් ලෙස ජීවත් වෙන්නටත් මම ඔබට ආරාධනා කරමි. මම ඔබ සමග සිටින අතර දෙවි ඉදිරියේ ඔබ වෙනුවෙන් අතරමැදිකම් කරන්නෙමි. තවද මාගේ පණිවුඩවලට ඔබගේ හදවත් වි වෘත වනතෙක් බලා සිටිමි. දෙවි ඔබට ප්‍රේම කරන නිසාත් සැම දිනකම හැරෙන්නට ඔබට හැකියාව ලබා දෙන නිසාත් ප්‍රීතිමත් වී මැවුම්කරු වන දෙවි කෙරෙහි වි ශ්වාසය තබන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1994 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, අද දින ඔබ සියල්ලන්ව මෙහි දැකීමෙන් මම හදවතින් සතුටු වෙමි. මම ඔබට ආශීර්වාද කර ඔබෙන් ඉල්ලන්නේ මා මෙහි දෙන පනිවුඩවලට අනුව ජීවත් වෙන්නට තීරණයක් ගන්නා ලෙයසි. ඔබව යේසුස් වෙතට මගපෙන්වන්නට මා කැමැත්තෙමි. මන්දයත් ඔහු ඔබගේ ගැලවී ය. එබැවි න් කුඩා දරුවෙනි ඔබ යාච්ඤා කරන පමණට ඔබ මාගේන් මගේ පුත් යේසුස්ගේත් වෙනවා ඇත. මම මාගේ මාතෘ ආශීර්වාදයෙන් ඔබට ආශීර්වාද කරන අතර මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූති කරමි."

වර්ෂ 1994 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබගෙන් ඉල්ලන්නේ ඉවසීමෙන් යාච්ඤාවට කාලයක් ලබා ගන්නා ලෙසය. ප්‍රිය දරුවෙනි ඔබ දෙවි ට සෑම දිනකම කාලය ලබා දෙන්නට සූදානම් නැත්නම් ඔබට මාගේ යයිද මාගේ පණිවුඩ මගින් වෙනසක් අද්දැක ඇතැයිද කිව නොහැකිය. මම ඔබට කිට්ටුවෙන් සිටින අතර ඔබ සැමට ආශීර්වාද කරමි. කුඩා දරුවෙනි ඔබ යාච්ඤා නොකරන්නේ නම් ඔබ මට හෝ ශුද්ධකමේ මාවතේ ඔබව රැගෙන යන ශුද්ධාත්මයට කිට්ටුවෙන් නොසිටින්නේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූති කරමි."

වර්ෂ 1994 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා වි ශේෂිත ආකාරයකට යාච්ඤාවෙන් ඔබ සමග එක්සත් වී සිටින අතර ඔබගේ ගමේ මගේ පුත්‍රයාගේ පෙණී සිටිම වෙනුවෙන් යාච්ඤා කරමි. කුඩා දරුවෙනි දු ක් වි දින හා මෙම කාලවල් සදහා මා තෝරාගෙන ඇති මාගේ පුත්‍රයාගේ ශරීර සෞඛ්‍යය වෙනුවෙන් යාච්ඤා කරන්න. ඔබගේ පියවරුන් ඇති කර ගත් සිහින ඉටුවන පිණිස මම යාච්ඤා කර මාගේ පුත් යේසුස් ඉදිරියේ අතරමැදිකම් කරමි. කුඩා දරුවෙනි වි ශේෂිත ආකාරයකට යාච්ඤා කරන්න. මන්දහත් සාතන් "ශක්තිමත්ව සිටින අතර ඔබගේ හදවතේ බලාපොරොත්තුව වි නාශ කරන්නට වෑයම් කරයි. මම ඔබට ආශීර්වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූති කරමි."

වර්ෂ 1994 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මම ඔබ සමග සතුටින් සිටින අතර ඔබව යාච්ඤාවට කැදවමි. කුඩා දරුවෙනි මාගේ අභිමතයන් වෙනුවෙන් යාච්ඤා කරන්න. ඔබගේ යාච්ඤා මට අත්‍යාවශ්‍යයි. එමගින් මම ඔබව දෙවි ළගට ගෙනයන්ට බලාපොරොත්තු වෙමි.

ඔහු අපගේ ගැලවීමයි. දෙවි මාව ඔබගේ ඉලක්කය වූ පාරාදීසිය වෙතට මගපෙන්වන්නට උපකාර කරන්නට එවා ඇත. එබැවින් කුඩා දරුවෙනි යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූති කරමි."

වර්ෂ 1994 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, මා ඔබ සමග සිටින අතර මා ෂතුටින් සිටිමි. මන්දයත් මහෝත්තමයාණන් ඔබ සමග සිටිනන්නටත් ඔබට සම්පූර්ණකමේ මාර්ගයේ මගපෙන්වන්නටත් මට ඉඩ දී ඇත. කුඩා දරුවෙනි සාන්තවරුන්ගේ දිනයේ දෙවිට ඔප්පු කරන ලස්සන මල් පොකුරක් වෙන්නට මම කැමැත්තෙමි. විවෘත වන්නටත් ජීවත් වෙන්නටත්" ආරාධනා කරන්නට මම කැමැත්තෙමි. සාන්තවරුන්ව ආදර්ශයට ගන්න. මව් පල්ලිය ඔවුන්ව තෝරාගෙන ඇත. ඔවුන් ඔබගේ දෛනික ජීවිතයට පෙළඹවීමක් විය යුතුය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූති කරමි."

වර්ෂ 1994 නොවැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද්දින මම ඔබව යාච්ඤාවට කැඳවමි. මම ඔබ සමග සිටින අතර මම ඔබට ප්‍රේම කරමි. මම ඔබගේ මව වන අතර ඔබගේ හදවත් මාගේ හදවතට සමාන වෙනවාට කැමැත්තෙමි. කුඩා දරුවෙනි යාච්ඤාව නොමැතිව ඔබට ජීවත් වෙන්නටත් ඔබ මාගේ යයි කීමටත් නොහැකිය. යාච්ඤාව ප්‍රීතියකි. යාච්ඤාව මනුෂ්‍ය හදවත ආශා කරන්නකි. එබැවින් කුඩා දරුවනි පිරිසිදු හදවතට ළංවී දෙවිව සොයා ගන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූති කරමි."

වර්ෂ 1994 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මම අද ඔබ සමග ප්‍රීතියෙන් සිටින අතර මම ඔබ සමග සාමය උදෙසා ඔබගේ හදවත්වල සාමය ඔබගේ පවුල්වල සාමය ඔබගේ ආශාවල සාමය මුළු ලෝකයේම සාමය. යාච්ඤා කරන්නෙමි. සාමයේ රජ ඔබට ආශීර්වාද කර ඔබගේ සාමය ලබා දු න්නාවේ. මම ඔබට ආශීර්වාද කරන අතර ඔබ සෑම කෙනෙක්වම මාගේ හදවතේ උසුලාගෙන යන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූති කරමි."

1995

වර්ෂ 1995 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, මලක් සූර්යයාට පුදින්නාක් මෙන් ඔබගේ හදවතේ දොරටුව යේසුස්ට විවෘත කරන්නට මම ඔබට ආරාධනා කරමි. ඔබගේ හෘදය සාමයෙන් හා ප්‍රීතියෙන් පුරවන්නට යේසුස් කැමැත්තෙන් සිටියි. කුඩා දරුවෙනි ඔබ යේසුස් සමග සාමයෙන් නොමැත්තේ නම් ඔබට සාමය තේරුම් ගත නොහැකිය. එබැවින් යේසුස් ඔබගේ සත්‍යය හා සාමය වන පිණිස මම ඔබව පව් සමාවට ආරාධනා කරමි. එබැවින් කුඩා දරුවෙනි මා කියන දෙය තේරුම් ගැනීමට ශක්තිය ඉල්ලා යාච්ඤා කරන්න. මම ඔබ සමග සිටින අතර ඔබට ප්‍රේම කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1995 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, මම ආශා කරන මෙම ස්ථානයේ මම දෙන්නා වූ මගේ පණිවුඩයේ මිෂනාරිවරුන් වීමට මම ඔබව අද දින ආරාධනා කරමි. දෙවි මෙතෙක් කල් ඔබ සමග සිටින්නට මට අවසර දී ඇති නිසා ප්‍රිය දරුවෙනි මම දෙන පණිවුඩය ප්‍රේමයෙන් රකින්නටත්

සාමය නොමැතිය වෛරයෙන් පූර්ණව සිටින ජනයාට ප්‍රේමයේ නදියක් ගලා යන පිණිසත් මුළු ලෝකයටම මා දෙන පණිවුඩය සම්ප්‍රේෂණය කරන්න. කුඩා දරුවෙනි සෑම හදවතක්ම ආලෝකය හා ගැලවී ම පිළිගන්නා පිණිස මා ඔබට ආරාධනා කරන්නේ සාමය නොමැති තැන සාමය වන්නටත් අඳු ර ඇති තැන ආලෝකය වෙන්නටත්ය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර්ෂ 1995 මාර්තු 25

“ප්‍රිය දරුවෙනි, මා අද දින ඔබට ආරාධනා කරන්නේ සාමයෙන් ඔබගේ හෘදයෙන් හා පවුල් තුළ ජීවත් වන ලෙයසි. කුඩා දරුවෙනි යාච්ඤාව නොමැති තැන සාමයත් ඇදහිල්ල නොමැති තැන ප්‍රේමයත් නොමැත. එබැවි න් කුඩා දරුවෙනි මා අද දින ඔබට ආරාධනා කරන්නේ යළිත් හැරීම සඳහා තීරණයක් ගන්නා ලෙයසි. මම ඔබ අසල සිටින අතර මා අද ඔබට ආරාධනා කරන්නේ කුඩා දරුවෙනි ඔබට උපකාර කරන්නට මට තුරුලු වන්නටයි. එහෙත් ඔබ එසේ නොකරන අතර එනිසා සාතන් ඔබට පිරික්සා කරන අතර කුඩා දෙයෙහි පවා ඔබගේ ඇදහිල්ල නැති වේ. කුඩා දරුවෙනි මෙනිසයි යාච්ඤා කර එමගින් ඔබට ආශීර්වාද හා සාමය ලැබෙන්නේ. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර්ෂ 1995 අප්‍රේල් 25

“ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට ආරාධනා කරන්නේ ප්‍රේම කරන්නටයි. කුඩා දරුවෙනි ප්‍රේමය නොමැතිය ඔබට දෙවි සමග හෝ සහෝදරයා සමග ජීවත් වි ය නොහැකිය. එබැවි න් මා ඔබට ආරාධනා කරන්නේ ඉතා ශ්‍රේෂ්ට දෙය වූ දෙවි කෙරෙහි ප්‍රේමයට හා ඔබ එක් එක්කෙනාට ඔබගේ හෘදය වි වෘත කරන ලෙයසි. ප්‍රේමයේ හා ගැලවී මේ මාවත පෙන්වන පිණිස ඔබ අතර මාව දෙවි එව්වේ මනුෂ්‍යයා කෙරෙහි දෙවි ට ඇති ප්‍රේමය නිසාය. ඔබ පළමුව දෙවි ට ප්‍රේම නොකරන්නේ නම් ඔබට අසල්වැසියාටත් ඔබ වෛර කරන තැනැත්තාටත් ප්‍රේම කරන්නට නොහැකි වේ. එබැවි න් ප්‍රිය දරුවෙනි යාච්ඤා කරන්න. යාච්ඤාවෙන් ඔබ ප්‍රේමය සොයා ගන්නවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර්ෂ 1995 මැයි 25

“ප්‍රිය දරුවෙනි, මා ඔබට ආරාධනා කරන්නේ ඔබගේ යාච්ඤාවෙන් මට උපකාර කරන ලෙයසි. එවි ට හැකි තරම් හෘදවලට මාගේ පිරිසිදු හෘදය වෙතට එන්නට හැකි වන්නේය. සාතන් බලවත්ව සිටින අතර ඔහුගේ මුළු බලයෙන් හැකි තරම් අයව තමා හා පාපය වෙතට ගෙනයන්නට වෑයම් කරන්නේය. සෑම අවස්ථාවක්ම අල්ලා ගන්නට ඔහු හදන්නේ එනිසාය. මා ඔබෙන් අයැද සිටින්නේ කුඩා දරුවෙනි යාච්ඤා කර ඔබට උපකාර කරන්නට උපකාර කරන ලෙයසි. මා ඔබගේ මව වන අතර මට ඔබට උපකාර කරන්නට අවශ්‍යව ඇත්තේ එනිසාය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර්ෂ 1995 ජූනි 25

“ප්‍රිය දරුවෙනි, අද දින වි ශාල සංඛ්‍යාවන්ගෙන් ඔබව දකින්නට මා සතුටින් සිටින අතර ඔබගේ ප්‍රතිචාරයන්ට හා මගේ පණිවුඩ අනුව ජීවත් වෙන්නට යෑම ගැන සතුටුයි. මෙම දු ඃකර ලෝකයේ මගේ සාමයේ ප්‍රීතිමත් වාහකයන් වී මට කුඩා දරුවෙනි මම ඔබට ආරාධනා කරමි. මගේ හෘදය මහත් අවි වේකීව බලා සිටින සාමය රජයන පිණිස සාමයේ කාලයක් සඳහා හැකි ඉක්මනින්ම යාච්ඤා කරන්න. කුඩා දරුවෙනි මම ඔබ අසල සිටින අතර ඔබ වෙනුවෙන් මහෝත්තමයාණන් ඉදිරියේ අතරමැදිකම් කරමි. මාගේ මාතෘ ආශීර්වාදයෙන් ඔබට මම ආශීර්වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1995 ජූලි 25

“ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව යාච්ඤාවට ආරාධනා කරමි. මන්දයත් යාච්ඤාවෙන් මා මෙහි පැමිණීම ඔබට තේරුම් ගත හැකි නිසාය. ඔබ හැරිය යුතු බව තේරුම් ගැනීමට ශුද්ධාත්මය ඔබට උපකාර කරනවා ඇත. කුඩා දරුවෙනි ඔබව සදාකාලය සඳහා ලස්සන මල්පිඩක් බවට පත් කරන්නට මා ආශාවෙන් සිටියත් මම දර් ෂන මගින් මා ඉදිරිපත් කරන්නා වූ හැරීමේ මාර් ගය හා ගැලවී මේ මාර් ගය පිළිනොගන්නෙහිය. කුඩා දරුවෙනි දු ෂටකම යටපත් කරන්න. මම ඔබට ප්‍රේම කරන අතර මම ඔබට ආශීර් වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1995 අගෝස්තු 25

“ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව යාච්ඤාවට ආරාධනා කරමි. යාච්ඤාව ඔබට ජීවි තය වේවා. පවුලක් යාච්ඤා නොකරන්නේ නම් එය සාමයෙන් සිටින්නේ යයි කිව නොහැකිය. එබැවි න් ඔබගේ උදෑසන උදෑසන යාච්ඤාවෙන් ආරම්භ වී සවස ස්තූති දීමෙන්ද අවසන් වේවා. කුඩා දරුවෙනි මම ඔබ සමග සිටිමි. ඔබට ප්‍රේම කරමි. ඔබට ආශීර් වාද කරමි. ඔබ සෑම කෙනෙක්ම මට තුරුල් වී සිටිනවාට ආශාවෙමි. ඔබ සෑම දිනයකම යාච්ඤා නොකරන්නේ නම් මගේ තුරුලේ සිටිය නොහැකිය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1995 සැප්තැම්බර් 25

“ප්‍රිය දරුවෙනි, අද දින අල්තාරයේ වඩාත්ම ශුද්ධ සක්‍රමේන්තුව සමග ප්‍රේමයෙන් බැඳෙන ලෙස ආරාධනා කරමි. ඔබගේ මීසමේ ඔහුට නමස්කාර කරන්න. එවි ට ඔබට මුළු ලෝකය සමග එක්සත්ව සිටිනු ඇත. යේසුස් ඔබගේ මිත්‍රයා වනු ඇති අතර ඔබ එතරම් නොදන්නා කෙනෙක් මෙන් ඔබ ඔහු ගැන කථා නොකරනු ඇත. ඔහු සමග එක්සත්කම ඔබට ප්‍රීතියක් වන අතර ඔබ යේසුස් සෑම ජීවි යෙකුටම ඇති ප්‍රේමයට සාක්සිකරුවන් වනු ඇත. ප්‍රිය දරුවෙනි ඔබ යේසුස්ට නමස්කාර කරන වි ට ඔබ ඔහුට කිට්ටුවෙන් සිටිනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1995 ඔක්තෝබර් 25

“ප්‍රිය දරුවෙනි, අද දින මම ඔබට ස්වභාවධර් මයට යන්නට ආරාධනා කරමි මන්දයත් ”ඔබට ඔබගේ මැවුම්කරු එහිදී ඔබට හමුවෙනවා ඇත. අද දින දෙවි ඔබට ලබා දෙන සෑම දෙයකටම ඔහුට ස්තූති කරන්නට මම ඔබට ආරාධනා කරමි. ඔහුට ස්තූති කිරීමෙන් ඔබ මහෝත්තමයාණන් මෙන්ම ඔබ වටා ඇති සියලු යහපත් දෙවල් සොයා ගනු ඇත. ප්‍රිය දරුවෙනි දෙවි ශ්‍රේෂ්ට වන අතර සෑම ජීවි යෙක් සඳහාම ඔහුගේ ප්‍රේමයත් ශ්‍රේෂ්ටය. එබැවි න් දෙවි ගේ ප්‍රේමය හා යහපත්කම තේරුම් ගත හැකි වන පිනිස යාච්ඤා කරන්න. මැවුම්කරු වන දෙවි ගේ යහපත්කමෙන් හා ප්‍රේමයෙන් මමත් තෑග්ගක් හැටියට ඔබ සමග සිටිමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 1995 නොවැම්බර් 25

“ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබ සැමව ප්‍රේමයෙන් ආරාධනා කර සිටින්නේ පළමුකොට ඔබ එක් එක්කෙනාව මුදා ගලවාගත් දෙවි වෙනුවෙනුත් ඔබ ලඟින් සිටින සහෝදර සහෝදරියන් වෙනුවෙනුත් ජීවත් වෙන්නටයි. ප්‍රේමය නොමැතිය කුඩා දරුවෙනි ඔබට ශුද්ධකමේ වර් ධනය වි ය නොහැකි අතර යහපත් ක්‍රියා කරන්නටද නොහැකිය. එබැවි න් කුඩා දරුවෙනි දෙවි තමාගේ ප්‍රේමය ඔබට එළි කරන පිණිස අඛණ්ඩව යාච්ඤා කරන්න. ඔබ සැමට මා සමග එක් වී මටත් ප්‍රේම කිරීමටත් මම ඔබ සියල්ලන්ට ආරාධනා කර ඇත. අද දින මා ඔබ සමග සිටින අතර ඔබගේ හෘදයේත් පවුල්වලත් ප්‍රේමය සොයා ගැනීමට ඔබට ආරාධනා කරමි. ඔබගේ

හෘදයේ දෙවි  පවතින්නට නම් ඔබ ප්‍රේම කළ යුතුය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර්ෂ 1995 දෙසැම්බර් 25

“ප්‍රිය දරුවෙනි, අද මා ඔබ සමග ප්‍රීතිමත් වන අතර යේසුස් ඔබට ආශීර්වාද කරන පිණිස මම ඔහුව ඔබ වෙතට ගෙන එමි. කුඩා දරුවෙනි ඔබගේ ජීවි ත ඔහු සමග එක්සත් වන පිණිස මම ඔබට ආරාධනා කරමි. මම ඔබ සමග සිටින අතර මම ඔබව යේසුස්ට වි ශේෂිත ආකාරයකට ඉදිරිපත් කරමි. මෙම කාලය යමෙක් ඔහු වෙනුවෙන් තීරණයක් ගත යුතු අවස්ථාවය. මෙය අනුග්‍රහයේ කාලයයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

1996

වර්ෂ 1996 ජනවාරි 25

“ප්‍රිය දරුවෙනි, අද දින මම සාමය සඳහා තීරණයක් ගැනීමට ඔබට ආරාධනා කරමි. දෙවි ඔබට සැබෑ සාමය දීම සඳහා යාච්ඤා කරන්න. සාමයෙන් ඔබගේ හෘදයෙන්ම ජීවත් වෙන්න. එවි ට දරුවෙනි සාමය දෙවි ගේ දීමනාවක් බව ඔබ තේරුම් ගන්නවා ඇත. ප්‍රිය දරුරෙනි ප්‍රේමය නොමැතිය ඔබට සාමයෙන් ජීවත් වි ය නොහැකිය. සාමයේ ඵලය ප්‍රේමය වන අතර ප්‍රේමයේ ඵලය සමාව දීම වන්නේය. කුඩා දරුවෙනි මම ඔබ සමග සිටින අතර මා ඔබට ආරාධනා කරන්නේ අන් සියල්ලට වඩා පවුල තුළ සමාව දෙන ලෙසටය. එවි ට ඔබට අන් අයට සමාව දීමට හැකි වන්නේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර්ෂ 1996 පෙබරවාරි 25

“ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව වෙනස් වී මට කැඳවමි. මට මෙහි ලබා දිය හැකි වටිනාම පණිවුඩය මෙයයි. කුඩා දරුවෙනි ඔබ මගේ පණිවුඩයේ වාහකයෙක් වී ම මගේ ආශාවයි. මෙම කාලය පුරා මම ඔබට ලබා
දු න් මගේ පණිවුඩයට අනුව
ජීවත් වෙන්න ආරාධනා කරන්න කැමතියි. මෙයට අනුග්‍රහයේ කාලයකි. වි ශේෂයෙන්ම පල්ලිය පවා මෙම කාලයේ යාච්ඤාවට හා හැරීමට ඔබට ආරාධනා කරන්නේය. මම කුඩා දරුවෙන් ඔබෙන් ඉල්ලන්නේ මම මෙහි පෙනී සිටි අවස්ථාවේ පටන්
දු න් මගේ පණිවුඩවලට අනුව
ජීවත් වන ලෙසය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර්ෂ 1996 මාර්තු 25

“ප්‍රිය දරුවෙනි, අන් සියල්ලට වඩා දෙවි ට ප්‍රේම කරන්නට තීරණයක් ගන්න මම ඔබට ආරාධනා කරන්න කැමතියි. ප්‍රේම කුමක් ද යන්නත් සැබෑ සාරධර්ම පවත්වා ගන්නටත් අමතක වන ලෙස පාරිභෝගිකත්වයේ ආත්මයක් පවතින මෙම කාලයේ කුඩා දරුවෙනි මම ඔබට ආරාධනා කරන්නේ ඔබගේ ජීවි තයේ මුල් තැනට දෙවි ව තබන ලෙයසි. ද්‍රව්‍යමය දේවල්වලින් ඔබට පහර දෙන්නට සාතන්ට ඉඩ නොදිය යුතුමුත් නිදහස හා ප්‍රේමය වන දෙවි උදෙසා තීරණයක් ගන්න. කුඩා දරුවෙනි ආත්මයේ මරණය නොව ජීවනය තෝරා ගන්න. තවද ඔබ යේසුස්ගේ දු ක් වේදනා හා
මරණය සිහිපත් කරන මෙම කාලයේ නැවත නැගිටීම තුළින්
පිබිදු න ජීවි තය වෙනුවෙන්
තීරණයක් ගන්න. අද දින ඔබගේ ජීවි තය අලුත් කර ගන්න. එය සදාකාල ජීවි තයට ඔබට මග පෙන්වනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර්ෂ 1996 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, අද මම යාච්ඤාව ඔබගේ පවුල්වල පළමුතැනට තබන්නට ඔබට යළිත් ආරාධනා කරමි. කුඩා දරුවෙනි දෙවි පළමු තැනට සිටින වි ට ඔබ කරන සියල්ලේදී ඔබ දෙවි ගේ කැමැත්ත සොයනු ඇත. මෙසේ ඔබගේ දෛනික වෙනස් වී ම වඩාත් පහසු වනු ඇත. කුඩා දරුවෙනි යටහත් පහත්ව ඔබගේ හෘදයන්හි නොමැති දෙය සොයන්න. එවි ට ඔබ කළ යුතු දෙය ඔබ තේරුම් ගන්නවා ඇත. වෙනස් වී ම ඔබ ප්‍රීතියෙන් කරන්නා වූ දෛනික වගකීමක් වෙනවා ඇත. යාච්ඤාවෙන් හා පුද්ගලික වෙනස් වී මෙන් මාගේ සාක්ෂිකරුවන් වෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1996 මැයි 25

"ප්‍රිය දරුවෙනි, මා වෙනුවෙන් වෙන් කරන ලද මෙම මාසේ ඔබගේ සියලු යාච්ඤා හා යාගවලට ඔබට ස්තූති කරන්නට කැමැත්තෙමි. කුඩා දරුවෙනි මෙම මාසයේ ඔබ සියල්ලන් ක්‍රියාකාරී වී වි ශේෂාකාරයෙන් ස්වර් ගය සමග සම්බන්ධ වී ම මගේ ආශාවයි. ඔබ සියල්ලන් ඔබගේ ජීවි තයෙන් හා ආදර් ශයෙන් ගැලවී මේ වැඩේට සම්බන්ධ වී මට යාච්ඤා කරන්න. කුඩා දරුවෙනි සියල්ලන් හැරී මාවත් මගේ පුත් යේසුස්වත් ඔබ තුළ දැකීම මගේ ප්‍රාර් ථනයයි. මම ඔබ වෙනුවෙන් අතරමැදිකම් කරමින් ඔබට ආලෝකය බවට පත්වන්නට මා ඔබට උපකාර කරන්නෙමි. අනිකෙකුට උපකාර කිරීමෙන් ඔබගේ ආත්මයත් ගැලවී ම සොයා ගන්නවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1996 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, අද දින ඔබ මා හට ඔප්පුකළ සියලු යාග සඳහා ස්තූති කරමි. කුඩා දරුවෙනි ඔබව මා හට වි වෘත කර වෙනස් වී මප සඳහා තීරණයක් ගන්නා ලෙස ඉල්ලමි. කුඩා දරුවෙනි ඔබගේ හෘදයන් තවමත් මට සම්පූර් ණයෙන් වි වෘත කර නොමැති බැවි ණ් යළිත් ඔබට යාච්ඤාවට වි වෘත වන ලෙස ඉල්ලමි. එමගින් ශුද්ධාත්මය ඔබගේ හෘදය දැඩිනොව මෘදු කිරීමට උපකාර කරනවා ඇත. කුඩා දරුවෙනි ඔබ මාගේ කැඳවි මට ප්‍රතිචාරය දැක්වී ම ගැනත් මා සමග ශුද්ධකම කරා ඇවි දීමට තීරණය කිරීම ගැනත් ස්තූති කරමි.

වර් ෂ 1996 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට ආරාධනා කරන්නේ සෑම දිනකම දෙවි වෙනුවෙන් තීරණයක් ගන්නා හැටියටය. කුඩා දරුවෙනි ඔබ දෙවි ගැන හුගක් කථා කළත් ඔබ ඔබගේ ජීවි තයෙන් සාක්ෂි දරන්නේ ටිකකි. එබැවි න් කුඩා දරුවෙනි ඔබගේ ජීවි ත දෙවි ඉදිරියේ සැබෑවක් වන පිණිස වෙනස් වෙන්නට තීරණයක් ගන්න. එසේ ඔබගේ ජීවි තයේ සත්‍යයෙන් දෙවි ඔබට ලබා දු න් අලංකාරය ගැන සාක්ෂි දරන්නට හැකි වන්නේය. කුඩා දරුවෙනි යළිත් යාච්ඤාව වෙනුවෙන් තීරණයක් ගන්නා ලෙස ඉල්ලමි. මන්දයත් එයින් ඔබට වෙනස් වී ම අනුව ජීවත් වෙන්නට හැකි වන්නේය. සරලතාව තුළින් ඔබ සෑම කෙනෙක්ම පියාගේ ප්‍රේමයට වි වෘත දරුවෙක් බවට පත්වන්නේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1996 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, ඔබට අසීමිතව ප්‍රේම කරන දෙවි කෙරෙහි වි ශ්වාස කර ඇදහිල්ල තැබීමට ඔබට කථා කරන්නට කැමති බැවි න් සවන් දෙන්න. කුඩා දරුවෙනි ඔබ දෙවි ගේ අනුග්‍රහයෙහි ජීවත් වෙන්නට නොදන්නෙහිය. දෙවි ගේ වචනය ඔබගේ හෘදයෙහි හා සිතුල්ලෙහි රැගෙන යන්නට මා ඔබට අලුතෙන් කියන්නේ එනිසාය. ප්‍රිය දරුවෙනි ශුද්ධ වචනය ඔබගේ පවුලේ පෙනෙන තැනකින් තබාගෙන එය කියවා තේරුම් ගෙන ඒ අනුව ජීවත්වෙන්න. ඔබගේ දරුවන්ටත් උගන්වන්න. මන්ද ඔබ ඔවුන්ට ආදර් ශයක් නොවුවහොත් දරුවන් අදේවත්වයට ඇදී යනු ඇත. යාච්ඤා කරන්න එවි ට දෙවි ඔබගේ හෘදයන්හි යළි උපදින අතර ඔබගේ හෘදයන් ප්‍රීතිමත් වනු ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1996 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, සවන්දෙන්න මන්දයත් අසීමිතව ඔබට ප්‍රේම කරන දෙවි කෙරෙහි වැඩි ඇදහිල්ල හා විශ්වාසය තබන්නට ඔබට කථා කරන්නට හා ආරාධනා කරන්නට කැමැත්තෙමි. කුඩා දරුවෙනි ඔබ දෙවි ගේ අනුග්‍රහයෙහි ජීවත් වෙන්නට නොදන්නෙහිය. දෙවි ගේ වචනය ඔබගේ හෘදයෙහි හා සිතුල්ලෙහි රැගෙන යන්නට මා ඔබට අලුතෙන් කියන්නේ එනිසාය. ප්‍රිය දරුවෙනි ශුද්ධ වචනය ඔබගේ පවුලේ පෙනෙන තැනකින් තබාගෙන එය කියවා තේරුම් ගෙන ඒ අනුව ජීවත්වෙන්න. ඔබගේ දරුවන්ටත් උගන්වන්න. මන්ද ඔබ ඔවුන්ට ආදර්ශයක් නොවුවහොත් දරුවන් අදේවත්වයට ඇදී යනු ඇත. යාච්ඤා කරන්න එවිට දෙවි ඔබගේ හෘදයන්හි යළි උපදින අතර ඔබගේ හෘදයන් ප්‍රීතිමත් වනු ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1996 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මම ඔබගේ මවයි. එමෙන්ම දෙවි ගෙන් අනුග්‍රහය ලබා දීමෙන් ඔබට උපකාර කිරීමට මම කැමැත්තෙමි. කුඩා දරුවෙනි ඔබගේ
දු ක්වේදනා දෙවි ට ප්‍රීතියේ වඩාත්ම ලස්සන මලක් වන පිනිස තෑග්ගක් ලෙස ඔප්පු කරන්න. කුඩා දරුවෙනි
දු ක්වේදනා කුරුසියද ප්‍රීතියක් විය හැකි බව ඔබ තේරුම් ගනු පිණිස යාච්ඤා කළ යුත්තේ එනිසාය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1996 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට ආරාධනා කරන්නේ දෙවි ඔබව වෙනස් කරන පිනිස ඔබව ඔබගේ මැවුම්කරු වන දෙවි ට විවෘත කරන හැටියටය. කුඩා දරුවෙනි මම ඔබට ඉතා ආදරෙයි. මම ඔබට ප්‍රේම කරන අතර මම ඔබට කියන්නේ මට කිට්ටුවෙන් සිටින හැටියටත් මගේ පිරිසිදු හෘදයට ඇති ඔබගේ ප්‍රේමය වැඩිකර ගන්නා හැටියටත්ය. මම ඔබව අලුත් කර මගේ හෘදය සමග යේසුස්ගේ හෘදය වෙතට මග පෙන්වන්නට කැමැත්තෙමි. එය තවමත් ඔබ වෙනුවෙන්
දු ක් විදින අතර අලුත් වී මටත් හැරීමටත් ඇරයුම් කරමින් සිටින්නේය. ඔබ තුළින් මම ලෝකය අලුත් කරන්නට බලාපොරොත්තු වෙමි. ඔබ මෙම ලෝකයේ ලුණු බවත් ලෝකයේ ආලෝකය බවත් තේරුම් ගන්න. කුඩා දරුවෙනි මම ඔබට ආරාධනා කරන අතර ඔබට ප්‍රේම කරමි. විශේෂිත ආකාරයකට පවසන්නේ වෙනස් වන්න කියාය. මගේ ඉල්ලීමට ප්‍රතිචාර 1996 දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1996 නොවැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද්දින යළිත් මම ඔබට යාච්ඤා කරන්නට ඇරයුම් කරමි. මන්දයත් යාච්ඤාවෙන් නිරාහාරව සිටීමෙන් හා කුඩා යාගවලින් ඔබට ඔබව යේසුස්ගේ පැමිණීමට සූදානම් කළ හැකි නිසාය. මෙවර කුඩා දරුවෙනි ඔබට අනුග්‍රහයේ කාලයක් වේවා. සෑම මොහොතක්ම පාවිච්චි කර යහපත කරන්න. මන්දයත් යේසුස්ගේ උපත ඔබගේ හෘදයෙහි දැනිය හැක්කේ එලෙසින් පමණකි. ඔබ ඔබගේ ජීවි තයෙන් ආදර්ශයක් දෙමින් දෙවි ගේ ප්‍රේමයේ සලකුණක් වන්නේ නම් මනුෂ්‍යයන්ගේ හෘදයේ ප්‍රීතිය පවතිනු ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1996 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මම කුඩා යේසුස්ව මගේ උකුලේ දරමින්ද ඔබට ආරාධනා කරමින්ද ඔහුගේ ඇමතුමට ඔබව විවෘත කරන ලෙස පවසමින් අද දින ඔබ සමග විශේෂිත ආකාරයකට

සිටිමි. ඔහු ඔබව ප්‍රීති වන්නට කැඳවයි. කුඩා දරුවෙනි ශුභාරංචියේ පණිවුඩයට අනුව ප්‍රීතියෙන් ජීවත් වන්න. එය මා ඔබ සමග සිටි අවස්ථාවේ පටන් පවසා ඇත. කුඩා දරුවෙනි මම ඔබගේ මවයි. ප්‍රේමයේ හා සාමයේ දෙවි ව ඔබට ප්‍රකාශ කරන්නට කැමැත්තෙමි. ඔබගේ ජීවි ත දු කින් තිබීම මම සතුටු නැත. එහෙත් ශුභාරංචියට අනුව එය සදාකාලය දක්වා ප්‍රීතියෙන් තිබිය යුතුය. ඔබගේ ජීවි තය අර් තවත් වන්නේ එයාකාරයෙන් පමණකි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

1997

වර් ෂ 1997 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, ඔබගේ අනාගතය ගැන කල්පනා කරන ලෙස ඉල්ලමි. දෙවි නොමැතිව ඔබගේම ශක්තියෙන් ඔබ අලුත් ලෝකයක මවා ඇත. ඔබ අසතුටෙන් හා හෘදයේ ප්‍රීතියක් නොමැතිව සිටින්නේ එනිසාය. මෙවර එය මාගේ වාරය වන අතර මා ඔබට යළිත් යාච්ඤා කරන ලෙස ඉල්ලන්නේ එනිසාය. ඔබ දෙවි සමග එක්සත්කම ඇති කරගන්නා වි ට ඔබ ප්‍රීතියෙන් පිනා යනු ඇත. ඔබ කොතැනක සිටියත් දෙවි ගේ ප්‍රේමය අද්දකිනවා ඇත. මම ඔබට ආශීර් වාද කරන අතර ඔබට උපකාර කරන්නට මා ඔබ සමග සිටින බව නැවතත් කියමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1997 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා වි ශේෂිත ආකාරයකට ඔබෙන් ඉල්ලන්නේ මැවුම්කරු වන දෙවි ට ඔබව වි වෘත කරන ලෙසත් ක්‍රියාශීලී වන ලෙසත්ය. කුඩා දරුවෙනි මා මෙවර ඔබෙන් ඉල්ලන්නේ මෙම අවස්ථාවේ ඔබගේ ආත්මික හා ද්‍රව්‍යමය උපකාරය අවශ්‍ය කාටද කියා බලන්නටයි. ඔබගේ ආදර් ශයෙන් කුඩා දරුවෙනි ඔබ මනුෂ්‍යත්වය සොයමින් සිටින්නාවූ දෙවි ගේ දිගු කරන ලද හස්තයක් වෙනවා ඇත. ඔබව සාක්ෂි දැරීමටත් දෙවි ගේ වචනයේ හා ඔබගේ ප්‍රේමයේ ප්‍රීතිමත් දරන්නන් වෙන්නටත් කැඳවා ඇති බව ඔබ තේරුම් ගන්නේ මෙයාකාරයෙන් පමණකි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1997 මාර් තු 25

"ප්‍රිය දරුවෙනි, කුරුසිය ඔබගේ අතට ගන්නටත් යේසුස්ගේ තුවාල මෙනෙහි කරන්නටත් වි ශේසිත ආකාරයකට අද දින මා ඔබව කැඳවමි. ඔබගේ පාප නිසා හෝ ඔබගේ දෙමාපියන්ගේ පාප නිසා ඔබ ජීවි තයේ ලැබූ තුවාල සුව කරන්නට යේසුස්ගෙන් ඉල්ලන්න. මැවුම්කරු වන දෙවි ගෙන් ලෝකයට සුව කිරීමක් අවශ්‍යව ඇති බව ප්‍රිය දරුවෙනි ඔබ තේරුම් ගනු ඇත්තේ මෙයාකාරයෙන් පමණි. ඔබ ඇදහිල්ලේ අපෝස්තුලුවරුන් වන්නේ යාච්ඤාවෙන් පමණක් බව ඔබ තේරුම් ගනු ඇත්තේ යේසුස්ගේ දු ක්ප්‍රාප්තියෙන් හා කුරුසිය මත මරණයෙන් පමණකි. සරලකමෙන් හා යාච්ඤාවෙන් ඔබ දීමනාවක් වන ඇදහිල්ලෙන් ජීවත් වෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1997 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, අද දින මැවුම්කරු වන දෙවි සමග ඔබගේ ජීවි ත සම්බන්ධ කර ගැනීමට ඔබව කැඳවමි. ඔබගේ ජීවි තයට අර් තයක් ලැබෙන්නෙත් ඔබ දෙවි ගේ ප්‍රේමය තේරුම් ගනු ඇත්තේත් මෙයින් පමණකි. දෙවි මාව ඔබ වෙතට එවා ඇත්තේ ප්‍රේමයෙනි. ඔහු නොමැතිව අනාගතයක් හෝ ප්‍රීතියක් නැතහොත් සදාකාල ගැලවි මක් නොමැති බව තේරුම් ගැනීමට මා ඔබට උපකාර කරන පිණිසය. කුඩා දරුවෙනි මා ඔබට කියන්නේ පාපය අත්හැර නිතර යාච්ඤාව පිළිගෙන එනයින් ඔබගේ ජීවි තයේ අර් තය තේරුම් ගන්නා හැටියටයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1997 මැයි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබට කියන්නේ දෙවි ව මහිමවත් කරන ලෙසත් දෙවි ගේ නාමය උදෙසා ඔබගේ හෘදයන් හා ජීවි තය තුළින් ශුද්ධව සිටින ලෙසත්ය. කුඩා දරුවෙනි ඔබ දෙවි ගේ ශුද්ධකමෙහි සිටින වි ට ඔහු ඔබ සමග සිටින අතර ඔබට සාමය හා ප්‍රීතිය ලබා දෙනවා ඇත. එය දෙවි ගෙන් පමණක් යාච්ඤාවෙන් ලැබෙන්නේය. කුඩා දරුවෙනි ඔබගේ පවුල්වල යාච්ඤාව අලුත් කර ගත යුත්තේ එනිසාය. එවි ට ඔබගේ හෘදය දෙවි ගේ ශුද්ධ නාමය මහිමවත් කරන අතර එය ඔබගේ හෘදයේ රජකම් කරනවා ඇත. මම ඔබ අසල සිටින අතර දෙවි ඉදිරියේ අතරමැදිකම් කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1997 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබ සමග වි ශේෂිත ආකාරයකට සිටින අතර සාමයේ මාගේ මාතෘ ආශිර්වාදය ගෙනෙමි. මා ඔබ වෙනුවෙන් යාච්ඤා කර ඔබ වෙනුවෙන් දෙවි ඉදිරියේ අතරමැදිකම් කරමි. කුඩා දරුවෙනි ඔබ යාච්ඤා කළ යුත්තේ එනිසාය. මන්ද ඔබගේ සාමයේ අත්තිවාරම යාච්ඤාවය. ඔබගේ හෘදය වි වෘත කර දෙවි ට කාලය ලබා දෙන්න. එවි ට ඔහු ඔබගේ මිත්‍රයා වෙන්නේය. සැබෑ මිත්‍රත්වය දෙවි සමග ඇති කර ගන්නා වි ට කිසි කුණාටුවකට එය වි නාශ කළ නොහැකිය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1997 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ යාච්ඤාවට වූ මගේ ආරාධනාවට ප්‍රතිචාරය දක්වන ලෙයසි. ප්‍රිය දරුවෙනි මෙම අවස්ථාවේ යාච්ඤා කරන්නට මුල්ලක් සොයා ගන්නේ නම් කැමැත්තෙමි. හෘදයෙන් යාච්ඤාවට මගපෙන්වන්නට කැමැත්තෙමි. යාච්ඤාව නොමැතිව ඔබගේ ජීවි තය හිස් බව ඔබ තේරුම්ගනු ඇත්තේ එවි ටය. යාච්ඤාවෙන් ඔබ දෙවි ව සොයා ගන්නා වි ට ඔබ ඔබගේ ජීවි තයේ අර්ථය තේරුම් ගන්නවා ඇත. ඔබගේ හෘදයේ දොරටුව වි වෘත කළ යුත්තේත් එය නොමැතිව ජීවත් වි ය නොහැකි තරමට එය ප්‍රීතියක් බව තේරුම් ගත යුත්තේත් එනිසාය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1997 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, දෙවි මෙවර මාව ඔබට තෑග්ගක් ලෙස දෙන්නේ මා ඔබට උපදෙස් දී ගැලවි මේ මාර්ගයේ මගපෙන්වන්නටයි. ප්‍රිය දරුවෙනි ඔබට මෙම අවස්ථාවේ අනුග්‍රහය තේරුම් නොමැති නමුත් මෙම පණිවුඩ වෙනුවෙන් ඔබ
දු ක් වන අවස්ථාවක්
ඉක්මනින්ම එනවා ඇත. මා ඔබට
දු න් සෑම වචනයකටම එකගව
ඔබ ජීවත් වි ය යුත්තේ එනිසාය. යාච්ඤාව ඔබට ප්‍රීතියක් වන තෙක් යාච්ඤාව අලුත් කර ගන්න. තමන්ව මාගේ පිරිසිදු
හෘදයට බද්ද කර ගෙන ඇති සෑම කෙනෙකුටම මා කියන්නේ අනුන්ට ආදර්ශයක් වන ලෙයසි. පූජකයන්ගෙන් හා ආගමික සහෝදර සහෝදරියන්ගෙන් මා ඉල්ලන්නේ කොන්තය කියා යාච්ඤා කරන්නට අනුන්ට උගන්වන ලෙසය. කුඩා දරුවෙනි මා වි ශේෂයෙන් කොන්තයට කැමතියි. කොන්තයෙන් ඔබගේ හෘදය මට වි වෘත කරන්න. එවි ට මට ඔබට උපකාර කළ හැකිය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1997 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, ප්‍රේමය නොමැතිව දෙවි ඔබගේ ජීවි තයේ පළමු තැනට සිටිය නොහැකි බව තේරුම් ගැනීමට ඔබට නොහැකි බව තේරුම් ගන්නා ලෙස අද ඔබගෙන් ඉල්ලමි. කුඩා

දරුවෙනි මනුෂ්‍ය ප්‍රේමයෙන් නොව දේව ප්‍රේමයෙන් ප්‍රේම කරන්නට ඔබට මා ආරාධනා කරන්නේ එනිසාය. මෙයාකාරයෙන් ඔබගේ ජීවි තය වඩාත් ලස්සන වන අතර එය උනන්දුවෙන් තොර වෙනවා ඇත. දෙවි තමාව සරලම ආකාරයට ප්‍රේමයෙන් ඔබට දෙන බව ඔබ තේරුම් ගන්නවා ඇත. කුඩා දරුවෙනි මා ඔබට දෙන වචන ඔබ තේරුම් ගන්නා පිණිස යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. එවි ට ඔබට අන්‍යයන් ප්‍රේමයෙන් පිළිගැනීමට හැකි වන අතර ඔබට

දු ෂ්ටකම් කළ සියල්ලන්ට සමාව දෙන්නට හැකි වන්නේය. යාච්ඤාවෙන් ප්‍රතිචාරය දක්වන්න. යාච්ඤාව මැවුම්කරු වන දෙවි කෙරෙහි ප්‍රේමයේ පලයක් වන්නේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තුතියි."

වර් ෂ 1997 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, අදද මා ඔබ සමග සිටින අතර මාගේ පනිවුඩවලට අනුව ජීවත් වි මෙන් ඔබව අලුත් කර ගැනීමට ඔබව කැදවමි. කුඩා දරුවෙනි යාච්ඤාව ඔබට ජීවි තය වේවා. ඔබ අන්‍යයන්ට ආදර් ශයක් වේවා. කුඩා දරුවෙනි යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. මම ඔබ සමග සිටින අතර මාගේ මාතෘ සාමයෙන් ඔබට ආශීර් වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තුතියි."

වර් ෂ 1997 නොවැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද දින ඔබගේ ක්‍රියාකාරීකම් තේරුම් ගැනීමට ඔබට කියමි. කුඩා දරුවෙනි ඔබ ඔබගේ ක්‍රිස්තියානි ක්‍රියාකාරකම් වටහා ගන්නා පිණිස මෙම අනුග්‍රහත්මක කාලයේ මම ඔබට මග පෙන්වා ඇති අතර

තවදු රටත් මගපෙන්වමින් සිටිමි. ශුද්ධ ප්‍රානපරිත්‍යාගීන් සාක්ෂිදරමින් මියගොස් ඇත. මා ක්‍රිස්තියානියෙක් වන අතර සෑම දෙයකටම වඩා දෙවි ට ප්‍රේම කරමි. කුඩා දරුවෙනි අදත් ඔබට ප්‍රීතියෙන් සිටින්නට හා ප්‍රීතිමත් ක්‍රිස්තියානින් ලෙස සිටින්නට කැදවමි. වි ශ්වාස නොකරන්නන්ට දිගු කරන ලද ප්‍රීතිමත් හස්තයන් වෙමින් සුවි ශේෂිත ආකාරයකට දෙවි කැදවා ඇති බව තේරුම් ගන්න. තවද ඔබගේ ජීවි තාදර් ශයෙන් ඔවුන්ට දෙවි ගේ ඇදහිල්ල හා ප්‍රේමය ලබා ගත හැකි වන්නේය. එබැවි න් ඔබගේ හෘදයන් වි වෘත වන පිණිසත් දෙවි ගේ වචනයට සංවේදනය වන පිණිසත් යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තුතියි."

වර් ෂ 1997 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අදත් මම ඔබ සමග ප්‍රීති වන්නෙමි. තවද මම යහපතට ඔබව කැදවමි. ඔබ සෑම කෙනෙක්ම සාමය ඔබගේ හෘදයේ තබා ගනිමින් මගේ ජීවි තයේ පළමු තැනට දෙවි ව තබා ගන්නට කැමැත්තෙමි යයි කියනවාට කැමැත්තෙමි. මෙයාකාරයෙන් කුඩා දරුවෙනි ඔබ සෑමකෙනෙකුටම ශුද්ධ වන්නට පුළුවන. කුඩා දරුවෙනි ඔබට යහපත වි ම මට අවශ්‍ය කරවන බවත් ඔහු යහපතෙන් ප්‍රතිචාරය දක්වන බවත් සැමෝටම කියන්න. එමෙන්ම කුඩා දරුවෙනි පහපත සෑම මනුෂ්‍යයෙකුගේම හෘදයේ පවතින්නට යෙදෙනවා ඇත. කුඩා දරුවෙනි අද රාත්‍රියේ මගේ පුතාගේ යහපත මම ඔබ වෙතට ගෙනෙන්නෙමි. ඔහු ඔබව ගලවා ගන්නා පිණිස තමාගේ ජීවි තය

දු න්නේය. කුඩා දරුවෙනි ප්‍රීතියෙන් සිට යහපත්ව සිටින ඔහු වෙතට ඔබගේ අත දිගු කළ යුත්තේ එනිසාය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තුතියි."

1998

වර් ෂ 1998 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, අද නැවතත් මම ඔබව යාච්ඤාවට කැඳවමි. ඔබගේ හෘදය වෙනස් වන්නේ වඩාත් හොඳ වන්නේ හා දෙවි ගේ වචනයට වඩා සංවේදී වන්නේ යාච්ඤාවෙන් පමණකි. ඔබව කොටස් කර ඔහුට උවමනා දෙය ඔබගෙන් කර ගැනීමට කුඩා දරුවෙනි සාතන්ට ඉඩ නොදෙන්න. වගකීම් සහිත වන්නටත් තීරණාත්මකව සැමදා දෙවි ට කැප වන්නටත් මම ඔබව කැඳවමි. පූජාව පුරුද්දක් නොව ජීවයක් කර ගන්න. පූජාත්මකව සිටීමෙන් සෑම දිනකම ශුද්ධභාවය සඳහා අවශ්‍යතාව ඔබට දැනෙන අතර ඔබ ශුද්ධකමෙන් වැඩෙනවා ඇත. මා ඔබට ලඟින් සිටින අතර ඔබ වෙනුවෙන් දෙවි ඉදිරියේ අතරමැදිකම් කරමි. එවි ට ඔබගේ හෘදය වෙනස් කර ගැනීමට ඔහු ඔබට ශක්තිය දෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1998 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, අදත් මම ඔබ සමග සිටින අතර ඔබගේ යාච්ඤාවන්ගෙන් මට තවත් ලං වෙන ලෙස ඉල්ලමි. මෙම අනුග්‍රහත්මක කාලයේ නැවත අලුත් වෙන්නට මම ඔබව කැඳවමි. කුඩා දරුවෙනි යේසුස් ඔබ සෑම කෙනෙක් වෙනුවෙන්ම
දු ක් වි ද මිය ගිය ආකාරය
මෙනෙහි කර ඔබගේ කුඩා පරිත්‍යාගයන්ගෙන් ජීවත් වෙන්න. යේසුස් ඔබ සෑම කෙනෙකුටම ඇති අසීමිත ප්‍රේමය ඔබ තේරුම් ගන්නේ ඔබ ඔහුට ලං වුවහොත් පමණකි. මා ඔබට ප්‍රේම කරන අතර ආශීර් වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1998 මාර් තු 25

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැඳවන්නේ නිරාහාරව සිටින්නටත් නිවැරදි වෙන්නටත්ය. කුඩා දරුවෙනි ඔබට යේසුස්ට ලංව සිටින්නට බාධා කරන දෙය වෙනස් කරන්න. යාච්ඤා කරන ලෙස වි ශේෂිත ආකාරයකට මම ඔබට කියමි. මන්දයත් ඔබගේ කැමැත්ත යටපත් කරන්නටත් කුඩා කාරණාවලදී පවා දෙවි ගේ කැමැත්ත දැන ගන්නටත් හැකි වන්නේ එමගින් පමණකි. ඔබගේ දෛනික ජීවි තයෙන් කුඩා දරුවෙනි ඔබ ආදර් ශයක් වෙමින් ඔබ යේසුස් සඳහා ජීවත් වෙනවාද නැතහොත් ඔහුට හා ඔහුගේ කැමැත්තට එරෙහිව සිටිනවාද යන්න පෙන්වන්නෙහිය. කුඩා දරුවෙනි ඔබ ප්‍රේමයේ ප්‍රේරිතයන් වෙනවාට කැමැත්තෙමි. ප්‍රේම කිරීමෙන් කුඩා දරුවෙනි ඔබ මගේ බව ඔබ තේරුම් ගන්නවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1998 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, මලක් ඉරු රැස්වලට පිබිදෙන්නාක් මෙන් යාච්ඤාවෙන් ඔබව දෙවි ට වි වෘත කරන ලෙස අද ඉල්ලා සිටිමි. කුඩා දරුවෙනි භය නොවන්න. මා ඔබ සමග සිටින අතර ඔබගේ හෘදයන් වෙනස් කිරීමේ දීමනාව ලබන පිණිස ඔබ වෙනුවෙන් දෙවි ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. ඔබ අනුග්‍රහයේ වැදගත්කම මේ කාලයේ තේරුම් ගන්නේ දෙවි ඔබ වෙතට ලං වෙන්නේත් කුඩා දරුවෙනි මෙයාකාරයෙන් පමණකි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1998 මැයි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා යාච්ඤාවෙන් හා යාගයෙන් ඔබව කැඳවන්නේ ශුද්ධාත්මයේ පැමිණීමට සූදානම් වන ලෙයසි. කුඩා දරුවෙනි මෙය අනුග්‍රහයේ කාලයක් වන අතර එනිසා මැවුම්කරු වන දෙවි උදෙසා තීරණයක් ගන්නා ලෙස ඉල්ලමි. ඔබව වෙනස් කරන්නට ඔහුට ඉඩ දෙන්න. ඔබ සෑම කෙනෙක් වෙනුවෙන්ම ශුද්ධාත්මයට ඇති සැලැස්මට සවන් දෙන්නට හා ඒ අනුව ජීවත් වෙන්නට ඔබගේ හෘදය සූදානම්ව තිබේවා. කුඩා දරුවෙනි ශුද්ධාත්මයට සත්‍යයේ හා සදාකාල ජීවි තයේ ගැලවි මේ මාර් ගයේ ඔබට මගපෙන්වන්නට ඉඩ දෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1998 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, ඔබ මගේ පණිවුඩවලට අනුව ජීවත් වූ නිසා මම අද ඔබට ස්තූති කරන්නට කැමැත්තෙමි. මාගේ මාතෘ ආශීර්වාදයෙන් මා ඔබ සියල්ලන්ට ආශීර්වාද කර මාගේ පුත් යේසුස් ඉදිරියට ඔබව ගෙනෙන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1998 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, යේසුස් සමග යාච්ඤාවෙන් සිටින්නට මම අද ඔබට ආරාධනා කරමි. මන්දයත් යාච්ඤාවේ පුද්ගලික අද්දැකීමෙන් දෙවිගේ මැවිලිවල අලංකාරය ඔබට දැකිය හැකි වනු ඇත. ඔබ යාච්ඤා නොකරන්නේ නම් ඔබට ඒ ගැන කථා කරන්නට හෝ සාක්සි දරන්නට නුපුළුවන. ඔබ හෘදයේ නිහඬතාවයෙන් යේසුස් සමග රැඳී සිටිය යුත්තේ කුඩා දරුවෙනි එනිසාය. එවිට ඔහු තමාගේ ප්‍රේමයෙන් ඔබව වෙනස් කරනවා ඇත. කුඩා දරුවෙනි මෙය ඔබට අනුග්‍රහයේ කාලයකි. ඔබගේ පුද්ගලික වෙනස් වීමටත් එයින් හොඳ ප්‍රයෝජන ගන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1998 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, අද දින යාච්ඤාවෙන් තවත් මට ලං වන්නට මා ඔබට ආරාධනා කරමි. කුඩා දරුවෙනි ඔබගේ මව මමයි. මා ඔබට ප්‍රේම කරන අතර ඔබ සැම කෙනෙක්ම ගැලවී මා සමග ස්වර්ගයේ සිටිනවාට මම කැමැත්තෙමි. ඔබගේ ජීවිතය යාච්ඤාවක් වෙනතෙක් ඔබ යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1998 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, ඔබගේ පියවරුන්ගේ ඇදහිල්ලට අනුව ජීවත් වීමෙන් මාගේ සාක්සිකරුවන් වන්නට මම අද ඔබට ආරාධනා කරමි. කුඩා දරුවෙනි ඔබ සලකුණු හා පණිවුඩ සොයන්නෙහිය. එහෙත් සෑම දිනකම ඉරු උදාවත් සමග දෙවි ඔබට හැරෙන්නටත් සත්‍යයේ හා ගැලවීමේ මාර්ගයට එන්නටත් ආරාධනා කරන බව නොදකින්නෙහිය. කුඩා දරුවෙනි ඔබ හුගක් කථා කලත් ඔබගේ හැරීම ගැල කටයුතු කරන්නේ ටිකකි. ඔබගේ වචනයෙන් නොව ජීවිතයෙන් හැරී මාගේ පණිවුඩ අනුව ජීවත් විය යුත්තේ එනිසාය. මෙයාකාරයෙන් කුඩා දරුවෙනි හෘදයේ සැබෑ හැරීමට තීරණයක් ගැනීමට ඔබට ශක්තිය ලැබෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1998 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, අද දින මාගේ පිරිසිදු හෘදයට ලං වෙන්නට ඔබට ආරාධනා කරමි. මා ඔබව නිරාහාරව යාච්ඤාවට හා හැරී සිටින්නට කැඳවූ මුල් දිනවල ඔබගේ කැපවීම ඔබගේ පවල්වල අලුත් කර ගැනීමට කැඳවමි. කුඩා දරුවෙනි ඔබ යාච්ඤාව කුමක්දැයි නොදැන සිටියත් ඔබ මාගේ පණිවුඩ විවෘත හෘදයන්ගෙන් පිළිගත්තෙහිය. අද දින මා ඔබව කැඳවන්නේ ඔබව සම්පූර්ණයෙන්ම මට විවෘත කරන්නටයි. එවිට මට ඔබව වෙනස් කර මාගේ පුත් යේසුස්ගේ හෘදය වෙතට මගපෙන්වන්නට පුළුවන. එවිට ඔහු තමාගේ ප්‍රේමයෙන් ඔබව පුරවනවා ඇත. කුඩා දරුවෙනි ඔබට සැබෑ සාමය එනම් දෙවි දෙන සාමය සොයා ගත හැක්කේ මෙයාකාරයෙන් පමණකි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 1998 නොවැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව කැඳවන්නේ යේසුස්ගේ පැමිණීමට ඔබව සූදානම් කර ගැනීමටය. වි ශේෂිත ආකාරයකට ඔබගේ හෘදයන් සූදානම් කර ගන්න. ඔබගේ හැරීමට පළමු ක්‍රියාව පසුතැවි ල්ල වේවා. අනතුරුව කුඩා දරුවෙනි ශුද්ධකමට තීරණයක් ගන්න. ඔබගේ හැරීමට හා ශුද්ධකමට තීරණය හෙට නොව අදම
සිදු වේවා. කුඩා දරුවෙනි මා ඔබ සියල්ලන්ව ගැලවී මේ මාර් ගයට කැඳවමි. ඔබට ස්වර් ගයට මාවත පෙන්වන්නට කැමැත්තෙමි. ඔබ මාගේ වෙමින් ශුද්ධකමට මා සමග තීරණයක් ගත යුත්තේ එනිසාය. බලගතු ලෙස යච්ඤාව පිළිගෙන ඔබ යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1998 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මෙය නත්තල් ප්‍රීතිය වන අතර මාගේ ආශීර් වාදයෙන් ඔබට ආශීර් වාද කරන්නට කැමැත්තෙමි. කුඩා දරුවෙනි වි ශේෂ ආකාරයකට මම කුඩා යේසුස්ගේ ආශීර් වාදය ඔබට දෙමි. ඔබ තමාගේ සාමයෙන් ඔබව පුරවාවා. අද දින කුඩා දරුවෙනි ඔබට සාමය නැති අතර ඔබ එය සොයන්නෙහිය. මාගේ පුත් යේසුස් සමග යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. කියා මා ඔබගෙන් ඉල්ලන්නේ එනිසාය. මන්ද යාච්ඤාව නොමැතිව ඔබට ප්‍රීතිය නැත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1988 දෙසැම්බර් 25

වන දින ජාවොක්ට වාර් ෂික පෙනීසිටීම් පෙ.ව. 11.50ට ආරම්භ වී වි නාඩි12ක් වූ පෙනීසිටීමෙන් පසු ජාවොක් මෙසේ ලිව්වේය:

අපගේ මව ප්‍රීතියෙන් සිටියා. යේසුස්ට ප්‍රසංසා වේවා යනුවෙන් ඇය මට සුභ පැතුවා. ඇය රහස් ගැන මට කථා කර පසුව මෙම පණිවුඩ
දු න්නා.

ප්‍රිය දරුවෙනි අද මාගේ පුතාගේ උපන් දිනයේ මාගේ හදවත අසීමිත ප්‍රීතියකින් ප්‍රේමයෙන් හා සාමයෙන් පිරී ඇත. ඔබගේ මව හැටියට එම ප්‍රීතිය සාමය හා ප්‍රේමය ඔබගේ හදවත්වල ඔබ සෑම කෙනෙකුටම දැනෙනවාට කැමැත්තෙමි. ඔබගේ හදවත වි වෘත කිරීමට හා ඔබව සහමුලින්ම යේසුස්ට භාර දීමට ඔබ භය නොවි ය යුත්තේ එනිසාය. මන්දයත් ඔහුට ඔබගේ හෘදයට ඇතුල් වී එය ප්‍රේමයෙන් සාමයෙන් හා ප්‍රීතියෙන් පිරවි ය හැක්කේ එයාකාරයෙන් පමණකි. මාගේ මාතෘ ආශීර් වාදයෙන් මා ඔබට ආශීර් වාද කරමි.

ජාවොක් තමාගේ පවුලත් සමග යාච්ඤා කලේය. පසුතැවි ල්ල හා පූජාව සමග ඔහු මෙම පෙනීසිටීම සඳහා තමාව සූදානම් කර ගත්තේය. එම පෙනී සිටීමෙන් පසු ඔහු මොහොතකට හැඬුවේය.

වර් ෂ 1999 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, නැවතත් යාච්ඤාවට මා ඔබව කැඳවමි. ස්වභාව ධර් මය තවමත් ගැඹුරු නින්දේ පසුවන බැවි න් වැඩ කරන්නට ඔබට නිදහසක් නැත. යාච්ඤාවෙන් ඔබව වි වෘත කරන්න. ඔබගේ පවුල්වල යාච්ඤාව අලුත් කර ගන්න. ශුද්ධ වචනය ඔබගේ පවුලේ පෙනෙන තැන තබා එය කියවා එය මෙනෙහි කර දෙවි තමාගේ ජනයාට ප්‍රේම කරන ආකාරය ඉගෙන ගන්න. ඔහුගේ ප්‍රේමය වර් තමාන කාලයේද පෙනෙන්නට ඇත. මන්දයත් ගැලවී මේ මාවතට ඔබව කැඳවන්නට ඔහු මාව එවා ඇත්තේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1999 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, මාගේ හෘදයේ යේසුස්ගේ ප්‍රේමය මෙනෙහි කරමින් විශේෂිත ආකාරයකට අදත් මා ඔබ සමග සිටිමි. කුඩා දරුවෙනි ඔබගේ හෘදයන් විවෘත කර ඒවායේ ඇති සියල්ලම එනම් ප්‍රීතිය දු ක මෙන්ම කුඩා වේදනාව පවා මට දෙන්න. එවිට මම එය යේසුස්ට ඔප්පු කරන්නෙමි. එවිට ඔහු ඔබගේ දු ක පුලුස්සා තමාගේ නැවත නැගිටීමේ ප්‍රීතියට එය හරවනවා ඇත. කුඩා දරුවෙනි මා ඔබව දැන් විශේෂිත ආකාරයකට කැඳවන්නේ එනිසාය. ඔබගේ හෘදයන් යාච්ඤාවට විවෘත කරන්න. එවිට යාච්ඤාව තුලින් ඔබ යේසුස්ගේ මිත්‍රයෙක් වන්නෙහිය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1999 මාර්තු 25

ප්‍රිය දරුවෙනි, හෘදයේ යාච්ඤාවට මා ඔබව කැඳවමි. කුඩා දරුවෙනි මා ඔබව විශේෂිත ආකාරයකට කැඳවන්නේ පව්කාරයන්ගේ මෙන්ම මාගේ හා මාගේ පුත්‍ර යේසුස්ගේ හෘදය වෛරයේ හා බොරුවේ කඩුවෙන් අනින්නාවූ අයගේ හැරීමට යාච්ඤා කරන්නටයි. දේව වචනය නොදන්නා අය සඳහා කුඩා දරුවෙනි අපි යාච්ඤා කරමු. එවිට පල්ලිය ප්‍රේමයෙන් නැවත නැගිටිනවා ඇත. කුඩා දරුවෙනි හැරීම සඳහා ඔබට දෙන ලද මෙම කාලයේ ඔබට ජීවත් විය හැක්කේ ප්‍රේමයෙන් හා යාච්ඤාවෙන් පමණකි. දෙවිව පළමු තැනට තබන්න. එවිට නැවත නැගිටුන යේසුස් ඔබගේ මිත්‍රයා වන්නේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1999 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව යාච්ඤාවට කැඳවමි. කුඩා දරුවෙනි සාමය නොමැති මෙම ලෝකයේ සාමයේ ප්‍රීතිමත් දරන්නන් වන්න. නිරාහාරව සිටීමෙන් හා යාච්ඤාවෙන් ඔබ මාගේ බවත් මාගේ පණිවුඩ අනුව ජීවත් වන බවත් සාක්ෂි දරන්න. යාඥා කර සොයන්න. ඔබ හැරෙන පිනිස එමෙන්ම ඔබගේ ජීවිතය නිතර ක්‍රිස්තියානි වී ම සඳහා මා ඔබ වෙනුවෙන් යාච්ඤා කර දෙවි ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1999 මැයි 25

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැඳවන්නේ හැරෙන්නටත් වැඩිස්ථීරත්වයකින් දෙවි කෙරෙහි විශ්වාස කරන්නටත්ය. දරුවෙනි ඔබ සාමය සොයා වෙනස් ආකාරවලට යාච්ඤා කරන්නෙහිය. එහෙත් ඔබගේ හදවත් ප්‍රේමයෙන් පිරවී ම සඳහා ඔබ එය තවමත් දෙවිට ලබා දී නැත. මා ඔබ සමග සිටින්නේ ඔබට උගන්වා ඔබව දෙවිගේ ප්‍රේමය වෙතට කිට්ටු කරන්නටයි. ඔබ අන් සියල්ලට වඩා දෙවිට ප්‍රේම කරනවා නම් එය යාච්ඤා කරන්නටත් ඔහුට ඔබගේ හෘදය විවෘත කරන්නටත් ඔබට පහසුවක් වෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1999 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, මාගේ පණිවුඩ අනුව ජීවත් වෙමින් ඔබගේ ජීවිතයෙන් එයට සාක්ෂි දැරීම වෙනුවෙන් අද මා ඔබට ස්තූති කරමි. කුඩා දරුවෙනි යාච්ඤාව ඔබට ශක්තිය හා ප්‍රීතිය ලබා දෙන පිණිස ශක්තිමත්ව සිට යාච්ඤා කරන්න. ඔබ සෑම කෙනෙක්ම මාගේ වන්නේත් මට ඔබව ගැලවී මේ මාවතේ මග පෙන්වන්නට හැකි වන්නේත් එමගින් පමණකි. කුඩා දරුවෙනි යාච්ඤා කර මාගේ මෙහි පෙනී සිටීමට ඔබගේ ජීවිතයෙන් සාක්ෂි දරන්න. සෑම දිනයක්ම දෙවිගේ ප්‍රේමය සඳහා ඔබට ප්‍රීතිමත් සාක්ෂියක් වේවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 1999 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, අද මා ඔබව කැදවන්නේ ස්වභාව ධර් මයේ වර් ණයන්ගෙන් මැවුම්කරු වන දෙවි ව මහිමවත් කරන්නටයි. ඔහු කුඩාම මලෙන් පවා ඔබට කථා කරන අතර එමගින් ඔහු ඔබව මවා ඇති ඔහුගේ ප්‍රේමයේ ගැඹුර හා ඔහුගේ අලංකාරය පෙන්වන්නේය. යාච්ඤාව අලුත් කර ඔහු ඔබට ලබා දෙන සැම දෙයක් සඳහාම ස්තූති කළ යුත්තේ එනිසාය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1999 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද යළිත් මා ඔබව කැදවන්නේ මාගේ සාමයේ වාහකයන් වන්නටයි.
වි ශේෂාකාරව දැන් දෙවි ඉතා
දු රස්ව සිටින්නේ යයි කියනු
ලබන වි ට ඔහු සැබවි න්ම කිසිකලෙක ඔබට
නුදු රුව සිට නැත. දේව වචනය කියවී මෙන් ඔබගේ පවුලේ යාච්ඤාව අලුත් කර ගන්නා ලෙස මා ඔබගෙන් ඉල්ලමි. එවි ට ඔබට සිය මැවි ලිවලට අසීමිතව ප්‍රේම කරන දෙවි හමුවී මේ ප්‍රීතිය අද්දැකිය හැකිය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1999 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, අමතක නොකරන්න. මෙය අනුග්‍රහයේ කාලයකි. එනිසා ඔබ යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1999 නොවැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැදවන්නේ යාච්ඤාවටයි. මෙම අනුග්‍රයේ කාලයේ කුරුසිය සැබෑ සාමය පැමිණෙන්නාවූ ප්‍රේමයේ හා එක්සත්කමේ මාර් ග සංඥාවක් වේවා. සැබෑ සාමයේ නිර් මාතෘ වන කුඩා යේසුස් ඔබගේ හෘදයේ උපදින පිණිස මෙම කාලයේ වි ශේෂයෙන් යාච්ඤා කරන්න. සාමය නොමැති මෙම ලෝකයේ ඔබ මාගේ සාමයේ ප්‍රේරිතයන් වන්නේ යාච්ඤාවෙන් පමණකි. යාච්ඤාව ඔබට ප්‍රීතියක් වනතෙක් ඔබ යාච්ඤා කළ යුත්තේ එනිසාය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 1999 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මෙය අනුග්‍රහයේ කාලයයි. කුඩා දරුවෙනි අද දින මගේ තුරුලේ සිටින යේසුස් සමග වි ශේෂාකාරව සාමය සඳහා තීරණයක් ගැනීමේ හැකියාව මම ඔබට දෙමි. සාමය සඳහා ඔබගේ කැමැත්ත හා දෙවි සඳහා ඔබගේ තීරණය මත සාමය සඳහා නව මාවතක් වි වෘත වේ. කුඩා දරුවෙනි මෙම ශතවර් ෂය ඔබට සාමයේ සශ්‍රීකත්වයේ කාලයක් වන්නේ මෙයාකාරයෙන් පමණකි. එබැවි න් කුඩා අලුත උපන් යේසුස්ව ඔබගේ ජීවි තයේ පළමු තැනට තබන්න. එවි ට ඔහු ඔබව ගැලවී මේ මාවතේ මගපෙන්වනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 2000 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, අත්නෑර යාච්ඤා කරන්නට මා ඔබව කැදවමි. ඔබ යාච්ඤා කළොත් ඔබ දෙවි ට සමීපව සිටින අතර ඔහු සාමයේ හා ගැලවී මේ මාවතේ ඔබට මගපෙන්වනවා ඇත. අන්‍යයන්ට සාමය දෙන්නට මා අද ඔබව කැදවන්නේ එනිසාය. සැබෑ සාමය ඇත්තේ දෙවි තුළ පමණකි. ඔබගේ හෘදය වි වෘත කර සාමයේ ත්‍යාගයක් දෙන්නාවූ කෙනෙක් වෙන්න. අන්‍යයන් ඔබ තුළ සාමය සොයා ගන්නවා ඇත. මෙයාකාරයෙන් ඔබ දෙවි ඔබට දෙන්නාවූ සාමයේ හා ප්‍රේමයේ සාක්ෂිකරුවෙක් වෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2000 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, පාපයේ හා අවි ශ්වාසයේ නින්දෙන් පිබිදෙන්න. මන්දයත් මෙය දෙවි ඔබට දෙන්නාවූ අනුග්‍රහයේ කාලයකි. ඔබට දෙවි හා මනුෂ්‍යයාව හෘදයෙන් දැකිය හැකි වන පිනිස සියල්ල පාවි ච්චි කරන්න. දෙවි ගේ ප්‍රේමය දැන ගන්නට නොයෙදු න අය වෙනුවෙන් වි ශේෂාකාරව යාච්ඤා කරන්න. ඔවුන්ටත් දෙවි ගේ අසීමිත ප්‍රේමය දැනගත හැකි වන පිණිස ඔබගේ ජීවි තයෙන් සාක්ෂිදරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

මිර් ජානා සොල්ඩෝට 2000

මාර් තු 18වන දින කරන ලද වාර් ෂික දර් ෂනය:

ප්‍රිය දරුවෙනි නිරපරාදේ සාමය හා ප්‍රීතිය වැරදි තැන්වල හා වැරදි දේවල් තුළ නොසොයන්න. නිෂ්පලත්වයට ප්‍රේම කිරීමෙන් ඔබගේ හෘදයට දැඩි වී මට ඉඩ නොදෙන්න. මාගේ පුත්‍රයාගේ නාමය ප්‍රකාශ කරන්. ඔහුව ඔබගේ හෘදයේ පිලිගන්න. ඔබගේ හෘදයේ සැබෑ ප්‍රීතිය හා සැබෑ සාමය ඔබ අද්දකින්නට හැක්කේ මාගේ පුත්‍රයාගේ නාමයෙන් පමණකි. ඔබට දෙවි ගේ ප්‍රේමය දැනගත හැක්කේත් එය තවදු රටත් පැතිරවි ය හැක්කේත් මෙයාකාරයෙන් පමණකි. මම ඔබව කැදවන්නේ මාගේ ප්‍රේරිතයන් වෙන්නටයි.

මෙම දර් ෂයනය පෙ.ව. 9.55ට ආරම්භ වී වි නාඩිඃක් පමණ පැවතිණ. අපගේ මාතාව සියල්ලන් වෙනුවෙන් යාච්ඤා කර සියල්ලන්ටම ආශීර් වාද කළාය. මිර් ජානා වි ශේෂාකාරයෙන් රෝගීන් නිර් දේශ කළාය. මෙවර අපගේ මව අභිරහස් ගැන කිසිවක් නොකිවාය.

වර් ෂ 2000 මාර් තු 25

"ප්‍රිය දරුවෙනි, යාච්ඤා කර මෙම කාලයෙන් හොද ප්‍රයෝජන ගන්න. මන්දයත් මෙය අනුග්‍රහයේ කාලයකි. මම ඔබ සමග සිටින අතර ඔබගේ හෘදය දෙවි ට දෙවි ගේ ප්‍රේමයට වි වෘතව වන පිණිස මම ඔබ වෙනුවෙන් දෙවි ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. කුඩා දරුවෙනි යාච්ඤාව ඔබට ප්‍රීතියක් වනතෙක් නොනැවතී යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 2000 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, අද මා ඔබව කැදවන්නේ හැරෙන්නටයි. ඔබ ද්‍රව්‍යමය දේවල් ගැන බොහෝ සේ සැලකිලිමත් වන අතර ආත්මික දේවල් ගැන එතරම් සැලකිලිමත් වන්නේ නැත. ඔබගේ හදවත් වි වෘත කර ඔබගේම පුද්ගලික හැරීම ගැන වෙහෙසා කටයුතු කරන්න. යාච්ඤාව ඔබ හා දෙවි අතර ප්‍රීතිමත් හමුවී මක් වනතෙක් දෙවි ට හා යාච්ඤාවට කාලයක් කැප කිරීමට තීරණය කරන්න. ඔබගේ ජීවි තය අර් තවත් වන්නේත් ප්‍රීතියෙන් ඔබ සදාකාල ජීවි තය ගැන කල්පනා කරන්නේත් මෙයාකාරයෙන් පමණකි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 2000 මැයි 25

"ප්‍රිය දරුවෙනි, මා ඔබ සමග සතුටින් සිටින අතර මෙම අනුග්‍රහයේ කාලයේ මම ආත්මිකව අලුත් වී මට ඔබව කැදවමි. කුඩා දරුවෙනි ශුද්ධාත්මය ඔබ කෙරෙහි පූර් ණ වන පිනිස යාච්ඤා කරන්න. එවි ට ඇදහිල්ල අඩු අයට ඔබට ප්‍රීතියෙන් සාක්ෂි දරන්නට හැකි වන්නේය. වි ශේෂයෙන්ම කුඩා දරුවෙනි ශුද්ධාත්මයේ දීමනාව සදහා යාච්ඤා කරන්න. එවි ට ප්‍රේමයේ

ආත්මය සෑම දිනකම හා සෑම අවස්ථාවකම ඔබ ඔබගේ සෙසු ජනයාට සමීප වන්නෙහිය. තවද එම ප්‍රඥාවෙන් හා ප්‍රේමයෙන් ඔබට සෑම අපහසුතාවයක්ම ජයගත හැකිය. මම ඔබ සමග සිටින අතර ඔබ වෙනුවෙන් යේසුස් ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2000 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව යාච්ඤාව සඳහා කැඳවමි. මම ඔබ සමග සිටින බවත් මම ඔබට ප්‍රේම කරන බවත් අමතක නොකරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2000 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, ඔබ සදාකාලයේ මාවතේ මම පොළොව මත සිටින බවත් ඔබගේ නිවස ස්වර්ගයේ බවත් අමතක නොකරන්න. ඔබ දෙවි ගේ ප්‍රේමයට වි වෘත වි ය යුත්තේත් පාපය හා අගතිය අත්හළ යුත්තේත් කුඩා දරුවෙනි එනිසාය. ඔබගේ ප්‍රීතිය දෙවි ව දෛනික යාච්ඤාවෙන් සොයා ගැනීම මත ඇති වේවා. මෙම කාලය හොඳින් ප්‍රයෝජන ගෙන ඔබ යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. එවිට දෙවි ඔබට යාච්ඤාවෙන් සමීපව සිටින්නේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2000 අගෝස්තු 25 "ප්‍රිය දරුවෙනි, මම මගේ ප්‍රීතිය ඔබ සමග බෙදා ගැනීමට කැමැත්තෙමි. මට සමීප වූ අය බොහෝ දෙනෙක් සිටින බව මගේ පිරිසිදු හෘදයෙන් මට දැනෙන අතර ඔවුන් මාගේ පිරිසිදු හෘදයේ ජයග්‍රහනය තමන්ගේ හෘදයේ උසුලාගනිමින් හැරෙමින් සිටිති. මම ඔබට ස්තූති කරන්නට කැමති අතර ඔබව තවත් වෙහෙසා දෙවි ට හා ඔහුගේ රාජ්‍යයට වැඩ කරන්නට උනන්දු කරන්නට කැමැත්තෙමි. මා ඔබ සමග සිටින අතර මාගේ මාතෘ ආශීර්වාදයෙන් ඔබට ආශීර්වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2000 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, ඔබව අද දින යාච්ඤාව සඳහා වි වෘත කරන්නට කැඳවමි. ඔබගේ යාච්ඤාව ඔබට ප්‍රීතියක් වේවා. ඔබගේ පවුල්වල යාච්ඤාව අලුත් කර යාච්ඤා කණ්ඩායම් ඇති කරන්න. මෙයාකාරයෙන් ඔබ යාච්ඤාවෙන් හා එක්සත්කමෙන් ප්‍රීතිය අද්දකිනවා ඇත. යාච්ඤා කරන සියල්ලන් හා යාච්ඤා කණ්ඩායම්වලට අයත් අය සිය හෘදයෙන් දෙවි ගේ කැමැත්තට වි වෘත වී සිටින අතර ප්‍රීතියෙන් දෙවි ගේ ප්‍රේමයට සාක්ෂි දරන්නෝය. මා ඔබ සමග සිටිමි. මා ඔබ සියල්ලන්ව මාගේ හදවතේ උසුලාගෙන යමි. මා ඔබට මාගේ මාතෘ ආශීර්වාදයෙන් ආශීර්වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2000 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, අද මා මාගේ මාතෘ හෘදය ඔබට වි වෘත කරන්නට කැමති අතර මාගේ අභිප්‍රායන් සඳහා යාච්ඤා කරන්ට ඉල්ලමි. ඔබ සමග යාච්ඤාව අලුත් කරන්නට මා කැමති අතර මාගේ පුත් යේසුස්ට මා ඔප්පු කරන්නට කැමති වූ නිරාහාරව සිටින්නට ඔබෙන් ඉල්ලමි. මෙය ශීත ඍතුව නිසා ඔබ කළ යුතුය. මෙම ජුබිලි වසරේ බොහෝ හදවත් මා හට වි වෘත වී ඇති අතර පල්ලිය ආත්මයෙන් අලුත් වෙමින් පවතී. මා ඔබ සමග ප්‍රීතිවන්නෙමි. මම දෙවි ට මෙම ත්‍යාගයට ස්තූති කරමි. කුඩා දරුවෙනි මා ඔබට කියන්නේ ඔබ යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. එවිට එය ඔබට සන්තෝෂයක් වෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2000 නොවැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, විශේෂිත ආකාරයකට අද්දින ඔබට ස්වර්ගය සමීපව ඇති විට මා ඔබට කියන්නේ යාච්ඤා කරන ලෙයසි. එවිට ඔබට ඔහුව පළමු ස්ථානයට තබා ගත හැකිය. කුඩා දරුවෙනි අද මා ඔබට සමීපව සිටිමි. මා ඔබ සෑම දෙනෙකුවම මාගේ මාතෘ ආශීර්වාදයෙන් ආශීර්වාද කරමි. එවිට ඔබට ඔබගේ භූමික ජීවිතයේ හමුවන සියල්ලන් සඳහා දෙවිගේ ප්‍රේමය ලබා දීම සඳහා ඔබට ශක්තියක් හා ප්‍රේමයක් තිබෙනවා ඇත. මා ඔබ සමග සතුටු වන අතර ඔබ වෙනුවෙන් ස්වර්ගයේ අතරමැදිකම් කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 2000 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද්දින දෙවි මට කුඩා යේසුස්ව මාගේ තුරුලේ ඇතිව ඔබ සමග සිටින්නට අවසර ලබා දී ඇති විට මා ඔබ සමග ප්‍රීතිවන අතර මෙම ජුබිලි වසරේ ඔහු කර ඇති සියල්ල වෙනුවෙන් දෙවිට ස්තූති කරමි. දෙවිට සම්පූර්ණයෙන්ම එසේය කියා කියූ සියල්ලන්ගේ එම අවස්ථාවන්ට ස්තූති කරමි. මාගේ ආශීර්වාදයෙන් හා අලුත උපන් යේසුස්ගේ ආශීර්වාදයෙන් මා ඔබ සියල්ලන්ට ආශීර්වාද කරමි. ඔබගේ හදවත්වල ප්‍රීතිය උපදින පිණිස ඔබ සියල්ලන් වෙනුවෙන් මා යාච්ඤා කරන අතර එසේ ඔබට මට අද දින ඇති ප්‍රීතියේ වාහකයන් වන්නට පුළුවන. මෙම දරුවා තුළින් ඔබගේ හෘදයන්හි ගැලවුම්කරු මා ගෙනෙන අතර ඔහු ජීවිතයේ ශුද්ධකම වෙතට ඔබව කැඳවන තැනැත්තා වන්නේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 2000 දෙසැම්බර් 25

දින ජොක් කොලොට වාර්ෂික දර්ෂනයී වර්ෂ 1998 සැප්තැම්බර් 12වන දින ජොක් කොලෝට කළ මුල් දර්ෂනයේදී අපගේ මාතාව ඔහුට වසරකට වරක් සෑම වසරකම දෙසැම්බර් මස 25වන දින දර්ෂනයක් ලැබෙන බව පැවසුවාය. මෙම වසරේ එය එසේම සිදු වි ය. දර්ෂනය ප.ව. 3.20ට පටන්ගෙන විනාඩි10ක් පැවතුනි. අපගේ මාතාව ප්‍රීතිමත්ව ළදරු යේසුස්ව සිය අතේ ඇතිව පැමිනියාය. ඇය සැමෝටම ආශීර්වාද කර පණිවුඩයක් ලබා දු න්නාය.

ප්‍රිය දරුවෙනි අද යේසුස් ඉපදු න අතර ඔහුගේ උපතෙන් අසීමිත ප්‍රීතියක් ප්‍රේමයක් හා සාමයක් ලැබුණි. යේසුස්ට එසේයයි කියන්නට මම ඔබව විශේෂිත ආකාරයකට කැඳවමි. ඔබගේ හෘදයන්ට යේසුස් ඇතුල් වන පිණිස එය විවෘත කරන්න. ඔහු එහි සිට ඔබ තුළ ක්‍රියා කරන්නට යෙදෙනවා ඇත. ඔබට දෙවිගේ ප්‍රේමයේ ප්‍රීතියේ හා සාමයේ සැබෑ ලස්සන තේරුම් ගත හැක්කේ එයාකාරයෙන් පමණකි. ප්‍රිය දරුවෙනි යේසුස්ගේ උපතෙහි ප්‍රීතිමත් වී යේසුස්ට විවෘත නොවූ සියලුම හදවත් වෙනුවෙන් යාච්ඤා කරන්න. එවිට යේසුස් එම සෑම හදවතකටම ඇතුල් වී වැඩ කරන්නට පටන් ගන්නවා ඇත. තවද එම සෑම කෙනෙක්ම දෙවි ක්‍රියා කරන්නාවූ සැබෑ පුද්ගලික ආදර්ෂයක් වෙනවා ඇත.

2001

වර්ෂ 2001 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, මම අද්දින ඔබව කැඳවන්නේ යාච්ඤාව අලුත්කර නිරාහාරව සිටින්නටයි. යාච්ඤාව ඔබට ප්‍රීතියක් වෙනතෙක් උනන්දු වෙන් ඔබ එසේ කළ යුතුයි. කුඩා දරුවෙනි යාච්ඤා කරන තැනැත්තේ අනාගතය ගැන භය නැති අතර නිරාහාරව සිටින තැනැත්තේ නපුර ගැන භය වන්නේද නැත. නැවතත් මම ඔබට කියමි. යුද්ධ පවා

නැවැත්වි  ය හැක්කේ යාච්ඤාවෙන් හා නිරාහාරව සිටීමෙන් පමණකි. එම යුද්ධ නම් ඔබගේ නොඇදහිල්ල හා අනාගතය කෙරෙහි ඇති භය යනාදියයි. කුඩා දරුවෙනි මා ඔබ සමග සිටින අතර මම ඔබට උගන්වමින් සිටිමි. ඔබගේ සාමය හා බලාපොරොත්තුව ඇත්තේ දෙවි  තුළය. ඔබ දෙවි   වෙතට ලං වී   ඔහුව ඔබගේ ජීවි  තයේ පළමු තැනට තබා ගත යුත්තේ එනිසාය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි."

වර් ෂ 2001 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, මෙය අනුග්‍රහය සඳහා කාලයකි. ඔබ එක් එක්කෙනාට ඇති දෙවි  ගේ ප්‍රේමය තේරුම් ගන්නාතෙක් ඔබ යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි."

වර් ෂ 2001 මාර් තු 25

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැඳවන්නේ යාච්ඤාවට ඔබව වි  වෘත කරවන්නයි. කුඩා දරුවෙනි ඔබ ජීවත් වන්නේ දෙවි   මහත් අනුග්‍රහයන් ලබා දෙන කාලයකයි. එහෙත් එයි හොඳ ප්‍රයෝජන ගන්නා හැටි ඔබ නොදන්නෙහිය. ඔබ අන් සියල්ල ගැන සැලකිල්ල දක්වන්නෙහිය. එහෙත් ඔබ ආත්මය හා ආත්මික ජීවි  තය ගැන කල්පනා කරන්නේ ටිකයි. ඔබගේ ආත්මයේ වෙහෙසකර නින්දෙන් අවදි වී   ඔබගේ මුළු ශක්තියෙන් දෙවි  ට එසේ යයි කියන්න. හැරීමට හා ශුද්ධකමට තීරණයක් ගන්න. කුඩා දරුවෙනි මා ඔබ සමග සිටින අතර මා ඔබව කැඳවන්නේ ඔබගේ ආත්මයේ හා ඔබ කරන සියල්ලේ සම්පූර් ණකමටය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි."

වර් ෂ 2001 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැඳවන්නේ යාච්ඤාවටයි. කුඩා දරුවෙනි යාච්ඤාවෙන් ප්‍රාතිහාර් යයන් කළ හැකිය. ඔබ වෙහෙසට පත්ව රෝගීව සිටින වි  ට හා ඔබගේ ජීවි  තයේ අර් තය නොදන්නා වි  ට කොන්තය රැගෙන යාච්ඤා කරන්න. යාච්ඤාව ඔබගේ ගැලවුම්කරු සමග ප්‍රීතිමත් හමුවක් වෙනතෙක් යාච්ඤා කරන්න. කුඩා දරුවෙනි මා ඔබ සමගයි. එමෙන්ම මා ඔබ වෙනුවෙන් අතරමැදිකම් කරමින් යාච්ඤා කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි."

වර් ෂ 2001 මැයි 25

"ප්‍රිය දරුවෙනි, මෙම අනුග්‍රහයේ කාලයේ මා ඔබව යාච්ඤාවට කැඳවමි. කුඩා දරුවෙනි ඔබ බොහෝ සේ වැඩ කළත් ඔබට දෙවි  ගේ ආශීර් වාදය නැත. මෙම කාලයේ ඔබට මගෙපන්වන්නට ශුද්ධාත්මයේ ප්‍රඥාව සොයන්න. එවි  ට මෙම කාලයේ අනුගහය තේරුම්ගෙන ඔබට ජීවත්වන්නට හැකිය. කුඩා දරුවෙනි හැරී ඔබගේ හෘදයේ නිහඬතාවයෙන් දනගසන්න. ඔබ අතරට දෙවි  ව තබා ගන්න. එවි  ට දෙවි   නොකඩවා ඔබගේ ජීවි  තයට ලබා දෙන්නාවූ ලස්සන ගැන ඔබට සාක්ෂිදරන්නට හැකිය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි."

වර් ෂ 2001 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, මම ඔබ සමග සිටින අතර මගේ මාතෘ ආශීර් වාදයෙන් ඔබට ආශීර් වාද කරමි. වි  ශේෂයෙන්ම දෙවි   ඔබට අපමන අනුගහයන් දෙන්නාවූ අද්දින යාච්ඤා කර මා තුළින් දෙවි  ව සොයන්න. දෙවි   ඔබට මහත් අනුග්‍රහයන් දෙන්නේය.
මෙම අනුග්‍රහයේ කාලය ඔබ ප්‍රයෝජනයට ගත යුත්තේත් මාගේ පුත් යේසුස් වෙතට ඔබව ගෙන යා හැකි ලෙසින් ඔබ මගේ හදවතට ලං වි  ය යුත්තේත් එනිසාය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී  ම ගැන ස්තූතියි."

වර්ෂ 2001 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, මෙම අනුග්‍රහයේ කාලයේ ඔබගේ පුද්ගලික යාච්ඤාවෙන් දෙවි ට වඩාත් ලංවන ලෙස මා ඉල්ලමි. වි වේක කාලයෙන් හොඳ ප්‍රයෝජන ගෙන ඔබගේ ආත්මයට හා ඇස්වලට දෙවි තුළ වි වේකය දෙන්න. ස්වභාව ධර්මයෙන් සාමය සොයන්න. එවි ට ඔබට මැවුම්කරු වන දෙවි ව සොයා ගත හැකි අතර සියලුම මැවි ලිවලට ඔහුට ස්තූති කරන්නට ඔබට හැකි වන්නේය. ඔබට ඔබගේ හෘදයේ ප්‍රීතියද සොයා ගත හැකි වන්නේය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2001 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, අද දින ඔබ සියල්ලන්ව ශුද්ධකම සඳහා තීරණයක් ගැනීමට කැඳවමි. කුඩා දරුවෙනි ඔබගේ සිතුවි ලිවල හා ඔබගේ සෑම අවස්ථාවකම, ක්‍රියාවෙහි හා කථාවෙහි ශුද්ධකම පළමුතැනට පැමිණේවා. මෙලෙසින් ඔබ ටිකෙන් ටික පියවරෙන් පියවර එය ක්‍රියාවට නගනවා ඇත. යාච්ඤාව හා ශුද්ධකම ඔබට ඇතුල් වෙනවා ඇත. කුඩා දරුවෙනි ඔබගේ ජීවි තය මලක්මෙන් ගතවන බව අමතක නොකරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2001 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, වි ශේෂාකාරයෙන් අද්දින සාතන්ට යුද්ධය හා වෛරය අවශ්‍යකරවන වි ට අදත් මා ඔබව කැඳවන්නේ යාච්ඤාවටයි. කුඩා දරුවෙනි මා අලුතෙන් ඔබට කියන්නේ දෙවි ඔබට සාමය දෙන පිණිස යාච්ඤා කර නිරාහාරව සිටින්න කියාය. සෑම හදවතකටම සාමය සාක්ෂි දරා සාමය නොමැති මම ලොන්කයේ සාමය දරන්නන් වෙන්න. මම ඔබ සමග සිටින අතර ඔබ සෑම කෙනෙක් වෙනුවෙන්ම දෙවි ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. තවද ඔබ භය වි ය යුතු නැත. ඔබ වෙනුවෙන් යාච්ඤා කරන්නා නපුර වෙනුවෙන් භය නොවන අතර හදවතේ වෛරයක්ද නොදරයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2001 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, අද මා ඔබට කියන්නේ මුළු හදවතින් යාච්ඤා කරන ලෙසත් අන්‍යයන්ට ප්‍රේම කරන ලෙසත්ය. කුඩා දරුවෙනි සාමය හා ප්‍රීතිය වෙනුවෙන් සාක්ෂි දරන්නට ඔබව තෝරා ගෙන ඇත. සාමය නැත්නම් යාච්ඤා කරන්න. එවි ට සාමය ලැබේ. ඔබ හා ඔබගේ යාච්ඤාව මගින් කුඩා දරුවෙනි සාමය ලොව පුරා ගලා යනවා ඇත. කුඩා දරුවෙනි ඔබ යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. මන්දයත් යාච්ඤාව මනුෂ්‍ය හදවත් හා ලෝකයේ ප්‍රාතිහාර්යයන් කරන බැවි නි. මා ඔබ සමග සිටින අතර යාච්ඤාව පිළිගෙන ඒ අනුව ජීවත් වෙන ඔබ සෑම කෙනෙක් වෙනුවෙන්ම මා දෙවි ට ස්තූති කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2001 නොවැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මෙම අනුග්‍රහයේ කාලයේ යාච්ඤාවෙන් අලුත් වෙන ලෙස ඉල්ලමි. කුඩා දරුවෙනි යාච්ඤා කරන්න. එසේ සාමයේ රජානන්ගේ පැමිණීමට සූදානම් වෙන්න. එසේ ඔහුගේ ආශීර්වාදයෙන් ඔහු ලෝකයට සාමය ලබා දෙනවා ඇත. සාමය නොමැතිකම හදවත්වල රජයන අතර වෛරය ලෝකයේ රජකම් කරයි. මාගේ පණිවුඩ අනුව ජීවත් වන ඔබ ආලෝකයේ සිටිය යුත්තේත් සියල්ලන් දෙවි ව
හඳු නා ගන්නා පිණිස ඇඳහිල්ල නොමැති ලෝකය අත දිගු කළ යුත්තේත් එනිසාය. මා ඔබ සමග සිටින බවත් මා ඔබට ආශීර්වාද කරන බවත් අමතක නොකරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2001 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මා අද ඔබව දැකවන්නේ සාමය උදෙසා යාච්ඤා කරන්නට උනන්දු කරන්නයි. අද දින විශේෂයෙන්ම අලුත උපන් යේසුස්ව අත්දරා මා ඔබව කැදවන්නේ යාච්ඤාවෙන් ඔහු සමග එක්සත් වන ලෙසත් මෙම සාමය නොමැති ලෝකයට ලකුණක් වෙන ලෙසටත්ය. කුඩා දරුවෙනි එකිනෙකාව යාච්ඤාවට හා ප්‍රේමයට දිරිගන්වන්න. ඔබගේ ඇදහිල්ල විශ්වාස කරන්නටත් තවත් ප්‍රේම කරන්නටත් අන්‍යයන්ට දිරිගැන්වීමක් වේවා. මා ඔබට ආශීර්වාද කරන අතර මගේ හා කුඩා යේසුස්ගේ හදවතට ලගින් සිටින්නටත් කැදවමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 2001 දෙසැම්බර් 25වන දින ජේවොක්ට වාර්ෂික දර්ෂනය

වර්ෂ 1998 සැප්තැම්බර් 12වන දින ජේවොක්ට කළ පසුගිය දෛනික දර්ෂනයේදී දෙසැම්බර් 25වන නත්තල් දිනයේද දර්ෂනයක් ලැබෙන බව කිව්වා. මෙම වසරේ එය සිදු වූයේ මෙලෙයසි. දර්ෂනය ප.ව. 3.30ට ආරම්භ වී විනාඩික් පැවතුනා. අපගේ මාතාව පහත දැක්වෙන පණිවුඩය දුන්නාය.

ප්‍රිය දරුවෙනි අදදින යේසුස් ඔබට අලුතෙන් ඉපදී සිටින විට විශේෂිත ආකාරයට ඔබව වෙනස් වෙන්නට කැදවන්නට කැමැත්තෙමි. හදවතේ හැරීම සදහා ඔබ යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. එසේ යේසුස් ඔබ තුළ ඉපදී ඔබ තුළ ජීවත් වී ඔබ සැම පාලනය කරනවාඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

2002

වර්ෂ 2002 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, මෙම අවස්ථාවෙහි ඔබ තවමත් පසුගිය වසර දෙස බලමින් සිටින විට මට ඔබට කියන්නේ කුඩා දරුවෙනි ඔබගේ හදවතේ ගැඹුරින් බලන ලෙසත් දෙවිට හා යාච්ඤාවට කිට්ටුවෙන් සිටින ලෙසත්ය. කුඩා දරුවෙනි ඔබ තවමත් භූමික දේවලට ඇලී සිටින අතර ආත්මික ජීවිතයට ඇලී සිටින්නේ ටිකකි. අද දින මාගේ කැදවීම දෙවි සදහා තීරණයක් ගැනීමටත් දෛනික වෙනස් වීමටත් දිරිගැන්වීමක් වේවා. කුඩා දරුවෙනි ඔබ පාපය අත්හැර දෙවිටත් අසල්වැසියාටත් ප්‍රේම කිරීමට තීරණය නොකරන්නේ නම් ඔබට වෙනස් විය නොහැකිය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 2002 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, මෙම අනුග්‍රහයේ කාලයේ යේසුස්ගේ මිත්‍රයන් වෙන්නට ඔබව කැදවමි. සාමය උදෙසා ඔබගේ හෘදයේ වැඩ කර පුද්ගලික වෙනස්වීම සදහා කටයුතු කරන්න. කුඩා දරුවෙනි ඔබට සාමයේ හා ලෝකයේ යේසුස්ගේ ප්‍රේමයේ සාක්ෂිදරන්නන් විය හැක්කෙ මෙයාකාරයෙන් පමණකි. යාච්ඤාව ඔබට අවශ්‍යතාවයක් වන තරමට යාච්ඤාවට ඔබව විවෘත කරගන්න. කුඩා දරුවෙනි හැරෙන්න. එසේ හැකි තරම් ආත්ම යේසුස්ව හා ඔහුගේ ප්‍රේමය දැනගන්නට සලස්වන්න. මම ඔබට කිට්ටුවෙන් සිටින අතර ඔබ සියල්ලන්ට ආශීර්වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

03/18/2002 - වර්ෂ 2002 මාර්තු මස මිර්ජානා සොල්ඩෝට වූ අපගේ මාතාවගේ වාර්ෂික දර්ෂනය

වර්ෂ 2002 මාර්තු 18 මෙම දර්ශනය ලැබූ මිර්ජානා ඩ්‍රාපිසෙවි ක් සොල්ඩෝ 1981 ජූනි 24 නදින සිට 1982 දෙසැම්බර් 25 වන දින දක්වා දිනපතා දර්ශන දු ටුවාය. අන්තිම දර්ශනයේදී අපගේ මාතාව 10වන රහස ඇයට දු න් අතර ඇයට වසරකට වරක් මාර්තු 18වන දින දර්ශනය වන බව පැවසුවාය. සෑම වසරකම එය එසේම සිදු වි ය.

මෙම වසරේ දහස් සංඛ්‍යාවක් කොන්තය කියන්නට රැස්ව සිටි අතර එය මෙඩ්ජුගොජෙහි සෙනාකොලො කොමියුනිටිහි පෙ.ව. 8.45 ආරම්භ වි ය. මෙම දර්ශනය පෙ.ව. 9.27ට පටන්ගෙන පෙ.ව. 9.34 දක්වා පැවති අතර අපගේ මාතාව මෙම පණිවුඩය දු න්නාය.

මා ඔබ සමග සිට යේසුස්ව පළමුතැනට තබන ආකාරය උගන්වන්නෙමි. ඔහුට ප්‍රේම කරන ආකාරයත් ඔහුට සම්පූර්ණයෙන් අයත් වන ආකාරයත් මා ඔබට උගන්වන්නෙමි. ප්‍රිය දරුවෙනි මගේ පුත්‍රයා නොමැතිව ගැලවී මක් නොමැති බව තේරුම් ගන්න. ඔහු ඔබගේ ආරම්භයත් අවසානයත් බව ඔබ දැනගත යුතුය. ඔබට ප්‍රීතිමත් වි ය හැක්කේත් සදා ජීවි තය දිනා ගත හැක්කේත් මෙම දැනුමෙනි. ඔබගේ මව හැටියට ඔබ වෙනුවෙන් මාගේ කැමැත්ත මෙයයි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2002 මාර්තු 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව කැඳවන්නේ යේසුස් සමග යාච්ඤාවෙන් එක්සත් වෙන්නටයි. ඔබගේ හදවත ඔහුට වි වෘත කර එහි ඇති සියල්ල ප්‍රීතිය දු ක හා රෝග වැනි සියල්ල ඔහුට දෙන්න. මෙය ඔබට අනුග්‍රහයේ කාලයක් වේවා. කුඩා දරුවෙනි යාච්ඤා කරන්න. සෑම මොහොතක්ම යේසුස්ට දෙන්න. මම ඔබ සමග සිටින අතර ඔබ වෙනුවෙන් 'අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2002 අප්‍රේල් 25

"ප්‍රිය දරුවෙනි, මෙම වසන්ත කාලයේ මා සමග ප්‍රීති වන්න. මෙය ස්වභාව ධර්මය අවදි වන හා ඔබගේ හෘදයන් වෙනසක් බලාපොරොත්තු වන කාලයකි. කුඩා දරුවෙනි ඔබව වි වෘත කර යාච්ඤා කරන්න. මා ඔබ සමග සිටින බවත් මට ඔබව මගේ පුත් වෙතට ගෙනයන්නට ඕනෑ බවත් අමතක නොකරන්න. එවි ට ඔහු අවංක ප්‍රේමයේ හා තමන්ගෙන් වූ සියල්ලේ දීමනාව ඔබට ලබා දෙනවා ඇත. ඔබව යාච්ඤාවට වි වෘත කර දෙවි ගෙන් වූ ඔබගේ හදවතේ හැරීම ඔහු දකින සියල්ල හා ඔහු සපයන සියල්ල සොයන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2002 මැයි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව කැඳවන්නේ ඔබගේ ජීවි තයේ පළමු තැනට යාච්ඤාව තබන ලෙස කියන්නටයි. යාච්ඤා කරන්න. එය ඔබට ප්‍රීතියක් වේවා. මා ඔබ සමග සිටින අතර මා ඔබ සියල්ලන් වෙනුවෙන් අතරමැදිකම් කරන්නෙමි. තවද දරුවෙනි ඔබ මගේ පණිවුඩයේ ප්‍රීතිමත් වාහකයන් වෙන්න. මා සමග ඇති ඔබගේ ජීවි තය ප්‍රීතියක් වේවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2002 ජූනි 25

"ප්‍රිය දරුවෙනි, මෙම ශුද්ධ ස්ථානයේ මා ඔබට දෙන පණිවුඩ තවත් වැඩිප්‍රමාණයක් ඔබ පිළිගන්නා පිණිස ශුද්ධාත්මය ඔබගේ ඇදහිල්ල වැඩ කිරීමට උපකාර කිරීම සඳහා අද දින මා

ඔබ වෙනුවෙන් හා ඔබ සමග යාච්ඤා කරමි. කුඩා දරුවෙනි මෙය ඔබ සඳහා අනුග්‍රහයේ කාලයක් බව තේරුම් ගන්න. තවද මා සමග කුඩා දරුවෙනි ඔබ සුරක්ෂිතව සිටින්නෙහිය. ශුද්ධකමේ මාර් ගයේ ඔබ සැම ගෙනයන්නට මම කැමැත්තෙමි. මගේ පණිවුඩ අනුව ජීවත් වෙමින් මා ඔබට දෙන සෑම වචනයක්ම ඔබගේ ජීවි තය කරගන්න. ඒවා ස්වර් ගයෙන් පැමිණෙන බැවි න් ඔබට ඒවා අගය වි ය යුතුය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තුතියි."

06/25/2002 වර් ෂ 2002 ජුනි මස 25වන දින ඉවැන්කා ඉවැන්කෝවි ස් එලස් සිය වාර් ෂික දර් ෂනයේදී ඇසූ දෙයයි. දර් ෂනය

දු ටුවන් වන වි ක්කා මාරිජා හා

ඉවැන් දිනපතා දර් ෂන

දු ටුවෝය.

වර් ෂ 1985 මැයි 7වන දින ඇයගේ අන්තිම දර් ෂනයේදී අපගේ මාතාව ඉවැන්කාට 10වැනි රහස පවසා ඇත. තවද ඇයට දර් ෂනයන්හි සංවත්සරයේදී වසරකට වරක් ඇයට දර් ෂනයක් ලැබෙන බව පවසා ඇත. මෙම වසරේ ත් එය එසේම

සිදු වි ය. එම දර් ෂනය වි නාඩි 6ක් පැවතුණි. සිය පවුල එනම් ඇයගේ සැමියා හා දරුවන් තිදෙනා ඉදිරියේ ඉවැන්කාට දර් ෂනය ඇයගේ නිවසේදී ලැබුණි. අපගේ මාතාව පහත දැක්වෙන පණිවුඩය

දු න්නාය. "ප්‍රිය දරුවෙනි යාච්ඤාව ගැන වෙහෙසට පත් නොවන්න. සාමය සාමය සාමය උදෙසා යාච්ඤා කරන්න.

අපගේ මාතාව ඉවැන්කාට තමාගේ ජීවි තය පිළිබඳ අලුත් තොරතුරු ද හෙළි කළාය. ඇය අපට ඇයගේ මාතෘ ආශීර් වාදය ලබා

දු න්නාය. අපගේ මාතාව සිටියේ සතුටිනි.

වර් ෂ 2002 ජූලි 25

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබගේ ප්‍රධාන සාන්තුවරයා සමග ප්‍රීතියෙන් සිටින අතර දෙවි ගේ කැමැත්තට වි වෘත වන ලෙස ඔබව කැඳවන්නට කැමැත්තෙමි. එසේ ඔබ තුළින් ඔබගේ දෛනික පිවි තයේදී ඔබට හමුවන අයගේ ඇදහිල්ල වර් ධනය වෙනවා ඇත. කුඩා දරුවෙනි යාච්ඤාව ඔබට ප්‍රීතියක් වනතෙක් යාච්ඤා කරන්න. ඔබගේ ශුද්ධ ආරක්ෂකයාට දෙවි කෙරෙහි ප්‍රේමයෙන් වර් ධනය වෙන්නට උපකාර කරන ලෙස ඉල්ලන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තුතියි."

වර් ෂ 2002 අගෝස්තු 25

"ප්‍රිය දරුවෙනි, දෙවි ඔබට ශක්තිමත් ඇදහිල්ලක් දෙනු පිණිස අදත් මා ඔබ සමග යාච්ඤාවෙන් සිටිමි. කුඩා දරුවෙනි ඔබගේ ඇදහිල්ල ඉතා කුඩාව පවතින අතර එහි ප්‍රමාණයවත් ඔබ නොදන්නෙහිය. තවද ඔබ දෙවි ගෙන් වූ ඇදහිල්ලේ දීමනාවවත් සොයන්නට සූදානම් නැත. කුඩා දරුවෙනි මම ඔබ සමග සිටින්නේ මගේ පණිවුඩ තේරුම් ගැනීමට හා එය ක්‍රියාවට නගන්නට ඔබට උපකාර කරන්නටයි. දිගටම යාච්ඤා කරන්න. මන්ද ඔබගේ ආත්ම සාමය සොයා ගන්නේත් දෙවි සමග සිටින්නට ලෝකය ප්‍රීතිය සොයා ගන්නේත් යාච්ඤාවෙන් පමණකි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තුතියි."

වර් ෂ 2002 සැප්තැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, සාමයෙන් තොර මෙම කාලයේ මම ඔබව යාච්ඤාවට කැඳවමි. කුඩා දරුවෙනි ලෝකයේ සෑම කෙනෙකුටම සාමය සඳහා ප්‍රේමයක් දැනෙන පිනිස සාමය උදෙසා යාච්ඤා කරන්න. ආත්මයක් දෙවි තුළ සාමය අද්දකින වි ට පමණයි එය සෑහීමකට පත් වෙන්නේ.

තවද ප්‍රේමය ලෝකයේ ගලා යන්නට පටන් ගන්නවා ඇත. තවද වි ශේෂිත ආකාරයකට කුඩා දරුවෙනි ඔබව කැදවා ඇත්තේ සාමයෙන් ජීවත් වෙන්නටත් සාමය උදෙසා සාක්ෂි දරන්නටත්ය. එසේ සාමය ඔබගේ හෘදයේ හා ඔබගේ පවුල් තුළ පවතිනවා ඇත. ඔබ තුළින් සාමය ලෝකයට ගලා යන්නට පටන් ගන්නවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2002 ඔක්තෝබර් 25

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැදවන්නේ යාච්ඤාවටයි. කුඩා දරුවෙනි සරල යාච්ඤාවෙන් ප්‍රාතිහාර්යයන් සිදු වි ය හැකි බව දැනගන්න. ඔබගේ යාච්ඤාවෙන් ඔබ ඔබගේ හදවත දෙවි ට වි වෘත කරන අතර ඔහු ඔබගේ ජීවි තයේ ප්‍රාතිහාර්යයන් සිදු කරන්නේය. කුඩා දරුවෙනි යාච්ඤා කර වි ස්වාස කරන්න. දෙවි ඔබට අනුග්‍රහය දක්වන අතර ඔබට එය පෙනෙන්නේ නැත. යාච්ඤා කරන්න එවි ට ඔබට එය පෙනෙනවා ඇත. ඔබගේ දවස දෙවි ඔබට ලබා දෙන සියල්ල සදහා ස්තූතියෙන් හා යාච්ඤාවෙන් පිරී තිබේවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2002 නොවැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, අද මා ඔබව කැදවන්නේ හැරෙන්නටයි. කුඩා දරුවෙනි ඔබගේ හදවත් දෙවි ට වි වෘත කරන්න. පසුතැවි ලි වී මෙන් ඔබගේ හදවත්වල අලුතෙන් කුඩා යේසුස් උපදින පිනිස එය සූදානම් කර ගන්න. ඔබව සාමයේ හා ප්‍රීතියේ මාවතේ ඔහු රැගෙන යන පිණිස ඔබව වෙනස් කරන්නට ඔහුට ඉඩ දෙන්න. කුඩා දරුවෙනි යාච්ඤාව උදෙසා තීරණයක් ගන්න. වි ශේෂයෙන්ම දැන් මෙම අනුග්‍රහයේ කාලයේ ඔබගේ හදවත් යාච්ඤාවට නැඹුරු වේවා. මම ඔබට සමීපව සිටින අතර ඔබ සියල්ලන් වෙනුවෙන් දෙවි ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2002 දෙසැම්බර් 25

"ප්‍රිය දරුවෙනි, මෙය මහත් අනුග්‍රහයන් සදහා කාලයක් වන අතර මෙය සාමයේ මාවතේ යන්නට කැමති සියල්ලන්ට මහත් පරීක්ෂාවේ කාලයක්ද වේ. එනිසා කුඩා දරුවෙනි මම නැවතත් ඔබව යාච්ඤාවට යාච්ඤාවට යාච්ඤාවට කැදවමි. වචනවලින් නොව හදවතින් එසේ කරන්න. මගේ පණිවුඩ අනුව ජිවත් වී හැරෙන්න. වි ශේෂයෙන්ම අද දින මා සාමයේ රජානන්වන කුඩා යේසුස්ව අත්දරා සිටින වි ට දෙවි මට ඔබ සමග සිටින්නට ලබා දී ඇති දීමනාව තේරුම් ගන්න. මා ඔබට සාමය ලබා දෙන්නට කැමැත්තෙන් සිටින අතර දෙවි ගේ සාමය ලෝකය පාලනය කරනතෙක් සාමය අන්‍යයන්ට ලබා දෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

2003

වර්ෂ 2003 ජනවාරි 25

"ප්‍රිය දරුවෙනි, මෙම පණිවුඩයත් සමගින් මම ඔබව සාමය උදෙසා යාච්ඤාවට කැදවමි. වි ශේෂයෙන්ම දැන් සාමය උවදු රට ලක්ව ඇති වි ට ඔබට යාච්ඤාව උදෙසා යාච්ඤා කරන්නෙක් හා සාක්ෂිදරන්නෙක් වි ය හැකිය. කුඩා දරුවෙනි සාමය නොමැති මෙම ලෝකයේ සාමය වෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2003 පෙබරවාරි 25

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැදවන්නේ යාච්ඤාවට හා සාමය උදෙසා නිරාහාරව සිටින්නටයි. මා නිතර කිව්වාක්මෙන් නැවතත් මා ඔබට කියන්නේ කුඩා දරුවෙනි යුද්ධ පවා නැවැත්වි ය හැක්කේ යාච්ඤාවෙන් හා නිරාහාරව සිටීමෙන් බවයි. සාමය දෙවි ගෙන් වූ අනගි දීමනාවකි. සොයා යාච්ඤා කරන්නේ නම් ඔබට එය ලබා ගත හැකිය. සාමය ගැන කථා කර ඔබගේ හදවතේ සාමය රැගෙන යන්න. ජලය සැලකිල්ල හා ආලෝකය අවශ්‍ය මලක් මෙන් එය පෝෂණය කරන්න. අන්‍යයන්ට සාමය ගෙනයන්නෙක් වෙන්න. මා ඔබ සමග සිටින අතර ඔබ සියල්ලන් උදෙසා අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තුතියි."

18.03.2003 දර් ශනය ලැබූ මිර් ජානා ඩ්‍රාජිසෙවි ක් සොල්ඩෝ 1981 ජූනි 24වන දින සිට 1982 දෙසැම්බර් 25වන දින දක්වා දෛනික දර් ශන ලැබුවා. එම දර් ශන තුළදී ඇයට වසරකට වරක් මාර් තු 18වන දින දර් ශනය වන බව පවසා ඇත. එම කාලය පුරාම එසේ සිදු වී ඇත.

මෙම වසරේ දහස් සංඛ්‍යාත වන්දනාකරුවන් කොන්තය කියන්නට මෙඩ්ජුකොර් ජේ හි සෙනාකෝලො කොමියුනිටිහි එක්රැස් වූහ. දර් ශනය පෙ.ව. 8.55 සිට 9.02 දක්වා පැවතුණි. අපගේ මාතාව පහත පණිවුඩය දු න්නාය.

ප්‍රිය දරුවෙනි මෙම පෙනීසිටීමේ හා යාච්ඤාවේ ශුද්ධ අවස්ථාවේ තොරා ගැනීමට කරන්නට මම ඔබව කැදවමි. ජීවි තය හෝ මරණය තෝරා ගැනීවේ තය හෝ මරණය තෝරා ගැනීමේ නිදහස දෙවි ඔබට ලබා දී ඇත. ඔබ කළ යුතුව ඇති දෙයට ඔබ ඇලී සිටින පිනිසත් ඔබ ජීවි ත මාර් ගය සොයා ගන්නා ආකාරය දැන ගැනීමටත් මගේ පණිවුඩවලට හදවතින් සවන් දෙන්න. මගේ දරුවෙනි දෙවි නොමැතිව ඔබට කිසිවක් කළ නොහැකිය. සුළු මොහොතකටවත් මෙය අමතක නොකරන්න. ඔබ කවරෙක්ද යන වගත් පොළොව මත ඔබ කවරෙකුව සිටිය යුතුද යන වගත් ඔබ නැවතත් එයට හැරී එන්නේ කවදාද යන්නත් රැගෙන්නේ ඔහු මතය. දෙවි ව කෝප නොකර මාව ජීවි තයට අනුගමනය කරන්න. ඔබ මෙහි ඒමට ස්තුතියි.

වර් ෂ 2003 මාර් තු 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැදවන්නේ සාමය උදෙසා යාච්ඤා කරන්නටයි. කුඩා දරුවෙනි හදවතින් යාච්ඤා කරන්න. දෙවි සිය මැවි ලිවලට ආදරය කරන බැවි න් බලාපොරොත්තුව අත්නාරින්න. මගේ මෙහි පැමිණීමෙන් ඔහු එකින් එක ඔබව ගලවා ගැනීමට කැමතිය. මා ඔබව කැදවන්නේ මා ඔබව කැදවන්නේ ශුද්ධකමේ මාවතටයි. යාච්ඤා කරන්න එසේ කිරීමෙන් ඔබ දෙවි ගේ කැමැත්තට වි වෘත වන්නෙහිය. මෙයාකාරයෙන් ඔබ කරන සැමෙකකින්ම ඔබ ඔබ තුළින් හා ඔබගෙන් වූ දෙවි ගේ සැලසුම තේරුම් ගන්නෙහිය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තුතියි."

වර් ෂ 2003 අප්‍රේල් 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැදවන්නේ යාච්ඤාවටයි. ගත වූ දු ක්ප්‍රාප්ති කාලයේ"ඔබ කොතරම් කුඩාද යන්නත් ඔබගේ ඇදහිල්ල කොතරම් කුඩාද යන්නත් ඔබ තේරුම් ගත්තෙහිය. කුඩා දරුවෙනි අදත් දෙවි උදෙසා තීරණයක් ගන්න. මන්ද ඔහු ඔබ තුළින් හා ඔබගෙන් ඔහු ඔබගේත් ජනයාගේත් හදවත් තෝරා ගන්නේය. දෙවි ව සොයන සාමය නොමැති මෙම ලෝකයේ නැවත නැගිටුන යේසුස්ව ගෙනයන්නෙක් වෙන්න. කුඩා දරුවෙනි මම ඔබ සමග සිටිමි. මා ඔබට වි ශේෂිත ආකාරයකට ප්‍රේම කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තුතියි."

වර්ෂ 2003 මැයි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැදවන්නේ යාච්ඤාවටයි. ඔබගේ පුද්ගලික යාච්ඤාව අලුත් කර ගන්න. හදවතින් යාච්ඤා කරන්නට ශුද්ධාත්මයේ උපකාරය ලබා ගැනීමට විශේෂාකාරයකට යාච්ඤා කරන්න. කුඩා දරුවෙනි මා ඔබ සැම වෙනුවෙන් අතරමැදිකම් කරන අතර හැරෙන්නට ඔබට කියමි. ඔබ හැරුනොත් ඔබ වඩා සිටින සියල්ලන්ද අලුත් වෙන අතර ඔවුන්ට යාච්ඤාව ප්‍රීතියක් වනු ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 2003 ජූනි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැදවන්නේ යාච්ඤාවටයි. මා ඔබට කියන දෙය ජීවිතයට නගන්න. මගේ පණිවුඩ වඩාත් අලුත් කරන්නට කියමි. වැඩි උනන්දුවකින් හා ප්‍රීතියකින් එසේ කරන්න. යාච්ඤාව ඔබගේ දෛනික පුරුද්ද වේවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 2003 ජූලි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැදවන්නේ යාච්ඤාවටයි. කුඩා දරුවෙනි යාච්ඤාව ඔබට ප්‍රීතියක් වනතෙක් යාච්ඤා කරන්න. ඔබ සෑම කෙනෙක්ම ඔබගේ හදවතේ සාමය සොයා ගන්නේ මෙයාකාරයෙන් පමණකි. ඔබගේ ආත්මයත් එසේ හැරෙනු ඇත. ඔබගේ හදවතේ හා ජීවිතයේ ඔබට දැනෙන ප්‍රේමය අන්‍යයන්ට සාක්ෂි දැරීමේ අවශ්‍යතාව ඔබට දැනෙනු ඇත. මා ඔබ සමග සිටින අතර ඔබ සැම වෙනුවෙන් දෙවි ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 2003 අගෝස්තු 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අද දින මා ඔබව කැදවන්නේ දෙවි ස්වභාව ධර්මයේ ඇති ලකුණු හා පාට තුළින් ඔබට දෙන්නාවූ සියලුම අනුග්‍රහයන්ට ස්තූතිකරන ලෙයසි. ඔබව තමන්ට කිට්ටු කර ගැනීමටත් තමන්ට මහිමය හා ස්තූතිය දෙන්නටත් ඔබව පොළඹවන්නට දෙවිට ඕනෑ කර ඇත. එනිසා කුඩා දරුවෙනි මම ඔබට කියන්නේ යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න කියාය. තවද මා ඔබ සමග සිටින බව අමතක නොකරන්න. ඔබට ඔහු තුළ ප්‍රීතිය සම්පූර්ණ වනතෙක් මම ඔබ සියල්ලන් වෙනුවෙන් දෙවි ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 2003 සැප්තැම්බර් 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැදවන්නේ මගේ හෘදයට සමීප වන්නටයි. ඔබ අතර මා මෙහි පැමිණ සිටීම ඔබට තේරුම් ගත හැක්කේ මෙයාකාරයෙන් පමණකි. කුඩා දරුවෙනි ඔබව මාගේ පුත් යේසුස්ගේ හදවතට මගපෙන්වන්නට කැමැත්තෙමි. එහෙත් ඔබ ඊට ප්‍රතිචාරය නොදක්වමින් ඔබගේ හදවත යාච්ඤාවට විවෘත කරන්නට නොකැමැත්තෙහිය. නැවතත් කුඩා දරුවෙනි මා ඔබට කියන්නේ බිහිරි නොවී ඔබට ගැලවීම වන මාගේ කැදවීම තේරුම් ගන්නා ලෙයසි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

වර්ෂ 2003 ඔක්තෝබර් 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, මා ඔබව අලුතින් කැදවන්නේ ඔබ ව මගේ හදවතට හා මගේ පුත් යේසුස්ගේ හදවතට කැප වෙන්නටයි. කුඩා දරුවෙනි මම ඔබව හැරීමේ හා ශුද්ධකමේ මාවතේ ගෙන යන්නට කැමැත්තෙමි. හැකි තරම් ආත්ම ගැලවීමේ මාර්ගයේ අපට රැගෙන යා හැක්කේ මෙයාකාරයෙන් පමණකි. කුඩා දරුවෙනි පමා නොවී ඔබේ මුළු හදවතින්ම, මාගේ සහෝදර සහෝදරියන් ශුද්ධකමේ මාවත දැන ගන්නා පිණිස මට යේසුස්ටත් මරියාටත් උපකාර

කරන්නට අවශ්‍යයි පවසන්න. මෙයාකාරයෙන් යේසුස්ගේ මිත්‍රයන් වී මේ තෘප්තිය ඔබට දැනෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 2003 නොවැම්බර් 25වන දින පණිවුඩය

“ප්‍රිය දරුවෙනි, මෙම අවස්ථාව යාච්ඤාව සඳහා වඩාත් දිරිගැන්වී මක් ලබන පිණිස මම මෙම වතාවේ ඔබව කැඳවමි. මෙම අවස්ථාවේ යේසුස් සියලුම හදවත්වල ඉපදෙන පිණිස කුඩා දරුවෙමනි යාච්ඤා කරන්න. එය මෙම සාමයෙන් තොර ලෝකයේ සිදු වි ය යුත්තේය. මම ඔබ සමග සිටින අතර ඔබ සෑම කෙනෙක් වෙනුවෙන්ම දෙවි ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 2003 දෙසැම්බර් 25වන දින පණිවුඩය

“ප්‍රිය දරුවෙනි, අදත් මම මගේ පුත් යේසුස්ව අතේ ඇතිව ඔබට ආශීර් වාද කරමි. සාමයේ රජාණන් වන ඔහු තමාගේ සාමය ඔබට දෙන පිණිස ඔහුව අතේ දරා සිටිමි. කුඩා දරුවෙනි මම ඔබ සමග සිටින අතර ඔබ සියල්ලන්ට ප්‍රේම කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 2003 දෙසැම්බර් 25වන දින ජේවොක්ට වාර් ෂික දර් ෂනය

වර් ෂ 1998 සැප්තැම්බර් 12වන දින ජේවොක් කොලොට වූ අන්තිම දර් ෂනයේදී අපගේ මාතාව වසරකට වරක් දෙසැම්බර් 25වන දින එනම් නත්තල් දිනයේ ඔහුට දර් ෂනයක් ලැබෙන පැවසුවාය. එලෙස මෙවරත් සිදු වි ය. දර් ෂනය ප.ව. 3.15ට පටන්ගෙන වි නාඩි8ක් පැවතුණි.

අපගේ මාතාව පහත පණිවුඩය දු න්නාය:

“ප්‍රිය දරුවෙනි, අද දින යේසුස් තමාගේ සාමය වි ශේෂ ආකාරයකට ඔබට දෙන්නට කැමති වන වි ට ඔබගේ හදවතේ සාමය සඳහා යාච්ඤා කරන ලෙස මම ඔබෙන් ඉල්ලමි. දරුවෙනි ඔබගේ හදවතේ සාමය නොමැතිව ඔබට යේසුස්ගේ උපතේ ප්‍රේමය හා ප්‍රීතිය දැන ගන්නට බැරිය. එබැවි න් කුඩා දරුවෙනි අදදින වි ශේෂිත ආකාරයකට ඔබගේ හදවත් වි වෘත කර යාච්ඤා කරන්නට පටන් ගන්න. යාච්ඤාවෙන් හා පූර් ණ කැප වී මෙන් පමණයි ඔබගේ හදවත් ප්‍රේමයෙන් හා යේසුස්ගේ සාමයෙන් පිරී යන්නේ. මාගේ මාතෘ ආශීර් වාදයෙන් මම ඔබට ආශීර් වාද කරමි.

2004

වර් ෂ 2004 ජනවාරි 25වන දින පණිවුඩය

“ප්‍රිය දරුවෙනි, අදත් මම ඔබට කැඳවන්නේ යාච්ඤාවටයි. කුඩා දරුවෙනි දෙවි ගේ ප්‍රේමය තවමත් දැන නොගත් අය සඳහා වි ශේෂිත ආකාරයකට යාච්ඤා කරන්න. ඔවුන්ගේ හදවත් වි වෘත වන්නටත් ඔවුන්ව ප්‍රේමයේ හා සාමයේ ජනයා බවට පරිවර් තනය වී ම සඳහා මගේ හා මාගේ පුත් යේසුස්ගේ හදවතට ලං වෙන්නටත් යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 2004 පෙබරවාරි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මින් පෙර නොවූ ලෙසින් මගේ පණිවුඩයට ඔබගේ හදවත වි ෘත කරන්නට මම ඔබව කැඳවමි. කුඩා දරුවෙනි දෙවි  වෙතට ආත්ම යොමු කරන අය වන්න. ඔහුගෙන් ඈත් වන අය නොවන්න. මම ඔබ සමග සිටින අතර වි ශේෂිත ප්‍රේමයකින්  ඔබට ප්‍රේම කරමි. මෙය කැපවී මේ හා හැරීමේ කාලයකි. මගේ හද පත්ලෙන්ම මා ඔබට කියන්නේ ඔබේ මුළු හදවතින්ම මගේ වන්න. එවි ට දෙවි  ශ්‍රේෂ්ඨ බව ඔබට පෙනෙනවා ඇත. මන්දහත් එවි ට ඔහු ඔබට බොහෝ ආශිර්වාද හා සාමය ලබා දෙන නිසාය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 2004 මාර් තු මස 18වන දින මිර් ජානාට වාර් ෂික දර් ෂනය

18.03.2004  දර් ෂනය ලැබූ මිර් ජානා ඩ්‍රාපිසෙවි ක් සොල්ඩොට වර් ෂ 1982 දෙසැම්බර් 25 වන දින සිට 1981 ජූනි 24වන දින දක්වා දිනපතා දර් ෂන ලැබුණි. අන්තිම දෛනික දර් ෂනයේදී අපගේ මාතාව 10වන අභිරහස ඇයට ලබා

දු න්නාය. ඇයට වසරකට වරක් මාර් තු 18වන දින දර් ෂනය වන බවත් පැවසුවාය. මෙතෙක් එය එසේ

සිදු වි ය.

මෙම වසරේ දහස් සංඛ්‍යාත වන්දනාකරුවන් කොන්තය කියන්නට මෙඩ්ජුගොර් ජේහි සෙනාකොලො කොමියුනිටිහි රැස්වූහ. දර් ෂනය 13.58 සිට 14.03 දක්වා පැවති අතර අපගේ මාතාව පහත පණිවුඩය ලබා

දු න්නාය.

"ප්‍රිය දරුවෙනි, අද දිනත් ප්‍රේමයෙන් පිරි හදවතකින් ඔබව නිරීක්ෂණය කරන වි ට ඔබ නොකඩවා සොයන දෙය ඔබ බලා සිටින දෙය මගේ කුඩා දරුවෙනි ඔබ ඉදිරියේ තිබෙන බව කියන්න කැමතියි. පවි ත්‍ර හදවතක ඔබ මගේ පුතාව මුල් තැනට තබන්න. එවි ට ඔබට දකින්න පුළුවන් වෙයි. මට සවන් දී මාතෘ ආකාරයකින් මට ඔබට මග පෙන්වන්නට ඉඩ දෙන්න."

වර් ෂ 2004 මාර් තු 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැඳවන්නේ යාච්ඤාවටයි. වි ශේෂයෙන්ම දැන් මෙම අනුග්‍රහයේ කාලයේදී කුඩා දරුවෙනි ඔබගේ හදවත් වි ෘත කර වදකණුවේ එල්ලන ලද තැනැත්තාට ඔබගේ ප්‍රේමය ප්‍රකාශ කරන්න. ඔබට සාමය සොයා ගත හැක්කේ මෙයාකාරයෙන් පමණකි. තවද ඔබගේ හෘදයෙන් යාච්ඤාව ලෝකය තුළට ගලා යන්නට පටන් ගන්නවා ඇත. කුඩා දරුවෙනි ආදර් ෂයක් වෙන්න. යහපතට පෙළඹීමක් වෙන්න. මම ඔබට කිට්ටුවෙන් සිටින අතර ඔබ සියල්ලන්ට ප්‍රේම කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 2004 අප්‍රේල් 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මම ඔබට කියන්නේ මාගේ පණිවුඩ අනුව ජීවත් වන ලෙයසි. යටහත්පහත් භාවයෙන් හා ප්‍රේමයෙන් එසේ කරන්න. එවි ට ශුද්ධාත්මය අනුග්‍රහය හා ශක්තිය ලබා දෙනවා ඇත. ඔබ සාමයේ හා සමාව දීමේ සාක්ෂිකරුවන් වන්නේ මෙයාකාරයෙන් පමණකි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර් ෂ 2004 මැයි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අද මා ඔබගෙන් ඉල්ලන්නේ ඔබව මාගේ හා මාගේ පුත් යේසුස්ගේ හදවතට කැප කරන ලෙයසි. දිනපතා ඔබ මාගේම වන්නේත් අන්‍යයන්ව වැඩියන් ශුද්ධකම වෙතට යොමු කරන්නේත් මෙයාකාරයෙන් පමණකි. මෙයාකාරයෙන් ප්‍රීතිය ඔබගේ හදවත්වල රජකරන අතර ඔබ  සාමයේ හා ප්‍රේමයේ වාහකයන් වන්නහුය. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2004 ජූනි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, ඔබ සැම අතරේ ප්‍රීතිය තිබිම ඉතා වැදගත් වන්නේය. එබැවි න් කුඩා දරුවෙනි යාච්ඤා කර වෙනස් වී ඇති සෑම හෘදයක් වෙනුවෙනුත් ලෝකයේ සාමයේ අවි යක් වී ඇති හෘදයක් වෙනුවෙනුත් මා සමග සතුටු වෙන්න.
යාච්ඤා කණ්ඩායම් බලගතුය. තවද ඔවුන් තුළින් කුඩා දරුවෙනි මා ශුද්ධාත්මය ලෝකයේ ක්‍රියාකාරීව ඇති බව මා දකිනවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

දර්ශනය ලැබූ ඉවැන්කාට වි දිමත් වාර්ෂික දර්ශනය

25.06.2004 වර්ෂ 2004 ජූනි මස 25වන දින ඉවැන්කා ඉවැන්කෝවි ක් එල්එස් වි දිවත් වාර්ෂික දර්ශනය ලැබුවාය. දර්ශනයන් ලබන වි ක්කා මාරිජා හා ඉවැන්ට අනුව ඔවුන් දෛනික දර්ශන ලැබූ අතර මිර්ජානා ඉවැන්කා හා ජාවොක්ට වාර්ෂික දර්ශන ලැබුණි.

වර්ෂ 1985 මැයි 7වන දින ඇයගේ අන්තිම දර්ශනයේදී අපගේ මාතාව ඉවැන්කාට 10වන රහස පවසා ඇති අතර දර්ශනවල සංවත්සරයේ වසරකට වරක් ඇයට දර්ශනයක් ලැබෙන බව පවසා ඇත. මෙම වසරේ ත් එය එසේම
සිදු වි ය. දර්ශනය වි නාඩි9ක් පැවතුණි. ඉවැන්කාට එම දර්ශනය ඇයගේ පවුලේ අය එනම් සැමියා හා දරුවන් තිදෙනා ඉදිරියේ නිවසේදී ලැබුණි.

අපගේ මාතාව පහත පණිවුඩය ඇයට
දු න්නාය:

"ප්‍රිය දරුවෙනි, මගේ පුතාගේ ප්‍රේමය
හඳු නා නොගත් පවුල් වෙනුවෙන් යාච්ඤා කරන්න. මාගේ මාතෘ ආශීර්වාදය ලබා ගන්න."

අපගේ මාතාව වඩාත් ප්‍රීතිමත්ව පැමිණ ඇයගේ ජීවි තය ගැන පුලුල්ව ඉවැන්කා සමග කථා කළාය.

වර්ෂ 2004 ජූලි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, ඔබගෙන් අලුතෙන් ඉල්ලන්නේ මාගේ පණිවුඩ සඳහා වඩාත් වි වෘත වන ලෙයසි. කුඩා දරුවෙනි ඔබව මාගේ පුත් යේසුස් වෙතට කිට්ටු කරන්නට කැමැත්තෙමි. එනිසා ඔබ යාච්ඤා කර නිරාහාරව සිටිය යුතුයි. වි ශේෂයෙන්ම මාගේ අභිප්‍රායන් සඳහා යාච්ඤා කරන ලෙස ඉල්ලමි. එවි ට මගේ පුත්"යේසුස්ව ඔබට ඉදිරිපත් කළ හැකිය. ඔහුද ඔබව වෙනස් කර ඔබගේ හදවත් ප්‍රේමයට වි වෘත කරනවා ඇත. ඔබට ප්‍රේමය හදවතේ තිබෙන වි ට ඔබ තුළ සාමය රජ කරනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2004 අගොස්තු 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, මා ඔබව හදවතේ හැරීමකට කැඳවමි. මා මෙහි පැමිණි මුල් දිනවලදී මෙන් ඔබගේ ජීවි තයේ පූර්ණ වෙනසකට තීරණයක් ගන්න. මෙයාකාරයෙන් කුඩා දරුවෙනි ඔබට දණ ගසන්නනට හැකි වන දෙවි ඉදිරියේ ඔබගේ හදවත් වි වෘත කරන්නට හැකි වෙනවා ඇත. දෙවි ඔබගේ යාච්ඤා අසා ඒවාට පිළිතුරු දෙනවා ඇත. දෙවි ඉදිරියේ මම ඔබ සෑම කෙනෙක් වෙනුවෙන්ම අතරමැදිකම් කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2004 සැප්තැම්බර් 25වන දින පණිවුඩය

“ප්‍රිය දරුවෙනි, වෛරය තිබෙන තැන ප්‍රේම කරන්නටත් සාගින්න තිබෙන තැන ආහාර බෙදන්නටත් මම ඔබව කැඳවමි. කුඩා දරුවෙනි ඔබගේ හදවත් වි වෘත කර ඔබගේ දෑත් දිගු කර ත්‍යාගශීලී වන්න. එවි ට ඔබ තුලින් සියලු ජීවි න් මැවුම්කරු වන දෙවි ට ස්තූති කරනවා ඇත. කුඩා දරුවෙනි යාච්ඤා කර ඔබගේ හදවත් දෙවි ගේ ප්‍රේමයට වි වෘත කරන්න. ඔබ යාච්ඤා නොකරන්නේ නම් ඔබට එසේ කළ නොහැකිය. එබැවි න් යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර්ෂ 2004 ඔක්තෝබර් 25වන දින පණිවුඩය

“ප්‍රිය දරුවෙනි, මෙය පවුල උදෙසා අනුග්‍රහයේ කාලයකි. එබැවි න් මා ඔබෙන් ඉල්ලන්නේ යාච්ඤාව අලුත් කරන ලෙයසි. යේසුස් ඔබගේ පවුලේ හදවතේ සිටිවා. යාච්ඤාවෙන් ශුද්ධ සියල්ලට ප්‍රේම කරන්නට ඉගෙන ගන්න. ශුද්ධවන්තයන් දිරිගන්වී මක් වන පිණිස ඔවුන්ගේ ජීවි ත අනුකරණය කරන්න. ඔවුන් ශුද්ධකමේ මාර් ගය සඳහා ගුරුවරුන් වෙනවා ඇත. යාච්ඤාව හා සාමය නොමැති මෙම ලෝකයේ සෑම පවුලක්ම ප්‍රේමයේ සාක්ෂියක් වේවා. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 2004 නොවැම්බර් 25වන දින පණිවුඩය

“ප්‍රිය දරුවෙනි, මෙම කාලයේ මාගේ අභිමතයන් සඳහා යාච්ඤා කරන්නට ඔබ සියල්ලන්ව කැඳවමි. වි ශේෂයෙන්ම කුඩා දරුවෙනි දෙවි ගේ ප්‍රේමය නොදන්නා එමෙන්ම ගැලවුම්කරු වන දෙවි ව නොසොයන අය උදෙසා යාච්ඤා කරන්න. කුඩා දරුවෙනි ඔබ මාගේ දිගු කරන ලද දෑත් වන්න. තවද ඔබගේ ආදර් ශයෙන් ඔවුන්ව මාගේ හා මාගේ පුතාගේ හදවතට කිට්ටු කරවන්න. දෙවි  අනුග්‍රහයන්ගෙන් හා සෑම ආශීර් වාදයන්ගෙන් ඔබට ආශීර් වාද කරනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 2004 දෙසැම්බර් 25වන දින පණිවුඩය

“ප්‍රිය දරුවෙනි, මම මාගේ පුත් යේසුස්ව මාගේ අත්දරා ඔබ වෙතට එන්නේ මහත් සතුටිනි. ඔහු ඔබට ආශීර් වාද කරන අතර ඔබට සාමය පතයි. යාච්ඤා කර කුඩා දරුවෙනි සෑම තත්ත්වයකදීම ශුභාරංචියේ සාක්ෂිකරුවන් වෙන්න. දෙවි  ඔබට ආශීර් වාද කරන්නේත් ඇදහිල්ලෙන් ඔහුගෙන් ඉල්ලන දේවල් දෙන්නේත් මෙයාකාරයෙන් පමණකි. සර් වබලධාරී තැනැත්තා මට අවසර දෙනතෙක් මා ඔබ සමග සිටිමි. මහත් ප්‍රේමයකින් මම ඔබ වෙනුවෙන් අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි.”

වර් ෂ 2004 දෙසැම්බර් 25 වන දින ජෙවොක්ට වාර් ෂික දර් ශනය

වර් ෂ 1998 සැප්තැම්බර් 12වන දින ජෙවොක් කොට කළ අන්තිම දෛනික දරශනයේදී අපගේ මාතාව සෑම දෙසැම්බර් 25වන දිනකම නත්තලේදී ඔහුට වසරකට වරක් වාර් ෂික දර් ශනයක් ලැබෙන බව පැවසුවාය. මෙම වසරේ දීත් එය එසේම
සිදු වි ය. එම දර් ශනය ප.ව.
2.30ට පටන්ගෙන වි නාඩි7ක් පැවතුණි. අපගේ මාතාව පහත පණිවුඩය
දු න්නාය:

“ප්‍රිය දරුවෙනි, අද්දින කුඩා යේසුස්ව මගේ අත් ඇතිව මෙම අනුග්‍රහයේ දවසේදී යාච්ඤා කිරීම ආරම්භ කරන ලෙස ඔබගෙන් ඉල්ලමි. කුඩා දරුවෙනි යේසුස්ට ඔබගේ හදවත්වල උපදින ලෙස ඉල්ලන්න. ඔබගේ ජීවි තය පාලනය කරන ලෙසද ඉල්ලන්න. ඔහුව නිතරත් සෑම කෙනෙකු තුළත් හදු නාගැනීමට හැකිවන පිණිස ඔහුගේ අනුග්‍රහය ඉල්ලා යාච්ඤා කරන්න. කුඩා දරුවෙනි යේසුස්ගෙන් ප්‍රේමය ඉල්ලන්න. මන්දයත් ඔබට දෙවි ව හා සියලු මිනිසුන්ව ප්‍රේම කළ හැක්කේ දෙවි ගේ ප්‍රේමයෙන් පමණකි. මම ඔබ සැමය මගේ හදවතේ උසුලාගෙන සිටින අතර මගේ මාතෘ ආශීර් වාදය ඔබට දෙමි.

2005

වර්ෂ 2005 ජනවාරි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, මෙම අනුග්‍රහයේ කාලයේදී මම නැවතත් ඔබව යාච්ඤාවට කැඳවමි. කුඩා දරුවෙනි ක්‍රිස්තියානින්ගේ එක්සත්කම වෙනුවෙන් සියල්ලන්ට එක හදවතක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න. ඔබ යාච්ඤා කරන හා සමාව දෙන පමණට ඔබ අතර එක්සත්කම තිබෙනවා ඇත. ප්‍රේමය ජයග්‍රහණය කරන්නේත් ඔබගේ හදවත වි වෘත වන්නේත් ඔබ යාච්ඤා කළොත් පමණක් බව අමතක නොකරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2005 පෙබරවාරි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, දෙවි ව අන්තිම තැනට තබන මෙම ලෝකයේ අද දින මා ඔබව කැඳවන්නේ මගේ දිගු කරන ලද දෑත් බවට පත්වන ලෙසයි. කුඩා දරුවෙනි ඔබ දෙවි ව ඔබගේ ජීවි තයේ පළමු තැනට තබන්න. සාමයේ හා ප්‍රේමයේ දෙවි ඔබට ආශීර්වාද කර ඔහුට සාක්ෂිදරන්නට ඔබට ශක්තිය දෙනවා ඇත. මම ඔබ සමග සිටින අතර ඔබ සියල්ලන් වෙනුවෙන් අතරමැදිකම් කරන්නෙමි. කුඩා දරුවෙනි මම ඔබට මෘදු ප්‍රේමයකින් ප්‍රේම කරන බව අමතක නොකරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2005 මාර්තු 18 වන දින මිර්ජානා ඩ්‍රාජිසෙවි ක් සොල්ඩෝට අපගේ මාතාවගේ වාර්ෂික දර්ශනය

18.03.2005 මෙම දර්ශනය ලැබූ මිර්ජානා ඩ්‍රාජිසෙවි ක් සොල්ඩෝට වර්ෂ 1981 ජූනි 24 වන දින සිට 1982 දෙසැම්බර් 25 වන දක්වා දෛනික දර්ශන ලැබුණි. අන්තිම දෛනික දර්ශනයේදී අපගේ මාතාව ඇයට 10වැනි රහස ලබා දී සෑම වසරකම මාර්තු 18වන දින ඇයට දර්ශනය වන බැව් පැවසුවාය. වසර ගණනාව පුරා එය එසේ සිදු වි ය.

මෙම වසරේ දහස් සංඛ්‍යාත වන්දනාකරුවන් කොන්තය කියන්නට මෙඩ්ජුගොර්ජේ හි සෙනාකොලෝ කොමියුනිටිහි එක්රැස් වූහ. එම දර්ශනය 14.09 සිට 14.14 දක්වා පැවති අතර අපගේ මාතාව පහත පණිවුඩය ලබා දු න්නාය.

"ප්‍රිය දරුවෙනි, මම අන් සියල්ලට වඩා තම දරුවන්ට ප්‍රේම කරන මවක් ලෙස ඔබ වෙතට එන මවක් වන්නෙමි. මගේ දරුවෙනි මම ප්‍රේම කරන්නට ඔබට උගන්වන්නට කැමතියි. මම මේ සඳහා යාච්ඤා කරමි. ඔබගේ සෑම අසල්වැසියෙකු තුළම ඔබ මාගේ පුත්‍රයාව තේරුම් ගන්නා ලෙස මම අයැදිමි. සැබෑ සාමය හා ප්‍රේමය වන මාගේ පුත්‍රයා සියලුම අසල්වැසියන් හට ප්‍රේමය ලබා දෙමින් සිටි. මගේ දරුවෙනි මෙම අභිප්‍රායන්ට ඔබගේ හදවත් වි වෘත වන පිනිස නිරාහාරව සිට යාච්ඤා කරන්න."

වර්ෂ 2005 අප්‍රේල් 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මම ඔබව යාච්ඤාවට කැඳවමි. ශුද්ධ වචනය තුළින් ශුද්ධාත්මය ඔබගේ පවුල් තුළට ඇතුල් වී ඔබව අලුත් කරාවා. මෙයාකාරයෙන් ඔබ ඔබගේ පවුල් තුළ ඇදහිල්ලේ ගුරුවරුන් වෙනවා ඇත. යාච්ඤාවෙන් හා ඔබගේ ප්‍රේමයෙන් ලෝකය වඩාත් හොඳ මාවතක ගමන් කරනු ඇති අතර ලෝකයේ ප්‍රේමය රජ කරන්නට පටන් ගන්නවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2005 මැයි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, යටහත් පහත්ව මගේ පණිවුඩවලට අනුව ජීවත් වන ලෙස ඉල්ලමි. අපි දැන් මගේ දර්ශනවල සංවත්සරයට ළං වෙන වි ට වි ශේෂාකාරව සාක්ෂි දරන්න. කුඩා දරුවෙනි දෙවි ගෙන් හා ඔහුගේ ප්‍රේමයෙන් ඈත්ව සළකුණක් වෙන්න. මම ඔබ සමග සිටින අතර මාගේ මාතෘ ආශීර්වාදයෙන් ඔබට ආශීර්වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2005 ජූනි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, ඔබ මාගේ අභිප්‍රායන් වෙනුවෙන් ඔප්පු කර ඇති සියලුම යාග වෙනුවෙන් අඳදින මා ඔබට ස්තූති කරමි. කුඩා දරුවෙනි ඔබගේ පවුල්වලත් ලෝකයේත් මාගේ සාමයේ අපෝස්තුවරුන් වෙන ලෙස මා ඔබව කැඳවමි. ශුද්ධාත්මය ඔබව අලෝකමත් කර ශුද්ධකමේ මාවතේ ගෙන යන පිණිස යාච්ඤා කරන්න. මම ඔබ සමග සිටින අතර මාගේ මාතෘ ආශීර්වාදයෙන් ඔබට ආශීර්වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

--------------------

වර්ෂ 2005 ජූනි 25වන දින ඉවැන්කාට වාර්ෂික දර්ශනය

දර්ශනය ලැබූ ඉවැන්කාට වි දිමත් වාර්ෂික දර්ශනය

වර්ෂ 2005 ජූනි මස 25වන දින ඉවැන්කා ඉවැන්කෝවි ක් එල්එස් වි දිවත් වාර්ෂික දර්ශනය ලැබුවාය. දර්ශනයන් ලබන වි ක්කා මාරිජා හා ඉවැන්ට අනුව ඔවුන් දෛනික දර්ශන ලැබූ අතර මිර්ජානා ඉවැන්කා හා ජාවොක්ට වාර්ෂික දර්ශන ලැබුණි.

වර්ෂ 1985 මැයි 7වන දින ඇයගේ අන්තිම දර්ශනයේදී අපගේ මාතාව ඉවැන්කාට 10වන රහස පවසා ඇති අතර දර්ශනවල සංවත්සරයේ වසරකට වරක් ඇයට දර්ශනයක් ලැබෙන බව පවසා ඇත. මෙම වසරේ ත් එය එසේම
සිදු වි ය. දර්ශනය වි නාඩි
10ක් පැවතුණි. ඉවැන්කාට එම දර්ශනය ඇයගේ පවුලේ අය එනම් සැමියා හා දරුවන් තිදෙනා ඉදිරියේ නිවසේදී ලැබුණි. අපනගේ මාතාව පහත පණිවුඩය ඇයට
දු න්නාය:

"ප්‍රිය දරුවෙනි, මාගේ පුත්‍රයාගේ ප්‍රේමයෙන් එකිනෙකාට ප්‍රේම කරන්න. සාමය. සාමය. සාමය."

අපගේ මාතාව සතුටින් සිටි අතර ඉවැන්කාට 6වන රහස ගැන කථා කළාය.

----------------

වර්ෂ 2005 ජූලි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, ඔබගේ දවස කෙටි හා බලපෑමෙන් යුත් යාච්ඤාවෙන් පුරවා ගන්න. ඔබ යාච්ඤා කරන වි ට ඔබගේ හදවත දෙවි ට වි වෘත වී ඇති අතර දෙවි වි ශේෂිත ප්‍රේමයකින් ඔබට ප්‍රේම කර වි ශේෂ අනුග්‍රහයන් ඔබට ලබා දෙන්නේය. එබැවි න් කාලය හොඳින් පාවි ච්චි කර පෙර කවරදාකටත් වඩා අනුග්‍රහයේ කාලය දෙවි ට කැප කරන්න. සාතන් ඔබෙන් ඈත් වන්නටත් අනුග්‍රහය ඔබ වටා පවතින්නටත් නිරාහාරව යාච්ඤා කරමින් සිටින්න. මම ඔබ සමග සිටින අතර ඔබ වෙනුවෙන් දෙවි ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

## වර් ෂ 2005 අගෝස්තු 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැඳවන්නේ මාගේ පණිවුඩ අනුව ජීවත් වෙන්නටයි. දෙවි මෙම කාලය ඔබට අනුග්‍රහයේ කාලයක් ලෙස තිළිණ කර ඇත. එබැවි න් කුඩා දරුවෙනි මෙම කාලය හොඳින් පාවි ච්චි කර යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. මම ඔබට ආශීර් වාද කරන අතර ඔබ වෙනුවෙන් දෙවි  ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

## වර් ෂ 2005 සැප්තැම්බර් 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, ප්‍රේමයෙන් මා ඔබට කියන්නේ ඔබ මාගේ හදවතින් දු රස්ව සිටියත් හැරෙන්න. මා ඔබගේ මව බවත් මාගේ හදවතින් දු රස්ව සිටින සෑම කෙනෙක් වෙනුවෙන්ම මට දු කක් දැනෙන බවත් අමතක නොකරන්න. එහෙත් මම ඔබව තනි කරන්නේ නැහැ. ඔබට පාපයේ මාර් ගය අත්හැර ශුද්ධකම වෙනුවෙන් තීරණයක් ගත හැකි බව මම වි ශ්වාස කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

## වර් ෂ 2005 ඔක්තෝබර් 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, වි ශ්වාස කරන්න. යාච්ඤා කරන්න. ප්‍රේම කරන්න. එවි ට දෙවි  ඔබ අසල සිටිනවා ඇත. ඔහු ඔබ ඔහුගෙන් සොයන අනුග්‍රහයේ සියලු දීමනා ඔබට ලබා දෙනවා ඇත. මම ඔබට තෑග්ගක් වෙමි. දිනෙන් දින ඔබ සමග සිටින්නට දෙවි  මට අවසර දෙන්නේය. අසීමිත ප්‍රේමයකින් ඔබට ප්‍රේම කරන්නට ඉඩ දෙන්නේය. එබැවි න් කුඩා දරුවෙනි යාච්ඤාවෙන් හා යටහත් භාවයෙන් ඔබගේ හදවත් වි වෘත කර මගේ පැමිණීමේ සාක්ෂිකරුවන් වෙන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

## වර් ෂ 2005 නොවැම්බර් 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබට කියන්නේ යාච්ඤාව ඔබගේ ජීවි තය වෙනතෙක් යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. යාච්ඤා කරන්න. කුඩා දරුවෙනි මෙම අවස්ථාවේ මා දෙවි  ඉදිරියේ වි ශේෂිත ආකාරයකට යාච්ඤා කරන්නේ ඇදහිල්ලේ දීමනාව ඔබට දෙන හැටියටයි. දෙවි  ඔබට ලබා දී ඇති ජීවන තෑග්ගේ ප්‍රීතිය ඔබ සොයා ගන්නේ ඇදහිල්ලෙන් පමණකි. සදාකාලය ගැන කල්පනා කරමින් ඔබගේ හදවත් ප්‍රීතිමත් වනවා ඇත. මම ඔබ සමග සිටින අතර මෘදු ප්‍රේමයෙන් ඔබට ප්‍රේම කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

## වර් ෂ 2005 දෙසැම්බර් 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අද දිනත් ඔහුගේ සමාදානයෙන් ඔබට ආශීර් වාද කරන්නට මා සමාදානයේ රජාණන් වන කුඩා යේසුස්ව මාගේ අතේ ගෙනාවෙමි. කුඩා දරුවෙනි අද දින වි ශේෂ ආකාරයකට මෙම සාමයෙන් තොර ලෝකයේ ඔබ මගේ සාමයේ වාහකයන් වෙන්නට මා ඔබව කැඳවමි. දෙවි  ඔබට ආශීර් වාද කරනවා ඇත. කුඩා දරුවෙනි මම ඔබගේ මව බව අමතක නොකරන්න. කුඩා යේසුස්ව මගේ අතේ ඇතිව මම ඔබට වි ශේෂ ආශීර් වාදයකින් ආශීර් වාද කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

## වර් ෂ 2005 දෙසැම්බර් 25 වන දින ජෙවොක්ට වාර් ෂික දර් ශනය

වර්ෂ 1998 සැප්තැම්බර් 12වන දින ජේකොව් කොට කළ අන්තිම දෛනික දර්ශනයේදී අපගේ මාතාව සෑම දෙසැම්බර් 25වන දිනකම නත්තලේදී ඔහුට වසරකට වරක් වාර්ෂික දර්ශනයක් ලැබෙන බව පැවසුවාය. මෙම වසරේ දීත් එය එසේම සිදු වි ය. එම දර්ශනය ප.ව. 2.45ට පටන්ගෙන වි නාඩි7ක් පැවතුණි. අපගේ මාතාව පහත පණිවුඩය දු න්නාය:

"ප්‍රිය දරුවෙනි, අදදින කුඩා යේසුස්ව මගේ අත් ඇතිව මම වි ශේෂ ආකාරයකට ඔබව කැඳවන්නේ හැරෙන්නටයි. දරුවෙනි මෙතෙක් ඔබ සමග සිටින්නට දෙවි මට අවසර දී ඇති අතර මම ඔබව නොකඩවා කැඳවන්නේ හැරෙන්නටයි. බොහෝ හදවත් වැසී ඇත. කුඩා දරුවෙනි යේසුස් සාමය ප්‍රේමය හා සතුට වන්නේය. එබැවි න් දැන් යේසුස් වෙනුවෙන් තීරණයක් ගන්න. යාච්ඤා කරන්නට පටන්ගන්න. හැරීමේ දීමනාව සඳහා ඔහුට යාච්ඤා කරන්න. කුඩා දරුවෙනි ඔබට සාමය ප්‍රීතිය හා ප්‍රේමයෙන් පිරි හදවතක් ලබා ගත හැක්කේ යේසුස්ගෙන් පමණකි. කුඩා දරුවෙනි මම ඔබට ප්‍රේම කරමි. මම ඔබගේ මව වන අතර මගේ මාතෘ ආශීර්වාදය ඔබට දෙමි."

2006

වර්ෂ 2006 ජනවාරි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අද මා ඔබට කියන්නේ ශුභාරංචිය ඔබගේ පවුල්වලට ගෙන යන ලෙසයි. කුඩා දරුවෙනි ශුද්ධ වචනය කියවන්නට අමතක නොකරන්න. එය පෙනෙන තැනක තබා ඔබ දේව වචනය වි ශ්වාස කරන හා ඒ අනුව ජීවත් වන බව ඔබගේ ජීවි තයෙන් සාක්ෂි දරන්න. මගේ ප්‍රේමය සමගින් මම ඔබට ළං ව සිටින අතර ඔබ සෑම කෙනෙක් වෙනුවෙන්ම මගේ පුත් ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2006 පෙබරවාරි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, දෙවි ඔබට දෙන්නට කැමැත්තෙන් සිටින දීමනා සඳහා ඔබගේ හදවත් වි වෘත කරන ලෙස ඉල්ලමි. වැසී නොසිට යාච්ඤාවෙන් දෙවි ට එසේය කීයන්නේ නම් ඔහු වැඹිනත්ව ඔබට ලබා දෙනවා ඇත. වසන්ත කාලයේ භූමිය බීජවලට වි වෘත වන්නාක්මෙන් සිය ගුණයක් එල දරන්න. එසේ ඔබගේ ස්වර්ගීය පියාණන් ඔබට වැඹිනත්ව ලබා දෙනවා ඇත. කුඩා දරුවෙනි මම ඔබ සමග සිටින අතර ඔබට මෘදු ප්‍රේමයකින් ප්‍රේම කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2006 අප්‍රේල් 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබට කැඳවන්නේ මා හා මගේ පුත් කෙරෙහි වැඩිවි ශ්වාසක් තබන්නටයි. ඔහු තමාගේ මරණයෙන් හා නැවත නැගිටීමෙන් ජයගෙන ඇති අතර මා තුළින් ඔහු කියන්නේ ඔහුගේ ප්‍රීතියේ කොටස් කරුවෙක් වන ලෙසයි. කුඩා දරුවෙනි ඔබ දෙවි ව නොදකින්නෙහිය. එහෙත් ඔබ යාච්ඤා කරන්නේ නම් ඔහුගේ සමීපකම දැනගන්නවා ඇත. මම ඔබට ළං ව සිටින අතර ඔබ සෑම කෙනෙක් වෙනුවෙන්ම මගේ පුත් ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2006 මැයි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, මම අද ඔබගෙන් ඉල්ලන්නේ මම ඔබට දෙන පණිවුඩ ක්‍රියාවට නගා ඒ අනුව ජීවත් වෙන්නටයි. ශුද්ධකමට තීරණයක් ගෙන කුඩා දරුවෙනි ස්වර්ගය වෙනුවෙන් තීරණයක් ගන්න. කිසිවෙකුට වි නාශ කළ නොහැකි සාමයක් ඔබගේ හෘදයේ ඔබට තබා ගත හැක්කේ මෙයාකාරයෙන් පමණකි සාමය වනාහි දෙවි යාච්ඤාවෙන් ලබා දෙන්නාවූ දීමනාවකි. ඔබගේ

හදවතේත් ලෝකයේත් සාමය ජය ගන්නා පිණිස එය සොයා ඔබේ මුළු ශක්තියෙන් ඒ වෙනුවෙන් වැඩ කරන්න. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2006 ජූනි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, මෙම දිනවල ඔබ මාගේ අභිමතයන් සඳහා පුදන්නාවූ සියලුම යාච්ඤා වෙනුවෙන් මගේ හදවතේ මහත් ප්‍රීතියෙන් මම ඔබට ස්තූති කරමි. ඔබ හෝ ඔබගේ දරුවන් කවදාකවත් එය ගැන පසුතැවි ලි නොවන බව කුඩා දරුවෙනි දැනගන්න. දෙවි මහත් අනුග්‍රහයන් සමගින් ඔබට තෑගි කරනු ඇති අතර ඔබ සදාජීවි තය උරුම කර ගන්නවා ඇත. මම ඔබ සමග සිටින අතර මෙම වසර ගණනාව පුරා මගේ පණිවුඩ පිළිගෙන ඒවා තමන්ගේ ජීවි තවලට අදාල කරගෙන ශුද්ධකම හා සාමය වෙනුවෙන් තීරණයක් ගත් සියල්ලන්ට මම ස්තූති කරමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2006 ජූනි මස 25වන දින ඉවැන්කා ඉවැන්කෝවි ක් එල්එස් වි දිවත් වාර්ෂික දර්ශනය ලැබුවාය. දර්ශනයන් ලබන වි ක්කා මාරිජා හා ඉවැන්ට අනුව ඔවුන් දෛනික දර්ශන ලැබූ අතර මිර්ජානා ඉවැන්කා හා ජාවොක්ට වාර්ෂික දර්ශන ලැබුණි.

වර්ෂ 1985 මැයි 7වන දින ඇයගේ අන්තිම දර්ශනයේදී අපගේ මාතාව ඉවැන්කාට 10වන රහස පවසා ඇති අතර දර්ශනවල සංවත්සරයේ වසරකට වරක් ඇයට දර්ශනයක් ලැබෙන බව පවසා ඇත. මෙම වසරේ ත් එය එසේම සිදු වි ය. දර්ශනය වි නාඩි7ක් පැවතුණි. ඉවැන්කාට එම දර්ශනය ඇයගේ පවුලේ අය එනම් සැමියා හා දරුවන් තිදෙනා ඉදිරියේ නිවසේදී ලැබුණි. අපනගේ මාතාව පහත පණිවුඩය ඇයට දු න්නායඃ

"ප්‍රිය දරුවෙනි, මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි. සාමය. සාමය. සාමය."

අපගේ මාතාව සතුටින් සිටි අතර ඉවැන්කාට 6වන රහස ගැන කථා කළාය.

වර්ෂ 2006 ජූලි 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, මෙම අවස්ථාවෙහි ඔබගේ ශරීරයේ ඉතිරි කොටස ගැන කරදර නොවන්න. ඔබගේ ආත්මය ගැනත් කල්පනා කරන්න. නිහඬව ශුද්ධාත්මය ඔබට කථා කළාවේ. ඔබව වෙනස් කරන්නට ඉඩ දෙන්න. මම ඔබට ළං ව සිටින අතර ඔබ සෑම කෙනෙක් වෙනුවෙන්ම මගේ පුත් ඉදිරියේ අතරමැදිකම් කරන්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2006 අගෝස්තු 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අදත් මම ඔබව කැඳවන්නේ යාච්ඤාවට යාච්ඤාවට යාච්ඤාවටයි. ඔබ මටත් මගේ පුතාටත් ළංව සිටින්නේ යාච්ඤාවෙන් පමණකි. තවද ජීවි තය කොතරම් කෙටිද යන්නත් ඔබ තේරුම් ගන්නවා ඇත. ඔබගේ හදවතේ ස්වර්ගය සඳහා ආශාවක් ජනිත වෙනවා ඇත. ෂතුට ඔබගේ හදවතේ රජ කරන්නට පටන් ගන්නා අතර යාච්ඤාව ගංගාවක් මෙන් ගලා යන්නට පටන් ගන්නවා ඇත. ඔබව මැවී ම වෙනුවෙන් ඔබගේ වචනවල දෙවි ට ස්තූති දීම පමණක් තිබෙනවා ඇත. ශුද්ධකම වෙනුවෙන් ආශාවක් ඔබගේ ජීවි තයේ තිබෙනවා ඇත. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වී ම ගැන ස්තූතියි."

වර්ෂ 2006 සැප්තැම්බර් 25වන දින පණිවුඩය

"ප්‍රිය දරුවෙනි, අද දිනත් මම ඔබ සමග සිටින අතර හැරීම සම්පූර්ණ කරන්නට මම ඔබව කැඳවමි. කුඩා දරුවෙනි දෙවි  වෙනුවෙන් තීරණයක් ගන්න. තවද ඔබ සොයන සාමය ඔබ දෙවි  තුළින් සොයා ගන්නවා ඇත. සාන්තවරුන්ගේ ජීවිත අනුකරණය කරන්න. ඔවුන් ඔබට ආදර්ශයක් වේවා. තවද සර්වබලධාරී තැනැත්තා මට අවසර දෙනතෙක් මම ඔබව පෙළඹවමින් සිටින්නෙමි. මගේ ඉල්ලීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

ලිපිගොනුවේ අවසානය.

**වර්ෂ 2006 දෙසැම්බර් 25 වන දින පණිවුඩය**

"ප්‍රිය දරුවෙනි, අද මා අලුත උපන් යේසුස්ව මගේ අතේ දරාගෙන ඔබ වෙත එන්නෙමි. ඔහු ස්වර්ගයේ හා පොළොවේ රජ වන්නේය. ඔහු ඔබගේ සමාදානය වන්නේය. කුඩා දරුවෙනි, ඔහු සමාදානයේ රජ වන බැවින් කිසිවෙකුට ඔබට සාමය ලබා දිය නොහැකිය. එබැවින් ඔහුට ඔබගේ හෘදයෙන් ගෞරවය කරන්න. ඔහුව තොරා ගන්න එවිට ඔහු තුළ ඔබ ප්‍රීතිය අද්දකිනවා ඇත. ඔහු තමාගේ සමාදානයේ ආශීර්වාදයන්ගෙන් ඔබට ආශීර්වාද කරනවා ඇත. මගේ කැඳවීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

**වර්ෂ 2006 නොවැම්බර් 25 වන දින පණිවුඩය**

"ප්‍රිය දරුවෙනි, අදත් මා ඔබව කැඳවන්නේ යාච්ඤා කරන්නට, යාච්ඤා කරන්නට, යාච්ඤා කරන්නට. කුඩා දරුවෙනි ඔබ යාච්ඤා කරන විට ඔබ දෙවිට කිට්ටුවෙන් සිටින අතර ඔහු ඔබට සදාකාලයට ආශාවක් ලබා දෙනවා ඇත. ඔබට දෙවි  ගැන වැඩියෙන් කථා කරන්නටත් ක්‍රියා කරන්නටත් කාලය මෙයයි. එබැවින් දරුවෙනි බාධා නොකරන ඔහුට මගපෙන්වන්නට, ඔබව වෙනස් කරන්නට හා ඔබගේ ජීවිතයට ඇතුල් වෙන්නට ඉඩ හරින්න. ඔබ සදාකාලය කරා වූ ගමනේ යෙදෙන්නන් බව අමතක නොකරන්න. එබැවින් එඩෙරෙක් රැලට මග පෙන්වන්නා සේ ඔබට මගපෙන්නන්නට ඔහුට ඉඩ දෙන්න. මගේ කැඳවීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

**වර්ෂ 2006 ඔක්තෝබර් 25 වන දින පණිවුඩය**

"ප්‍රිය දරුවෙනි අද දින ඔබ අනුග්‍රහයේ කාලයක ජීවත් වෙන බව පවසන්නට දෙවි  මට අවසර ලබා දී ඇත. කුඩා දරුවෙනි ඔබට හැරී සාමයෙන් හා ප්‍රේමයෙන් ජීවත් වෙන්නට දෙවි අවස්ථාවක් දෙවි ලබා දී ඇති බව ඔබ ඥලකන්නේ නැත. ඔබ ඒ තරමටම අන්ධව ලෝකයේ දේවලට ඇලී ලෝකාකාර ජීවිතයක් ගැන සිතමින් සිටින්නහුය. දෙවි  සදාකාල ජීවිතයක් වෙතට ඔබට මගපෙන්වන්නට මාව එවා ඇත. ඔබගේ හෘදය තෑග්ගක්ව ලබා ඇති දේවලට මහත්සේ බැඳී වෙහෙසට පත්ව සිටියත් කුඩා දරුවෙනි මම නම් වෙහෙසට පත්ව නැත. මගේ කැඳවීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."

**වර්ෂ 2007 ජනවාරි 25 වන දින පණිවුඩය**

"ප්‍රිය දරුවෙනි, ඔබගේ පවුලේ පෙනෙන තැනක ශුද්ධ ලියවිලි තබා එය කියවන්න. මෙයාකාරයෙන් ඔබට යාච්ඤාව හෘදයෙන්ම දැන ගැනීමට හැකිවන අතර ඔබගේ කල්පනාවන් දෙවි  කෙරෙහි වන්නේය. ඔබ කෙතේ මලක් මෙන් පර වෙන බව අමතක නොකරන්න. එය දු රස්තරයේ සිට දැකීමට හැකි වුනත් මොහොතකින් නොපෙනී යනවා ඇත. කුඩා දරුවෙනි ඔබ යන සෑම තැනකම යහපත්කමේ ඥලකුණක් තබා යන්න. එවිට දෙවි  මහත්සේ ඔබට ආශීර්වාද කරනවා ඇත. මගේ කැඳවීමට ප්‍රතිචාරය දැක්වීම ගැන ස්තූතියි."